

# පෙරළියක අස්වැන්න

සාධාරණය, ස්වෛරීත්වය හා සෞභාග්‍ය උදෙසා වූ
ක්‍රම වෙනසකට ආහාර නිෂ්පාදකයින්ගේ අත්දැකීම්



# පෙරළියක අස්වැන්නඃ සාධාරණය, ස්වෛරීත්වය හා සෞභාග්‍ය උදෙසා වූ ක්‍රම වෙනසකට ආහාර නිෂ්පාදකයින්ගේ අත්දැකීම්

මැයි 2026

**පෙරළියක අස්වැන්නඃ සාධාරණය, ස්වෛරීත්වය හා සෞභාග්‍ය උදෙසා වූ ක්‍රම වෙනසකට ආහාර නිෂ්පාදකයින්ගේ අත්දැකීම්**

මැයි 2026


**කවර නිර්මාණය** - ටශ්යානා හැන්ඩි
**සිතියම් නිදර්ශනය** - සැම් වීරවර්ධන

**වාර්තාව සකස් කළේ**

අමලිනී ද සේරා
නටාෂා වැන් හොෆ්
සඳුන් තුඩුගල

**ප්‍රකාශනය**

නීතිය හා සමාජ භාරය
102/3, බාන්ස් පෙදෙස, කොළඹ 07

ඉඩම් හා කෘෂිකර්ම ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය (මොන්ලාර්)
අංක 57, 1 වන පටුමග, මැදවැලිකඩ පාර, රාජගිරිය

ජාතික ධීවර සහයෝගීතා ව්‍යාපාරය
අංක 10, මල්වත්ත පාර, මීගමුව

**<u>පිදුම</u>**

**නිමල් ද සිල්වා**

ගොවි මහතා, ප්‍රජා නායක, සාම්ප්‍රදායික බීජ ආරක්ෂක, කෘෂි වන වගාව පිළිබඳ අධ්‍යාපනඥ,

මියගිය දිනය: 2025 නොවැම්බර් 21

**දානිගල මහ බණ්ඩලාගේ සුදා වන්නිල ඇත්තෝ**

රතුගල ආදිවාසී නායක

මියගිය දිනය: 2026 මැයි 6

ඉහත නම් සඳහන් දෙදෙනා මෙම ව්‍යාපෘතිය සහ වාර්තාව සකස් කිරීම සඳහා පවත්වන ලද රැස්වීම්-වලට සහභාගී වීමත්, ඔවුන් සහ ඔවුන්ගේ ප්‍රජාවන් සමග දිගුකාලීන සම්බන්ධතා ඇති කර ගැනීමට අපට අවස්ථාව ලැබීමත් අප ලැබූ භාග්‍යයක් විය. ඔවුන් දෙදෙනා ම තමන්ගේ ප්‍රජාවගේ අභිවෘද්ධිය සඳහා සහ ස්වභාවික පරිසරයේ ආරක්ෂාව සඳහා කැප වී සිටි නායකයින් වූහ. ඔවුන් තුළ තිබූ ප්‍රඥාව ඔවුන් විසින් ගොඩනගන ලද සාමූහිකයන් තුළ සහ ඔවුන් දැනුම ලබා දුන් තරුණයින් තුළ ජීවමානව පවතී.

# ස්තූතිය

මෙම ගවේෂණය සහ මෙම වාර්තාව සකස් කිරීම සඳහා දායකත්වය ලබා දුන් මතු සඳහන් සියලු දෙනාට ම ව්‍යාපෘති කණ්ඩායම ස්වකීය ස්තූතිය පුද කරන සිටින අතර, එම සියලු දෙනාගේ දායකත්වය නොතිබෙන්නට මෙම කාර්යය සාර්ථකව නිම කර ගැනීමට නොහැකි වන්නට අවකාශ තිබූ බව ද සඳහන් කිරීමට කැමැත්තෙමු:

- මහනුවර, හැටන්, දඹුල්ල, මන්නාරම, යාපනය, තංගල්ල, දෙනියාය, මඩකලපුව, අම්පාර සහ මොනරාගල යන ප්‍රදේශවල පැවති රැස්වීම්වලට සහභාගී වූ ගොවීන්, ධීවරයින්, වගාකරුවන්, නිෂ්පාදකයින්, සංවිධායකයින් සහ ප්‍රජා නායකයින් වෙත අපගේ ස්තූතිය පුද කරන්නෙමු.

  විවිධ සමාජ, සංගම්, ගම්මාන සහ අනෙකුත් ප්‍රාදේශීය මට්ටමේ කණ්ඩායම්වල නියෝජිතයන් ලෙස ක්‍රියා කරන ඔවුන් සතුව ඔවුන්ගේ පුළුල් ප්‍රජාවන්ගේ දැනුම සහ අත්දැකීම් තිබේ. පරිවර්තනයක් ඇතිකිරීම උදෙසා එම සාමූහික විසින් ඉටුකරන ලද කාර්ය භාරය සහ ඔවුන් සතු විශේෂඥතාවය නොමසුරුව අප සමග බෙදා ගැනීම වෙනුවෙන් එම සාමූහිකවලට ද අපගේ ස්තූතිය පුද කරන්නෙමු.

- මෙම සැසිවාර සඳහා පහසුකම් සලසා දුන් සහ මෙම අදහස් අනාගතයට ගෙන යා හැකි ආකාරය සකස් කිරීම සඳහා ස්වකීය කාලය කැප කළ සහ විශේෂඥ දැනුම සපයා දුන් මතු නම් සඳහන් පහසුකම් සපයන්නන්ට ද අපගේ ස්තූතිය හිමි වේ:

  ඒ.සී.ආර්. ජෝන්
  චතුරිකා සෙව්වන්දි
  චින්තක රාජපක්ෂ
  මහේෂි ප්‍රේමචන්ද්‍ර
  මහින්ද ගුණරත්න
  ප්‍රියංකර කොස්තා
  සඳුන් තුඩුගල
  සරලා එමානුවෙල්
  සුගන්‍යා කන්දීපන්
  විදුර මුණසිංහ
  විමුක්ති ද සිල්වා

- සහභාගීවන්නන් අප සමග බෙදාගත් තොරතුරු සමුදාය ලේඛනගත කිරීම සහ සැකසුම් කිරීම වෙනුවෙන් මතු නම් සඳහන් පර්යේෂකයන් සහ සටහන්කරුවන්ට ද ස්තූතිය පුද කරමු:

  අමලිනී ද සේරා
  අංජන ආරියරත්න
  නිශාන්තනී සෙල්වරත්නම්
  සුහයිනා රසාක්

- ප්‍රාදේශීය සැසිවාර වලදී විශිෂ්ට ලෙස කථා පරිවර්තන සේවාව සපයා දුන් ජිනන්දනී පරමේශ්වරම් (ජෙනි) වෙත ද අපගේ ස්තූතිය හිමි වේ.

- ශ්‍රී ලංකාවේ පළාත් හතක් පුරා පැතිරී තිබූ සියලු ම ක්ෂේත්‍ර සැසි සඳහා ව්‍යාපෘති කණ්ඩායම් වලට ප්‍රවාහන සේවා සපයා දුන් ග්ලෝබල් ට්‍රැවල්ස් පුද්ගලික සමාගමට ද අපගේ ස්තූතිය පුද කරන්නෙමු.

## පටුන


| | |
|---|---|
| නිර්වචන | 11 |
| හැඳින්වීම | 13 |
| ක්‍රමවේදය | 20 |
| පර්යේෂණ සොයාගැනීම් | 24 |
| 1. වී | 24 |
| 2. ධීවර කර්මාන්තය | 29 |
| 3. අනෙකුත් ක්ෂේත්‍ර භෝග | 32 |
| 4. ආහාර නිෂ්පාදනය හා සම්බන්ධ අනෙකුත් ගෘහස්ත ජීවනෝපායන් | 38 |
| සාධාරණ ආහාර පද්ධතියත් වෙත පරිවර්තනය වීම සඳහා ඇති ව්‍යුහාත්මක බාධාවන් | 41 |
| නිර්දේශ | 45 |
| උපලේඛන | 48 |
| 1. පහසුකම් සපයන්නන් සඳහා සාකච්ඡා මාර්ගෝපදේශ | 48 |
| 2. පරීක්ෂණ පත්‍රය - සහභාගිවන්නන් සඳහා | 49 |
| 3. කෘෂි පරිසර විද්‍යාවේ මූලධර්ම | 50 |

## නිර්වචන

කෘෂිපාරිසරික විද්‍යාව  යනු ජනගහනයේ යහපැවැත්ම සහ ජෛව විවිධත්වය සංරක්ෂණය කේන්ද්‍ර කරගත් ආහාර නිෂ්පාදනයට ප්‍රවේශයකි. කෘෂි පාරිසරික විද්‍යාව විවිධ ආකාරවලින් නිර්වචනය කළ හැකි ය. ස්වාභාවික ක්‍රියාවලීන් අනුකරණය කිරීමට අරමුණු කරගත් කෘෂිකාර්මික ක්‍රියාකාරකම් සමූහයක් ලෙස ලාභය ඉක්මවා ජනතාව සහ පෘථිවිය ඉදිරියට තබන ආහාර නිෂ්පාදනය හා ආර්ථික විද්‍යාවට ප්‍රවේශයක් ලෙස සහ ආහාර පද්ධති පරිවර්තනය කිරීමේ මාර්ගයක් ලෙස ආහාර ස්වෛරීත්වය වෙනුවෙන් අරගල කරන දේශපාලන ව්‍යාපාරයක් ලෙස (War on Want, n.d.).

ආහාර ස්වෛරීත්වය යනු පාරිසරික ව නිවැරදි හා තිරසර ක්‍රම මගින් නිෂ්පාදිත සෞඛ්‍ය සම්පන්න හා සංස්කෘතික ව සුදුසු ආහාරයට ජනතාවගේ අයිතිය, සහ තමන්ගේම ආහාර හා කෘෂිකාර්මික පද්ධති නිර්වචනය කිරීමට ඔවුන්ගේ අයිතිය යි. එය වෙළෙඳපොළ හා සංස්ථාවල ඉල්ලීම් වෙනුවට, ආහාර නිෂ්පාදනය කරන, බෙදා හරින සහ පරිභෝජනය කරන අය ආහාර පද්ධති හා ප්‍රතිපත්තිවල මූලිකව තබයි. එය ඊළඟ පරම්පරාවේ අවශ්‍යතා හා ඇතුළත් කිරීම ආරක්ෂා කරයි. එය වර්තමාන සංස්ථා වෙළෙඳ හා ආහාර තන්ත්‍රයට ප්‍රතිරෝධය දක්වීමට හා ඉවත් කිරීමට උපාය මාර්ගයක් සහ දේශීය නිෂ්පාදකයින් හා භාවිත කරන්නන් විසින් තීරණය කරනු ලබන ආහාර, ගොවිතැන්, පශු පාලන හා ධීවර පද්ධති සඳහා දිශාවන් ලබා දෙයි (Nyéléni, 2007).

UNDROP: ගොවීන් සහ ග්‍රාමීය ප්‍රදේශවල වැඩකරන අනෙකුත් පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රකාශනය.

ගොවීන් සහ සුළු පරිමාණ ආහාර නිෂ්පාදකයින් - සාම්ප්‍රදායික, කෘෂිපාරිසරික, සහ ප්‍රජා පදනම් ක්‍රම භාවිත කරමින් ආහාර නිෂ්පාදනය කරන, සහ ඉඩම්, ජලය, බීජ සහ ස්වාභාවික සම්පත් වෙත ප්‍රවේශය මත ජීවනෝපාය රඳා පවතින ගොවීන්, ධීවරයින්, ඉඩම් රහිත කම්කරුවන්, ආදිවාසී ජනතාව, වතු කම්කරුවන්, ග්‍රාමීය කාන්තාවන් සහ තරුණයින් (La Via Campesina, 2018; UN General Assembly, 2018).

## හැඳින්වීම

ආහාර මූලික මානව අයිතියකි.

පූර්ණ ගරුත්වයෙන් යුතු, සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කිරීම සඳහා සියලු මිනිසුන්ට ප්‍රමාණවත් තරමින්, ගුණාත්මක භාවයෙන් යුතු, ආරක්ෂිත, පෝෂ්‍යදායී සහ සංස්කෘතිකමය වශයෙන් ගැළපෙන ආහාර වෙත ප්‍රවේශය තිබිය යුතු ය. ආහාර යනු සංස්කෘතිය, මතකය, චාරිත්‍ර සහ සම්බන්ධතා වේ. වඩාත්ම වැදගත් කරුණ නම්, ආහාර අනෙක් සියලු දෙයින් වෙන්වී තිබෙන්නක් නොවේ; ආහාර යනු පද්ධතියකි: එනම්, එය වගා කරන පුද්ගලයන්, එහි වර්ධනයට රුකුල් දෙන භූමිය සහ ජලය, එය රැගෙන යන වෙළෙඳපොළ සහ ආයතන, සහ එය පරිභෝජනය කරන ප්‍රජාවන් අතර සම්බන්ධතා වලින් සැදි ඝන ජාලයකි.

ආහාර හුදෙක් වෙළෙඳ භාණ්ඩයකට ලඝු කිරීම කෘත්‍රිම ලෙස මෙම සම්බන්ධතා කපා වෙන්කිරීමක් වේ. එය එළවළුවක් යන්න මිලක් පමණක් බවත්, බීජයක් යන්න පේටන්ට් බලපත්‍රයක් පමණක් බවත්, ගොවියෙකු යනු ශ්‍රම ඒකකයක් පමණක් බවත් මවාපෑමක් වේ. එය ආහාර පද්ධතිය හැඩගස්වන සහ එයට අනුබලය දෙන පුළුල් ආර්ථික, සමාජ සහ දේශපාලන පද්ධති අමතක කර, නොසලකා හැරීමකි. නමුත් අවාසනාවට, වර්තමාන වෙළෙඳපොළ පදනම් කරගත් ධනේශ්වර ආහාර ක්‍රමය සැබවින් ම පත්ව ඇත්තේ එම තත්ත්වයට වන අතර, එකී මවාපෑමෙහි ප්‍රතිවිපාක දැන් අප වටා දක්නට ඇත. ගෝලීය වශයෙන්, පුද්ගලයන් මිලියන 783 ක් කුසගින්නේ සිටින අතර, අපතේ යන ආහාර ටොන් බිලියන 1.05 ක් ජනනය වේ. මෙම ප්‍රමාණයේ ඒක පුද්ගල අපතේ යෑම කිලෝග්‍රෑම් 132 ක් වන අතර, එය පාරිභෝගිකයන්ට ලබා ගත හැකි සමස්ත ආහාර ප්‍රමාණයෙන් පහෙන් එකක් පමණ වේ (එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන, 2024). මේ වන විට, පස ක්ෂය වී ගොස් ඇත, ජලධර සිඳී ගොස් ඇත, පරිසර පද්ධති කැඩී වෙන් වී ඇත.

### ආහාර යන්න පද්ධතියක් ලෙස

සෑම ආහාර වේලක්ම කාලය ඔස්සේ අතීතයට විහිදී යන සම්බන්ධතා දාමයක අවසාන ලක්ෂ්‍යය වේ. මෙම දාමය වගා කරන සහ අස්වැන්න නෙළන ගොවීන්, දැල් සහ බිලීපිති යොදන ධීවරයන් සහ තම සතුන් රැකබලා ගන්නා ගොපල්ලන් ගේ සිට, වගාකරන භූමිය, ගලා යන ජලය, පරාගනය කරන කෘමීන්, පසෙහි ජීවත්වෙමින් කාබනික ද්‍රව්‍ය පෝෂ්‍ය පදාර්ථ බවට පරිවර්තනය කරන ක්ෂුද්‍ර ජීවීන්, අස්වැන්න ගෙන යන වෙළෙඳුන් සහ ප්‍රවාහනය කරන්නන්, එහි මිල නියම කරන වෙළෙඳපොළ ව්‍යුහයන් සහ එම ව්‍යුහයන් හැඩගස්වන දේශපාලන තීරණ දක්වා වූ සියල්ල එකට සම්බන්ධ කරයි.

මෙම දාමය සංකල්පයක් ලෙස නොව, ප්‍රායෝගික දේශපාලන යථාර්ථයක් ලෙස දකින මෙන් Stuffed and Starved (පිරී ඉතිරී යන, එහෙත් කුසගින්නේ සිටින) නැමති කෘතියේ කතුවරයා සහ ආහාර ප්‍රතිපත්ති විශේෂඥයෙක් වන රාජ් පටෙල් අපෙන් ඉල්ලා සිටියි. ඔහු පෙන්වා දෙන පරිදි, ගෝලීය ආහාර පද්ධතිය හෝරා වීදුරුවක හැඩයට සමාන හැඩයකින් යුක්ත වේ. එහි ඉහළම කොටසේ, මිලියන සිය ගණනක් වූ, සෑම වර්ගයකම ගොවීන්, ධීවරයන් සහ ආහාර නිෂ්පාදකයන් සිටිති; පතුලේ, ඔවුන් නිෂ්පාදනය කරන ආහාර පරිභෝජනය කරන බිලියන ගණනක් වූ පාරිභෝගිකයන් සිටිති. හෝරා වීදුරුවේ ඉතා පටු විවරය යනු කාගිල්ස්, මොන්සැන්ටෝ (වර්තමානයේ බේයර්), ඒ.ඩී.එම්., නෙස්ලේ, වොල්මාර්ට් වැනි බහුජාතික සමාගම් අතලොස්ස වන අතර, සියල්ල ගමන් කළ යුත්තේ ඔවුන්ගේ දෑත් හරහා ය. මෙම හෝරා වීදුරුව යනු උදාසීන සැපයුම් වැඩපිළිවෙළක් නොවේ; එය බල ව්‍යුහයකි. ආහාර යන්න පද්ධතියක් ලෙස තේරුම් ගැනීම යනු, බලය යන්න එම පද්ධතිය සංවිධානය වී ඇති මූලධර්මය ලෙස තේරුම් ගැනීමයි.

නිෂ්පාදනය ආහාර පද්ධතියේ පදනම වේ. එය හුදෙක් ආර්ථික ක්‍රියාවක් පමණක් නොවේ, එය ගැඹුරු සමාජීය හා පාරිසරික ක්‍රියාවක් ද වේ. කුඹුරක සාම්ප්‍රදායික වී වගා කරන ගොවියෙක් සිදු කරන්නේ හුදෙක් බෝගයක් නිෂ්පාදනය කිරීම පමණක් නොවේ; ඔහු පසෙහි ස්වභාවය, වර්ෂාපතන රටා, බීජ වර්ග සහ පෝෂ්‍ය පදාර්ථ පිළිබඳ පරම්පරා ගණනාවක් තිස්සේ රැස් කරගෙන ඇති දැනුම ද ප්‍රතිනිෂ්පාදනය කරයි. කෘෂිපාරිසරික විද්‍යාවේ භාෂාවෙන් පවසතොත්, ඔහු හුදෙක් ස්වභාව ධර්මයෙන් උකහාගන්නවා

නොව, සොබාදහම සමග සම-නිෂ්පාදනය කරයි. දියවැල් රටා පිළිබඳ අවබෝධය ඇති, අභිජනන කාලයන් දන්නා, පරම්පරා ගණනාවකගේ භාවිතය මගින් හැඩගැන්වී ඇති වෙරළබඩ පරිසර පද්ධතිවල සැරිසරන ධීවරයා සිදුකරන්නේ ද එයමය. ගෙවතු වගා කරන්නා ද, කෘෂි-වනවගාව සිදුකරන ගොවියා ද, කුඩා සත්ව ගොවිපොළ හිමියා ද සිදුකරන්නේ එයමය. මෙම සෑම නිෂ්පාදකයෙක්ම ස්වභාවික ලෝකය සමග සම්බන්ධතාවයක් පෙන්නුම් කරන නමුත්, කාර්මික ආහාර පද්ධති එය අනුකරණය කරන්නේ හෝ අගය කරන්නේ නැත.

නිෂ්පාදනය සහ පරිභෝජනය අතර තිබෙන්නේ වෙළෙඳපොළ ය; ඉහත කී හෝරා වීදුරුව වඩාත් කුරිරු ලෙස එහි ග්‍රහනය දැඩි කරන්නේ මෙහිදී ය. නිෂ්පාදනය අවසානයේ දී, සුළු ගොවීන්ට සහ ධීවරයන්ට තම නිෂ්පාදනවල මිල තීරණය කිරීමේ බලය ලබා නොදී, වෙළෙඳපොළ මගින් මිලක් නියම කරනු ලැබේ. ඔවුන් නිෂ්පාදන පිරිවැය දරා ගනිති; තමන්ගේ සහ අනෙක් අයගේ ශ්‍රමය යොදති; අමුද්‍රව්‍ය යෙදවුම් යෙදීමේ බර සහ කාලගුණ වෙනස්වීම්වල අවදානම දරති; එහෙත් ඔවුන්ට ලැබෙන මිල ගණන් තීරණය කරනු ලබන්නේ ආයතන අතර සංකේන්ද්‍රණය වී ඇති මිල දී ගැනීමේ බලය විසිනි. බොහෝවිට, මෙම ආයතන නිෂ්පාදකයාට භූගෝලීය වශයෙන් දුරස්ව පිහිටා ඇත. පරිභෝජනය අන්තයෙන් සැලකීමේ දී, නාගරික දිළිඳු ජනයා තම ආදායමෙන් වැඩි කොටසක් ආහාර සඳහා වැය කරන අතර, මිල ඉහළ යන විට ඔවුන් දැඩි අවදානමකට මුහුණ දෙති. ගොවියා සහ කුසගින්නේ සිටින පාරිභෝගිකයා අතර සිටින, හෝරා වීදුරුවේ පටු විවරයේ සිටින ආයතන, සිල්ලර වෙළෙඳුන් සහ මූල්‍ය ආයෝජකයන් දැවැන්ත ලාභයක් ලබා ගනිති.

ආහාර නිෂ්පාදනය පාරිසරික ක්‍රියාවක් ද වේ. එය විවිධ ස්ථානවල පසෙහි, අහස යට, ගංගා අසල, විවිධ දේශගුණයන් තුළ සහ සාගර පුරා සිදු වේ. ආහාර පද්ධතිවල සෞඛ්‍යය සහ ජීවමාන පරිසර පද්ධතිවල සෞඛ්‍යය එකිනෙකින් වෙන් වූ ගැටලු නොවේ. ඒ එකක් අනෙකට බලපාන අතර, ඒවා දැඩි ලෙස එකිනෙකට බැඳී ඇත. එහෙත් වර්තමාන ආහාර පද්ධතිය විසින් පරිසරය සලකනු ලබන්නේ නොමිලයේ ලැබෙන යෙදවුමක් ලෙස සහ ඉවත දමන දේ සඳහා නොමිලයේ භාවිත කළ හැකි දෙයක් ලෙස ය. දේශගුණික විපර්යාස අපේ ලෝකයට බලපෑම් ඇතිකරන විට සහ එම බලපෑම් සෑම වසරකම වඩාත් පැහැදිලිව පෙනෙන්නට තිබෙන විට, නිෂ්පාදකයන් තම අස්වනු සහ මසුන් අල්ලා ගැනීම් සඳහා විශ්වාසය තබා සිටි රටා වෙනස් වෙමින් පවතියි. මෙම තත්ත්වය ඔවුන්ගේ ජීවනෝපායන් සහ අපගේ ආහාර අවදානමට ලක් කරයි.

**වර්තමාන ආහාර ක්‍රමය සහ එහි අසාර්ථකත්වයන්**

වර්තමාන ආහාර පද්ධතිය දශක ගණනාවක ප්‍රචණ්ඩත්වය තුළින් ගොඩනගා ඇත. ඉඩම් අහිමි කිරීම, යටත් විජිතවල සාරය උරාගැනීම, පොදු ඉඩම් ඇදාගැනීම සහ යැපුම් කෘෂිකර්මාන්තයේ නියුතු ගොවීන් බලහත්කාරයෙන් ඉඩම් නොමැති කුලී කම්කරුවන් බවට හෝ අපනයන බෝග නිෂ්පාදකයන් බවට පරිවර්තනය කිරීම මගින් ආහාර නිෂ්පාදනය මිනිසාගේ පෝෂණය පිණිස නොව ප්‍රාග්ධනය රැස්කිරීමේ අවශ්‍යතා අරමුණු කරගත් දෙයක් බවට පත් කළේ ය. අවසානයේ දී, ගෝලීය බීජ අලෙවිය, කෘෂි රසායනික වෙළෙඳපොළ, ධාන්‍ය වෙළෙඳාම, ආහාර සැකසුම් කිරීම සහ ආහාර සිල්ලර වෙළෙඳාම යන අංශ වලින් බහුතරයක් පාලනය කරන්නේ සමාගම් කිහිපයක් විසිනි. බිලියන සංඛ්‍යාත ජනතාවක් අනුභව කරන දේ හැඩගස්වන තීරණ ගනු ලබන්නේ ගොවීන්, ප්‍රජාවන් හෝ ප්‍රජාතන්ත්‍රවාදී රජයන් විසින් නොව, අන්තර්ජාතික සමාගම් කිහිපයක කොටස් හිමියන් සහ විධායකයන් විසිනි.

වෙළෙඳපොළ පදනම් කරගත් මෙම පද්ධතිය විසින් එකවර මහා පරිමාණ කුසගින්න සහ මහා පරිමාණ පරිභෝජනය යන දෙකම නිර්මාණය කර ඇත. මෙය පෝෂණය සහතික කරනවාට වඩා ලාභය ජනනය කිරීම පිණිස නිර්මාණය කර ඇති පද්ධතියක් තුළ පමණක් සිදු කළ හැකි පරස්පරයකි. ආහාර යන්න අයිතියක් ලෙස, එනම් මිනිසාගේ යහපැවැත්ම උදෙසා නිෂ්පාදනය කර බෙදා හැරිය යුතු සමාජ භාණ්ඩයක් ලෙස අවබෝධකර ගන්නේ නම්, ආහාර අතිරික්තයක් සමග කුසගින්න පැවතීම දේශපාලනික පිළියමක් අවශ්‍ය කරන දේශපාලනික අසාර්ථකත්වයක් ලෙස වහාම හඳුනා ගනු ඇත. වෙළෙඳ භාණ්ඩ සම්බන්ධ තාර්කිකය අනුව, කුසගින්න දරිද්‍රතාවයෙහි නොවැළැක්විය හැකි ප්‍රතිවිපාකයක් වන ස්වාභාවික දෙයක්

ලෙස සලකනු ලබන අතර, දරිද්‍රතාවය දේශපාලන තත්ත්වයක් ලෙස නොව පුද්ගලික දෙයක් ලෙස සලකනු ලැබේ. වෙළෙඳපොළ නිදොස් කරනු ලැබේ; කුසගින්නෙන් පෙළෙන අයට දොස් පවරනු ලැබේ.

සුළු පරිමාණ ගොවීන් පරම්පරා ගණනාවක් තිස්සේ ඔවුන් වගා කරමින් සිටි ඉඩම්වලින් ක්‍රමානුකූලව ඉවත් කර දැමීම වර්තමාන ආහාර පද්ධතියෙහි ඇති වඩාත්ම විනාශකාරී බලපෑම් වලින් එකක් වේ. ගෝලීය දකුණ පුරා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුව වැනි ජාත්‍යන්තර මූල්‍ය ආයතන විසින් පනවන ලද ව්‍යුහාත්මක ගැළපීම් වැඩසටහන් මගින්, සුළු පරිමාණ ගොවීන්ට ඔවුන්ගේ ජීවනෝපාය පවත්වාගෙන යාමට උපකාරී වූ රජයේ කෘෂිකර්ම ආධාරක පද්ධති, ව්‍යාප්ති සේවා, අලෙවි මණ්ඩල, ණය වැඩසටහන් සහ ආනයන ආරක්ෂණ බිඳ දැමුවේ ය. ගොවිතැන තවදුරටත් ප්‍රායෝගික නොවන බව මිලියන ගණනක් දෙනාට වහා ම අවබෝධ වූ අතර, ඔවුන්ට ගොවිබිම් වලින් ඉවත්ව නාගරික පැල්පත් නිවාසවලට යාමට සිදු විය; අප වැනි රටවල මෙම ප්‍රවණතාව අඛණ්ඩ ව පවතින අතර, එය තවතවත් උග්‍ර වෙමින් පවතියි. මෙම අවතැන් වීමට සමගාමී ව කෘෂිකාර්මික ජෛව විවිධත්වය සහ සියවස් ගණනාවක් පුරා දේශීය තත්ත්වයන්ට අනුවර්තනය වූ භෝග වර්ග සහ සතුන් වර්ග තුරන් වී යාම සිදුවේ. මෙම තුරන් වීම ආහාර පද්ධතිවල ඔරොත්තු දීමේ හැකියාව අඩු කර, ඒවා රෝග, නියඟ සහ දේශගුණික විපර්යාසය වල බලපෑමට ලක්වීමේ අවදානම වැඩි කරයි.

## ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම පද්ධතියේ අර්බුදය

දීර්ඝ කාලයක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ජීවනෝපායයෙහි සහ ජාතික ආහාර සුරක්ෂිතතාවෙහි මූලික පදනම වූ කෘෂිකාර්මික ආර්ථිකය දැන් එහි උප අංශ පුරා අන්තර් සම්බන්ධිත අර්බුදවලට මුහුණ පාමින් තිබේ. නිෂ්පාදකයන් ප්‍රතිපත්ති නොසලකා හැරීම, වෙළෙඳපොළ ලිහිල්කරණය සහ රජයේ සහාය යාන්ත්‍රණ දුර්වලවීම හා සම්බන්ධ පද්ධතිමය අභියෝගවලට මුහුණ දෙමින් සිටින බව දිස්ත්‍රික්ක පුරා පවත්වන ලද ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාවලින් මෙන් ම ද්විතීයික සාහිත්‍යයෙන් ද හෙළි වෙයි.

වී වගාව ශ්‍රී ලංකාවේ ආහාර නිෂ්පාදන පද්ධතියේ කොඳු නාරටිය වන නමුත්, එය බීජ සහ කෘෂි රසායන බොහෝ දුරට ආනයනික ප්‍රභේද වීමෙන් ද, ඒක වගාව සහ රසායනික පොහොර භාවිතය මත දැඩි ලෙස යැපීමෙන් ද බලපෑමට ලක්ව ඇත. මෙය බහුජාතික සමාගම් විසින් ගෝලීය වශයෙන් රසායනික පොහොර සහ දෙමුහුන් බීජ ප්‍රචලිත කිරීමත් සමග හරිත විප්ලවය අතරතුර නිර්මාණය වූ යථාර්ථයකි. දේශීය කෘෂිකර්මාන්ත අංශයේ බලධාරීන් ද ඒවා භාවිතයට ඉඩ සලසා දෙති. ගොවීන් සම්බන්ධයෙන් සැලකීමේ දී, මේ හේතුවෙන් පසෙහි සාරවත් බව පහත වැටී, යෙදවුම් පිරිවැය ඉහළ යමින් පවතියි. ග්‍රාමීය පරිවර්තනය බලගන්වන සාධකය ලෙස වරක් සිතූ මහවැලි වාරිමාර්ග යෝජනා ක්‍රම දැන් මහවැලි අධිකාරිය යටතේ අසමාන ලෙස ජලය වෙන් කරදීම් වලට මුහුණ දී ඇත. අස්වැන්න ඉහළ නැංවීම සඳහා ගුණාත්මක බීජ වී භාවිතය අතිශය වැදගත් වන නමුත් බීජ වී නිෂ්පාදනය සඳහා ඇති ආයතනික ධාරිතාව සීමාසහිත වීම මගින් මෙම විභවය සීමා කර ඇති බව ගොවීහු සඳහන් කරති (හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය, 2019; ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, 2021). වී අලෙවි කර ගැනීමේදී වී අලෙවි මණ්ඩලයෙන් ලැබෙන සහාය ඉතා සීමිත වන අතර, එය බොහෝ විට ප්‍රමාද වූ කාල පරාසයන් තුළ හෝ පිරිවැය-ආවරණය කර ගැනීමටවත් ප්‍රමාණවත් නොවන මිලකට වී මිල දී ගන්නා බැවින් එය ගොවීන්ගේ කේවල් කිරීමේ බලය දුර්වල කරයි.

මේ අතර, එළවළු වගාව, විශේෂයෙන් ම, කඳුකරයේ සහ වියළි කලාපයේ එළවළු වගාව පසු අස්වනු ගබඩා කිරීමේ සහ ශීත කිරීමේ හැකියාවන් දුර්වල වීම නිසා බලපෑමට ලක්ව ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස සමස්ත නිෂ්පාදනයෙන් 25% - 40% ක් පමණ අපතේ යන බවට ඇස්තමේන්තු කර ඇත (ආහාර හා කෘෂිකර්ම සංවිධානය, 2020). වෙළෙඳපොළ ප්‍රවේශය සීමිත වීම සහ ප්‍රමාණවත් තරම් ප්‍රවාහන සහ දේශීය අගය එකතු කිරීමේ පහසුකම් නොමැතිකම හේතුවෙන් ගොවීන්ට විශාල පසු අස්වනු පාඩු විඳීමට සිදු වී තිබේ. මෙම අකාර්යක්ෂමතා ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අලෙවිකරණ පද්ධතියේ තිබෙන ව්‍යුහාත්මක අඩුපාඩු පිළිබිඹු කරන අතර, කෙටස්වලට කැඩී ගොස් ඇති එම පද්ධතියෙහි ආධිපත්‍යය දරන්නේ ගොවි සමුපකාර හෝ නිෂ්පාදකයන්ගේ සංවිධාන විසින් නොව, අතරමැදියන් විසිනි. (ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, 2019).

ඒ හා සමාන ව, ධාන්‍ය වර්ග, බඩ ඉරිඟු, එළඟු සහ මිරිස් වැනි අනෙකුත් ක්ෂේත්‍ර භෝග නිෂ්පාදකයන් ද ආයෝජන, පර්යේෂණ සහ බීජ නිෂ්පාදනය සම්බන්ධ දැඩි සීමාවන්ට මුහුණ දෙති. රාජ්‍ය ආයෝජන සීමා සහිත වීම තාක්ෂණික නවෝත්පාදනයට බාධාවක් වී ඇති අතර, බීජ තොගවල තිබෙන බැක්ටීරියා සහ දිලීර ආසාදන ප්‍රරෝහණ අනුපාත සහ අස්වැන්න අඩු කර ඇත. ආනයන තරඟකාරිත්වය සහ සංවිධානාත්මක වෙළෙඳපොළ නොතිබීම හේතුවෙන් මෙම ගොවීන්ගෙන් බොහෝ දෙනෙක් ඉතා අඩු ලාභයක් සහිත ව ගොවිතැනෙහි නිරත වේ (හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය, 2015; ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව, 2023).

අධික ලෙස මසුන් ඇල්ලීම, දේශගුණික විපර්යාසවල බලපෑම් සහ භූ දේශපාලනික පීඩනයන් හේතුවෙන් ධීවර අංශය බහුවිධ අර්බුදවලට මුහුණ දී සිටියි. සම්පත් ක්ෂය වීම, ඉන්ධන පිරිවැය ඉහළ යාම සහ විශේෂයෙන් ම උතුරු හා නැගෙනහිර ජල තීරයන් හී ඉන්දියානු ට්‍රෝලර් යාත්‍රා විසින් සිදුකරනු ලබන ආක්‍රමණය කිරීම් හේතුවෙන් අල්ලාගත හැකි මත්ස්‍යයින් ප්‍රමාණය අඩු වී ඇති බව වෙරළබඩ ධීවරයෝ පවසති (ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය, 2021; ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය, 2022). වෙරළබඩ කලාපවල සංචාරක යටිතල පහසුකම් පුළුල් වීම සාම්ප්‍රදායික ධීවර බිම් වෙත ප්‍රවේශය තවදුරටත් අඩු කර ඇති අතර, දැරිය හැකි ණය හෝ රක්ෂණ පහසුකම් නොමැති සුළු පරිමාණ ධීවරයන් අපනයනය ඉලක්කර ගත් ධීවර ආර්ථිකය තුළ වැඩි වැඩියෙන් ආන්තිකකරණයට ලක්වී ඇත.

තේ, රබර් සහ පොල් ප්‍රමුඛ වූ වතු ආර්ථිකය දැඩි ලෙස අපනයනය මත රඳා පවතින බැවින් එය ගෝලීය මිල අස්ථාවරත්වයට නිරාවරණය වේ. ශ්‍රමය සූරාකෑම, අසමාන ඉඩම් අයිතිය සහ ණය පහසුකම් වෙත ප්‍රවේශය සීමිත වීම වැනි ව්‍යුහාත්මක ගැටලු වතු කම්කරුවන්ගේ සුභසාධනය දුර්වල කරයි (බැස්ටියන්, 2022). වතු කම්කරුවන්, විශේෂයෙන්ම කාන්තාවන්, වැටුප් වැඩිනොවීම සහ අනාරක්ෂිත නිවාසවල ජීවත්වීමට සිදුවීම හේතුවෙන් පීඩාවට පත්ව සිටින අතර, කුඩා වතු හිමියන් රජයේ හෝ වාණිජ බැංකුවලින් සහනදායී ණය ලබා ගැනීමට උත්සාහ දරමින් සිටිති. වතුකරයේ ඉඩම් හිමිකාරිත්වය සංකේන්ද්‍රණය වීම ඉහළ යමින් පැවතීම කම්කරුවන් අතර ඉඩම් බෙදාදීමේ අවස්ථා සහ ග්‍රාමීය නිෂ්පාදනය විවිධාංගීකරණය කිරීමේ අවස්ථා තවදුරටත් සීමා කරයි.

ශ්‍රී ලංකාවේ කිරි කර්මාන්තය ද ඒ හා සමානවම කොටස්වලට කැඩී ගොස්, කිරි නිෂ්පාදනය සුළු පරිමාණ ගොවීන් අතර විසිරී තිබෙන අතර, එම අංශය සමස්ත කිරි පරිභෝජනයෙන් 44% ට ආසන්න ප්‍රමාණයක් නියෝජනය කරන ආනයනික පිටි කිරි මත දැඩි ලෙස රඳා පවතියි (ශ්‍රී ලංකා මහ බැංකුව, 2023). කිරි ගොවීන්, සමුපකාර සහ පෞද්ගලික සැකසුම්කරුවන් අතර පවතින සම්බන්ධතා දුර්වලවීම දේශීය කිරි එකතු කිරීම සහ සැකසුම් කිරීම අඩාල කර ඇත. ස්වයංපෝෂිතභාවය අත්කර ගැනීම සඳහා ප්‍රතිපත්ති ප්‍රයත්නයන් තිබුණ ද, ශීතාගාර පහසුකම්, පශු වෛද්‍ය සහාය සහ මූල්‍ය දිරිගැන්වීම් ප්‍රමාණවත් නොවීම මෙම අංශය එහි විභවය සාක්ෂාත් කර ගැනීමෙන් වළක්වා ඇත (ආහාර හා කෘෂිකර්ම සංවිධානය, 2020; ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, 2022).

ගෙවතු වගාව සහ කෘෂි-වන වගා ආකෘති ඇතුළු ඒකාබද්ධ ගොවිතැන් කිරීමේ පද්ධති මගින් ආහාර නිෂ්පාදනය ජෛව විවිධත්ව සංරක්ෂණය සමග ඒකාබද්ධ කරන, පාරිසරික වශයෙන් තිරසාර වූ විකල්ප සපයා දෙන නමුත් ඒවාට ලැබෙන ආයතනික සහයෝගය සීමා සහිත වේ. එමෙන්ම, ඒවා නාගරීකරණය, ඉඩම් කැබලිවීම සහ ප්‍රතිපත්ති නොසලකා හැරීම් හේතුවෙන් වැඩි වැඩියෙන් තර්ජනයට ලක්වී ඇත. ඓතිහාසිකවම ග්‍රාමීය ආහාර සුරක්ෂිතතාවට දායක වූ මෙම පද්ධති, ඉලක්කගත ව්‍යාප්ති සේවා වෙත හෝ සහනදායී ණය පහසුකම් වෙත ප්‍රවේශයක් නොතිබීම හේතුවෙන් ජීවනෝපාය පවත්වා ගැනීම දුෂ්කර ව ඇත.

සියලුම උප අංශ තුළ නිෂ්පාදකයන්ට රාජ්‍ය සහයෝගය ලබාදීමෙහි සහ මූල්‍ය අන්තර්කරණය කිරීමෙහි අඩුපාඩු පැවතීම නිරතුරුව පවතින ගැටලුවක් වී තිබේ. රාජ්‍ය බැංකු පවා ණය සඳහා ඇපකර ඉල්ලා සිටින අතර, කුඩා වතු හිමියන්, ධීවරයන් සහ කාන්තා නිෂ්පාදකයන් සහනදායී ණය පහසුකම් වලින් බැහැර කර

ඇත. මෙම බැංකුවල සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන අංශ කෘෂිකාර්මික නිෂ්පාදකයින් වෙත ප්‍රවේශවීම සීමාවී ඇති බව පෙන්නුම් කරයි. මේ අතර, ඉඩම් අත්පත් කර ගැනීම සහ, විශේෂයෙන් ම උතුරු පළාතේ, වනාන්තර සහ ආරක්ෂිත කලාප ලෙස රජයේ ඉඩම් නැවත වර්ගීකරණය කිරීම පශ්චාත් යුධ සමයේ කෘෂිකාර්මික අනාරක්ෂිතභාවය තවත් උග්‍ර කර ඇත. යුද්ධය අවසන් වී කෙටි කලකට පසුව වනාන්තර හෝ වනජීවී රක්ෂිත ලෙස නම් කර තිබුණේ ඉඩම් වලින් 32% ක් පමණක් වුවද, 2025 වන විට එම ප්‍රමාණය 72% ක් දක්වා පුළුල් වී ඇති බවත්, ඒ හේතුවෙන් වගා කළ හැකි ඉඩම් විශාල ප්‍රමාණයක් වෙත ප්‍රජා ප්‍රවේශය අහිමිකර ඇති බවත් නිල දත්ත පෙන්වා දෙයි (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 2024).

වටිනාකම සැලකූ විට, දේශීය කෘෂිකර්මාන්තය තවමත් ශ්‍රී ලංකාවේ ආහාර අවශ්‍යතාවෙන් ආසන්න වශයෙන් 80% ක් පමණ සපයා දෙන අතර, එමගින් ආහාර සුරක්ෂිතතාවයේ ප්‍රධාන කොටසක් සුළු පරිමාණ ආහාර නිෂ්පාදකයින් මත රඳා පවතින බව අවධාරණය කරයි (ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, 2018). වෙළෙඳපොළ ආයතන දුර්වල වීම සහ ණය පහසුකම් වෙත ප්‍රවේශය හැකිළී යාම සමග බද්ධ වී ඇති මෙම ක්‍රියාවලීන් එකට එක්වී ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ පවතින අර්බුදය ගැඹුරු කරන අතර, ආහාර සුරක්ෂිතතාව සහ ආහාර ස්වෛරීභාවය යන දෙකටම අවදානම් ඇති කරයි.

**ව්‍යාජ විසඳුම්**

කෘෂිකර්මාන්තයේ අර්බුදය ගැඹුරු අර්බුදයක් වන අතර, ජාත්‍යන්තර ආර්ථික ආයතන විසින් ඉදිරිපත් කරනු ලබන නිර්දේශ මගින් එය විසඳනවා වෙනුවට එය තවත් උග්‍ර කර තිබේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ අනෙකුත් ජාත්‍යන්තර ණය දෙන ආයතන සමග ගිවිසගෙන ඇති වැඩසටහන් වලට වෙළෙඳාම ලිහිල්කරණය කිරීම, සහනාධාර කප්පාදු කිරීම සහ රජයේ වියදම් අඩු කිරීම, කෘෂිකර්මාන්තය සඳහා රජයෙන් ලබාදෙන සහයෝගය ක්‍රමානුකූලව අඩු කිරීම වැනි කොන්දේසි ඇතුළත් වේ. සහනාධාර ඉවත් කර වෙළෙඳපොළ කඩිමුඩියේ විවෘත කළ විට, එයින් වැඩි ම පාඩුවක් සිදුවන්නේ කුඩා වතු හිමියන්ට ය. ආහාර ආනයනය කර අඩු මිලට විකිණීම මගින් වී, එළවළු, අර්තාපල් සහ කිරි නිෂ්පාදනය කරන දේශීය නිෂ්පාදකයින් සංඛ්‍යාව අඩු වන අතර, එමගින් රටේ ආහාර ස්වෛරීභාවයේ අත්තිවාරම් ඛාදනය වී යයි (ජාත්‍යන්තර මූල්‍ය අරමුදල 2024, IV වන වගන්තිය, ශ්‍රී ලංකාව).

ගෝලීය වශයෙන් පවතින අස්ථාවරත්වය මෙම ව්‍යුහාත්මක පීඩනයන් තවත් සංකීර්ණ කර ඇත. රුසියානු-යුක්රේන යුද්ධය හේතුවෙන් ජාත්‍යන්තර තිරිඟු, බඩ ඉරිඟු සහ පොහොර සැපයුම් දාම බිඳ වැටුණු අතර, ඒ හේතුවෙන් යෙදවුම් පිරිවැය ඉහළ ගොස්, එවැනි කම්පන දරා ගැනීමට තරම් ප්‍රමාණවත් සංචිත නොමැති සුළු නිෂ්පාදකයන් දැඩි ලෙස අවදානමට නිරාවරණය විය. මේ අතර, එක්සත් ජනපදයේ තීරණ හේතුවෙන් ඇතිවන වෙළෙඳ ආතතීන් සහ තීරුබදු අනුපාත වෙනස්වීම් ලෝක වෙළෙඳපොළවල අස්ථාවරත්වය වැඩි කර ඇති අතර, එය ශ්‍රී ලංකාවේ තේ සහ රබර් අපනයන සඳහා විශේෂ බලපෑම් ඇති කරමින්, විදේශ විනිමය ඉපැයීම් පහත වැටී, කෘෂිකාර්මික ආනයන ස්ථාවරව පවත්වා ගැනීමට සහ දේශීය නිෂ්පාදකයින් බාහිර කම්පන වලින් ආරක්ෂා කර ගැනීමට රට සතු ධාරිතාවය දුර්වල කර ඇත. ඉතා ම මෑතකදී, එක්සත් ජනපදය සහ ඊශ්‍රායලය ඉරානයට එරෙහිව දියත් කළ යුද්ධයේ ප්‍රතිඵලයක් ලෙස ඉරානය ගෝලීය තෙල්වලින් බහුතරයක් ප්‍රවාහනය කරන ස්වාභාවික මුහුදු මාර්ගයක් වන හෝමුස් සමුද්‍ර සන්ධිය වසා දැමීමට කටයුතු කළේ ය. ගල්ෆ් කලාපය ශ්‍රී ලංකාවට පොහොර ලබාගන්නා මූලාශ්‍රයක් වන අතර, එම සමුද්‍ර සන්ධිය වසාදැමීම පොහොර ප්‍රවාහනයට බාධා ඇතිකර තිබේ. ගොවීන් නව වගා කන්නය ආරම්භ කිරීමත් සමග, සැපයුම් දාමයට සිදුවූ බාධාවීම් හේතුවෙන් යෙදවුම් මිල ඉහළ යාම ගොවීන්ට බලපෑම් ඇතිකර තිබේ.

වෙළෙඳ ගිවිසුම් තවදුරටත් සංකීර්ණතා නිර්මාණය කර ඇත. මෑතක දී අත්සන් කරන ලද ශ්‍රී ලංකා-තායිලන්ත නිදහස් වෙළෙඳ ගිවිසුම (2024) මගින් ආර්ථික සහයෝගීතාව තවත් ශක්තිමත් කිරීමට අරමුණු කර ගෙන ඇති අතර, ඒ මගින් ශ්‍රී ලංකාවේ තේ සහ කුළුබඩු සඳහා නව අපනයන වෙළෙඳපොළ විවෘත වනු ඇති නමුත් එය සුළු පරිමාණ ආහාර නිෂ්පාදකයන් සඳහා සැලකිය යුතු අවදානම් ද නිර්මාණය කරයි. තායිලන්තයෙන් අඩු මිලට කෘෂිකාර්මික නිෂ්පාදන ආනයන කිරීම හේතුවෙන් මෙරට එළවළු, පළතුරු සහ කුළුබඩු වගා කරන ගොවීන් සංඛ්‍යාව අඩු විය හැකි අතර, එය දේශීය පරිභෝජනය සඳහා ආහාර වගා

කිරීම හානියට පත්කරමින්, ගොවීන් තම වගා බිම් අපනයන ඉලක්ක කරගත් භෝග වගා වෙත මාරු කිරීම දිරිමත් කරනු ඇත. ඒ හා සමානවම ඉන්දියාව, පකිස්ථානය සහ දකුණු ආසියානු නිදහස් වෙළෙඳ කලාපය පුරා පවතින තීරුබදු-නිදහස් ගිවිසුම් නිසා එළවළු, ධාන්‍ය සහ කුඩා ධාන්‍ය වර්ග ආනයනය කිරීම බොහෝ විට ලාභදායී වන බැවින් දේශීය නිෂ්පාදකයන් සඳහා මිල ස්ථාවරත්වය අඩු කර, දැනටමත් ලැබෙන ඉතා අඩු ලාභය තවදුරටත් හකුලා දමයි.

මූල්‍ය පහසුකම් ලබාදීමේ දී ද ප්‍රමුඛතා වැරදි ලෙස පෙළගස්වා ඇති බව පෙන්නුම් කරයි. රජය සතු බැංකු සහ ඒවායෙහි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන අංශ විසින් ඇපකර ඉදිරිපත් කළ නොහැකි හෝ ණය යෝග්‍යතාව තහවුරු කළ නොහැකි කුඩා වතු හිමියන්ට, ධීවරයන්ට සහ කාන්තා නිෂ්පාදකයන්ට වඩා මහා පරිමාණ නිෂ්පාදකයන්ට සහ අපනයන-ඉලක්ක කරගත් කෘෂි ව්‍යාපාරවලට අනුග්‍රහය දක්වයි. මෙම ආයතනික පක්ෂපාතීත්වය ණය වෙත ප්‍රවේශවීමේ අසමානාත්මතාව තවත් උග්‍ර කරන අතර, සැබවින් ම ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාව බොහෝ දුරට රඳා පවතින නිෂ්පාදකයන්ව පසෙකට දමයි.

දේශගුණික අර්බුදවලට ප්‍රතිචාර දැක්වීම පවා ව්‍යාජ විසඳුම් වලින් නිදහස් වී නැත. ජාත්‍යන්තර ආයතන සහ පරිත්‍යාගශීලීන් විසින් ප්‍රවර්ධනය කරනු ලබන 'දේශගුණික සුහුරු කෘෂිකර්මාන්තය' වැනි කාර්යරාමු මගින් සුළු පරිමාණ නිෂ්පාදකයන්ට සැබවින් ම අවශ්‍ය කරන ව්‍යුහාත්මක වෙනස්කම් වලට වඩා තාක්ෂණික නිවැරදි කිරීම්, නියඟයට ඔරොත්තු දෙන, ජානමය වශයෙන් වෙනස් කරන ලද ජීවී ප්‍රභේද, සියුම් කෘෂිකර්මාන්තය සහ හරිත වායු විමෝචන අඩුකිරීමේ වෙළෙඳපොළ වලට බොහෝ විට ප්‍රමුඛත්වය දෙයි. කාබන් විමෝචන අඩුකරන වෙළෙඳ යෝජනා ක්‍රම, විශේෂයෙන්ම, කාබන් වෙන්කර තැබීමේ නාමයෙන් ඉඩම් සහ වෙරළබඩ භාවිතය සීමා කිරීම මගින් ගොවි සහ ධීවර ප්‍රජාවන්ට ඉඩම් අහිමි කිරීමේ අවදානමක් ඇත. මෙය දේශගුණික විපර්යාස හේතුවෙන් සිදුවන පාඩු විඳ දරා ගන්නා ප්‍රජාවන් වෙත නොව, සමාගම් සහ අතරමැදියන් වෙත මූල්‍ය ප්‍රතිලාභ යොමු කරයි. මෙම වෙළෙඳපොළ පදනම් කරගත් දේශගුණික විසඳුම් කෘෂි-පරිසර විද්‍යාත්මක හා සාම්ප්‍රදායික ගොවිතැන් පද්ධති මගින් දැනටමත් ලබා දෙන පාරිසරික ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කරනවා වෙනුවට බාහිර යෙදවුම් සහ ආයතනික තාක්ෂණය මත යැපීම තවත් දැඩි කිරීමේ ප්‍රවනතාවයක් ඇති කරයි.

කෘෂිකර්මාන්තයේ අර්බුදය විසඳනවා වෙනුවට, මෙම ව්‍යාජ විසඳුම්, වෙළෙඳ ලිහිල්කරණය, මූල්‍ය කප්පාදු කිරීම්, වෙළෙඳපොළ පදනම් කරගත් දේශගුණික රාමු සහ ණය යෝග්‍යතාවයට පදනම් කරගත් මූල්‍ය පහසුකම් යන සියල්ල එකට එක්වී එය තහවුරු කර ඇත.

**එසේ නම්, අපගේ විකල්ප, පරමාදර්ශී ආහාර පද්ධතිය කවර ආකාරයක් ගන්නේ ද?**

මෙයට පිළිතුර විශ්වවිද්‍යාලයක සකස් කරන ලද සැලැස්මක් ලෙස නොව, රටවල් හැත්තෑවකට අධික සංඛ්‍යාවක ගොවි සහ ගැමි සංවිධාන සිය ගණනක් විසින් ගොඩනගා ඇති ජීවමාන දේශපාලන රාමුවක් ලෙස දැනටමත් පවතියි. එය 'ආහාර ස්වෛරීභාවය' යන නමින් හඳුන්වනු ලැබේ.

මෙම යෙදුම 1996 වර්ෂයේ දී රෝමයේ පැවති ලෝක ආහාර සමුළුවේ දී La Via Campesina (ගොවීන්ගේ මග) නැමති ව්‍යාපාරය විසින් නිර්මාණය කරන ලද අතර, 2007 වර්ෂයේ දී නිලෙනී ප්‍රකාශනයේ වඩාත් හොඳින් ප්‍රකාශ කර ඇත: ඒ අනුව, ආහාර ස්වෛරීභාවය යනු 'පාරිසරික වශයෙන් යහපත් සහ තිරසර ක්‍රම මගින් නිෂ්පාදනය කරනු ලබන, සෞඛ්‍ය සම්පන්න සහ සංස්කෘතික වශයෙන් ගැළපෙන ආහාර සඳහා ජනතාවට ඇති අයිතිය සහ තමන්ගේ ආහාර සහ කෘෂිකර්ම පද්ධති නිර්වචනය කිරීමට ඔවුන්ට ඇති අයිතිය' වේ. සෑම වාක්‍ය ඛණ්ඩයකම ආහාර පිළිබඳ තීරණ ගැනීම සඳහා වෙළෙඳපොළ වලට හෝ සමාගම්වලට නොව, ජනතාවට ඇති අයිතිය නිර්වචනය කරන හරයක් ඇත. මෙම ආහාරය හුදෙක් කැලරි ප්‍රමාණයක් පමණක් නොවේ, එය සෞඛ්‍ය සම්පන්න සහ සංස්කෘතික වශයෙන් ගැළපෙන, පෝෂණය ගෙන දෙන සහ සමාජයට අයත් වූවක් වේ. ආහාර නිෂ්පාදනය කරනු ලබන්නේ ජීවී පද්ධති වලට එරෙහි ව නොව, ඒවා සමග එක් ව කටයුතු කරමින්, පාරිසරික වශයෙන් යහපත් ආකාරයකට ය.

ජනතාවට තමන්ගේම පද්ධති, එනම්, ආහාර ප්‍රජාතන්ත්‍රවාදය, මූලික මට්ටමේ සිට නිර්වචනය කිරීමට අයිතියක් ඇත.

ප්‍රායෝගික ව, මෙම විකල්ප පද්ධතිය එකිනෙකට බැඳුණු කැපවීම් කිහිපයක් මත රඳා පවතියි. ඉන් පළමුවැන්න ප්‍රජාතන්ත්‍රවාදී පාලනයයි: එනම්, තීරණ ගැනීම අහාර වලින් ලාභ ලබන අය විසින් නොව, ආහාර නිෂ්පාදනය කරන සහ පරිභෝජනය කරන අය සතු විය යුතුයි. රජය විසින් දේශීය කෘෂිකර්මාන්තය මිල අඩු ආනයන වලින් අස්ථාවර කරනු ලැබීමෙන් ආරක්ෂා කර ගැනීමේ අයිතිය රජය සතුව රඳවා ගත යුතු බවත්, ප්‍රජාවන් තම ඉඩම්, ජලය සහ බීජ මත සැබෑ පාලනයක් තබා ගත යුතු බවත් එයින් අදහස් වෙයි. දෙවැන්න කෘෂි පරිසර විද්‍යාවයි: එය පස කැණීමට වඩා පස ගොඩනගන, ජෛව විවිධත්වය ආරක්ෂා කරන, ස්ථානීය වශයෙන් පෝෂ්‍ය පදාර්ථ චක්‍රීය කරන, සහ සුදුසුම දේ කුමක්ද යන්න දැන ගැනීම සඳහා සමාගම්වල යෙදවුම් පැකේජ නොව, ගොවීන් පරම්පරා ගණනාවක් පුරා ගොඩනගා ගෙන ඇති දැනුම ප්‍රයෝජනයට ගන්නා ගොවිතැනයි. තෙවැන්න ඕනෑම සාධාරණ හා තිරසාර ආහාර පද්ධතියක කොඳු නාරටිය වන සුළු පරිමාණ ගොවිතැන සක්‍රීය ලෙස ආරක්ෂා කිරීමයි.

මෙය මනෝරාජ්‍යයක් නොවේ. 1970 දශකයේ සිට හරිත විප්ලවයෙන් හානියට පත් වූ ශ්‍රී ලංකාව වැනි රටක පවා, දිවයින පුරා ප්‍රජාවන් දැනටමත් ආහාර ස්වෛරීභාවයේ විවිධ අංග ක්‍රියාත්මක කරති. බුත්තල පිහිටුවා ඇති බීජ බැංකුවක සිට, රාජාංගනයේ සාම්ප්‍රදායික වී ගොවීන්, ගොවි වෙළෙඳපොළවල් ගොඩනගන කාන්තා කණ්ඩායම්, සහ රට පුරා විසිරී තිබෙන සකසුරුවම්, ණය දෙන සහ අනෙකුත් සමුපකාර සමිති දක්වා වූ විකල්පය මනඃකල්පිත වූවක් නොවේ. එය දැනටමත් මෙහි තිබේ, එහෙත් එය කොටස්වලට බෙදී තිබෙන බැවින් එකිනෙකට සම්බන්ධ කළ යුතු ව තිබේ.

මෙම වාර්තාවේ ප්‍රධානම අරමුණ වන්නේ රටේ විවිධ ප්‍රදේශවල පවතින මෙම පිළිවෙත් ලේඛනගත කිරීම සහ තවත් ආහාර පද්ධතියක් සැකසීම කළ හැකි දෙයක් පමණක් නොව මේ වන විටත් ක්‍රියාත්මකව පවතින්නක් බව පෙන්වා දීමයි. අපි එය තව තවත් ශක්තිමත් කිරීමට, වැඩි දියුණු කිරීමට සහ තිරසර කිරීමට කටයුතු කළ යුතු ය.

## ක්‍රමවේදය

දිවයින පුරා පිහිටි දිස්ත්‍රික්කවල ආහාර නිෂ්පාදකයින් සමඟ පවත්වන ලද ප්‍රාථමික සම්මුඛ සාකච්ඡා මාලාවක් ඇසුරෙන් මෙම වාර්තාව සකස් කර ඇත. ශ්‍රී ලංකාවේ වත්මන් ආහාර පද්ධතිය නිර්මාණය වීමේ ඓතිහාසික හා දේශපාලනික පසුබිම සැකසීම සඳහා හැඳින්වීම් පරිච්ඡේද වලදී, පෙර ප්‍රකාශන සහ සංඛ්‍යාලේඛන වලින් ලබාගත් ද්විතීයික දත්ත භාවිත කර තිබේ.

### පහසුකම් සපයන්නන් තෝරා ගැනීම

විවිධ ප්‍රදේශවල පැවැත්වීමට නියමිතව තිබූ සාකච්ඡා වට මෙහෙයවීම සඳහා ව්‍යාපෘති කණ්ඩායම විසින් පහසුකම් සපයන්නන් එකොළොස් දෙනෙකු තෝරා ගන්නා ලදී. මෙම පුද්ගලයින් තෝරා ගනු ලැබුවේ අධ්‍යයනයට ලක් කෙරෙන ආහාර නිෂ්පාදන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් ඔවුන් සතු විශේෂඥ දැනුම පදනම් කරගෙන ය. එමෙන් ම, ඔවුන් සියලු දෙනාම දිගුකාලීන ව දේශීය ප්‍රජාවන් සමඟ සමීප ව කටයුතු කර ප්‍රදර්ශනය කර ඇති අත්දැකීම් සහිත අය වෙති.

සහභාගිවන්නන් සමඟ එක්ව විකල්පයන් හී සඵලතාව ඇගයීමට ලක් කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහ ක්ෂේත්‍ර දැනුම ද මෙම කොමසාරිස්වරුන් සතු වේ. පර්යේෂණ කණ්ඩායමක් විසින් සහභාගිවන්නන් ගෙන් ප්‍රශ්න විමසන අතරතුර, කොමසාරිස්වරුන්ගේ මැදිහත් වීම සහ මෙහෙයවීම මඟින් (මෙම ක්‍රියාවලියට) ඉහළ අගයක් එකතු විය.

### ස්ථාන සහ නියැදි

කොළඹ දී පැවැත්වුණු සාකච්ඡා වට දෙකකදී කොමසාරිස්වරුන්, පර්යේෂකයින් සහ සම්බන්ධීකාරකවරුන් ගෙන් සැදුම්ලත් කණ්ඩායම විසින් ක්ෂේත්‍රය තුළ සිදු කිරීමට නියමිත ප්‍රාථමික පර්යේෂණයේ විෂය පථය නිර්වචනය කරන ලදී.

එක් එක් සාකච්ඡා වට සඳහා ස්ථාන තෝරා ගනු ලැබුවේ, අදාළ නිශ්චිත ප්‍රදේශය තුළ ආහාර නිෂ්පාදනය කේන්ද්‍රගත වී ඇති ස්වභාවය සහ ඒවාට අදාළ විශේෂීකරණය පදනම් කරගෙන ය.

| **රැස්වීම පැවැත් වූ ස්ථානය** | **සහභාගී වූ අය පැමිණි ප්‍රදේශ** | **ක්ෂේත්‍ර** |
|---|---|---|
| දඹුල්ල නගරය | අනුරාධපුර, කුරුණෑගල, පොලොන්නරුව | වී, එළවළු, මිරිදිය මත්ස්‍යය, ආහාර නිෂ්පාදන |
| මන්නාරම නගරය | මන්නාරම | ධීවර, අනෙකුත් ක්ෂේත්‍ර බෝග |
| යාපනය නගරය | යාපනය | ධීවර, අනෙකුත් ක්ෂේත්‍ර බෝග |
| මහනුවර නගරය | නුවර, මාතලේ | අනෙකුත් ක්ෂේත්‍ර බෝග |
| හැටන් | නුවරඑළිය | එළවළු සහ කිරි (වතුකර) |
| දෙනියාය | දෙනියාය | එළවළු සහ අනෙකුත් ක්ෂේත්‍ර බෝග |
| බටාත | හම්බන්තොට, මාතර, දික්වැල්ල, ගාල්ල | වී, එළවළු, අනෙකුත් ක්ෂේත්‍ර බෝග, ධීවර |
| මොනරාගල | බදුල්ල, මොනරාගල, වැල්ලවාය | වී. අනෙකුත් ක්ෂේත්‍ර බෝග, ගෙවතු |
| තන්නමුනෙයි | මඩකලපුව, ත්‍රිකුණාමලය | කිරි, ධීවර, ආහාර නිෂ්පාදන |
| ඕලුවිල් | අම්පාර | වී. කිරි, අනෙකුත් ක්ෂේත්‍ර බෝග, ආහාර නිෂ්පාදන, ධීවර |

නීතිය සහ සමාජයීය භාරය (LST), ඉඩම් හා කෘෂිකර්ම ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය (MONLAR) සහ ජාතික ධීවර සහයෝගිතා ව්‍යාපාරය (NAFSO) යන ආයතන, එක් එක් ස්ථානයට සහභාගි වන පිරිසෙන් ස්ථිර සංඛ්‍යාවක වගකීම භාර ගන්නා ලදී. ඒ අනුව, ඔවුන්ගේ පෙර කටයුතු හෝ දැනට ක්‍රියාත්මක වන ප්‍රජා ව්‍යාපෘති මගින් තමන් හඳුනාගෙන තිබූ, විකල්ප ආහාර නිෂ්පාදන ක්‍රමවේදයන් හී නියැලී සිටින කණ්ඩායම් සහ පුද්ගලයින් හට ඔවුහු ආරාධනා කළහ. සාකච්ඡාවන් සඳහා මුළු පිරිස් 272 දෙනෙකු සහභාගී වූහ. සහභාගිවන්නන්ට සහභාගි වීම සඳහා ඉතා දිගු දුරක් ගමන් කිරීමට සිදු නොවන පරිදි, විවිධ ප්‍රදේශ ආවරණය වන පරිදි හැකිතාක් සාකච්ඡා වට ප්‍රමාණයක් පැවැත්වීමට පර්යේෂකයෝ උත්සාහ කළහ. එබැවින්, එක් එක් ස්ථානයට ආරාධනා කරනු ලැබුවේ අදාළ දිස්ත්‍රික්කයේ පදිංචි නිෂ්පාදකයින් මෙන්ම ඊට ආසන්නතම වටපිටාවේ පිහිටි දිස්ත්‍රික්කවල ජීවත් වන නිෂ්පාදකයින්ට ය.

**විෂය පථය**

ආහාර පද්ධතියේ විවිධ අවධීන් හි දී නිෂ්පාදකයින් විසින් දැනට ප්‍රායෝගික ව භාවිත කරනු ලබන විකල්ප ක්‍රමවේදයන් ලේඛනගත කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ විය. ඉන්පසුව පැවැත්වෙන ප්‍රාදේශීය රැස්වීම්වල දී මෙම සියලු අවධීන් පිළිබඳ ව සාකච්ඡා කෙරෙන බව තහවුරු කිරීම සඳහා කොමසාරිස්වරුන් සහ පර්යේෂකයින් විසින් ප්‍රශ්නාවලියක් සකස් කරන ලදී. නිෂ්පාදන අවධියේ සිට පරිභෝජන අවධිය දක්වා දිවෙන මෙම ප්‍රශ්න මගින්, සාකච්ඡා වට සඳහා ඒකාකාරී මාතෘකා පරාසයක් ආවරණය කිරීමට ඉඩ සැලසුණු අතර ම, සහභාගිවන්නන්ට තමන්ගේ දැනුම සහ අත්දැකීම් බෙදා හදා ගැනීමට ප්‍රමාණවත් නම්‍යශීලීතාවක් ද ලබා දුන්නේ ය.

මෙම ප්‍රශ්න ලැයිස්තුව මෙම වාර්තාවේ ඇමුණුම්වල ඇතුළත් කර ඇත.

**ප්‍රාදේශීය සාකච්ඡා**

සෑම රැස්වීමක් ම අදාළ දිස්ත්‍රික්කයේ මධ්‍යගත, ප්‍රසිද්ධ සහ පහසුවෙන් ප්‍රවේශ විය හැකි ස්ථානයක පවත්වන ලදී. ව්‍යාපෘති සහ පර්යේෂණ කණ්ඩායමට පැමිණ සිටි පිරිස පිළිබඳ වාර්තා තබා ගැනීමට උපකාරී වීම සඳහා, සහභාගිවන්නන් මුලින්ම ජන විකාශන (demographic) ප්‍රශ්න මාලාවකට පිළිතුරු සැපයූහ. වාර්තාකරණ කටයුතු සඳහා මේවා වගුගත කර ඇත.

මෙම ජන විකාශන සමීක්ෂණ පත්‍රය මෙම වාර්තාවේ ඇමුණුම්වල ඇතුළත් කර ඇත.

ව්‍යාපෘති කණ්ඩායමේ සාමාජිකයෙකු විසින් මෙම පර්යේෂණයේ අරමුණ හඳුන්වා දුන් අතර, නිෂ්පාදකයින් දැනටමත් ක්‍රියාවට නන්වන විකල්ප ක්‍රමවේදයන් ලේඛන ගත කිරීම සහ ඔවුන්ගේ අනාගත අපේක්ෂාවන් පිළිබඳ ව මෙහි දී ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන ලදී. මෙම පොදු හැඳින්වීමෙන් අනතුරුව, සහභාගිවන්නන් තමන්ගේ ප්‍රධාන ආදායම් මාර්ගය ලෙස හඳුනාගත් ක්ෂේත්‍ර පදනම් කරගනිමින් සමස්ත පිරිස කණ්ඩායම්වලට බෙදනු ලැබී ය. මෙලෙස කණ්ඩායම් කිරීම මගින් ප්‍රධාන ආහාර ක්ෂේත්‍රයන් සමස්තයක් ලෙස සාකච්ඡා කිරීමට අවස්ථාව ලැබුණු අතර ම, සහභාගිවන්නන් වෙනත් ක්‍රියාකාරකම් මගින් තමන්ගේ ජීවනෝපාය සපුරාගන්නා ආකාරය බෙදාහදා ගැනීමටද ඉඩ සැලසුණි.

එක් වරකට සමගාමීව සාකච්ඡා වට තුනක් දක්වා පැවැත්වුණු අතර, සමස්ත සාකච්ඡා කාලය පැය දෙකහමාරක් දක්වා විය. යම් නිශ්චිත ක්ෂේත්‍රයක පර්යේෂණ සහ ප්‍රතිපත්ති බලපෑම් (advocacy) සම්බන්ධයෙන් තමන් සතු අත්දැකීම් පදනම් කරගනිමින්, එක් එක් කණ්ඩායමේ සාකච්ඡාව මෙහෙයවන්නා ලෙස කටයුතු කිරීම සඳහා එක් කණ්ඩායමකට එක් කොමසාරිස්වරයෙකු බැගින් අනුයුක්ත කරන ලදී.

ක්ෂේත්‍ර මට්ටමින් පැවැත්වුණු කණ්ඩායම් සාකච්ඡාවලින් අනතුරුව, සියලුම සහභාගිවන්නන් නැවතත් පොදු සැසිය (plenary) සඳහා එක් රැස් වූහ. එහි දී, එක් එක් කණ්ඩායමේ සාකච්ඡාව මෙහෙයවූ කොමසාරිස්වරයා විසින් තමන්ගේ කණ්ඩායමේ ප්‍රධාන සොයාගැනීම් ඉදිරිපත් කරන ලද අතර, එය අදාළ කණ්ඩායමේ තහවුරු කරගැනීමට මෙන්ම සෙසු පිරිසට අවශ්‍ය පැහැදිලි කිරීම් ලබාගැනීමටද උපකාරී විය.

**දත්ත සැකසීම (Data processing)**

ව්‍යාපෘතිය සඳහා බඳවා ගන්නා ලද පර්යේෂකයින් සහ සටහන්කරුවන් එක් එක් කණ්ඩායම් වෙත අනුයුක්ත කෙරුණු අතර, ඔවුහු සාකච්ඡාවන් සහ සහභාගිවන්නන්ගේ අදහස් දැක්වීම් ඉතා සවිස්තරාත්මකව සටහන් කර ගත්හ. එක් එක් ප්‍රාදේශීය සාකච්ඡා වට අවසානයේ දී, මෙහෙයවන්නන් (facilitators) විසින් භාවිත කරන ලද ප්‍රශ්නාවලි ආකෘතියට අනුකූලව, සාකච්ඡා අතරතුර තමන් ලියාගත් සටහන් පර්යේෂකයින් විසින් පරිගණකගත (typed) කරන ලදී.

අනතුරුව, ප්‍රධාන පර්යේෂකයා විසින් එම සටහන් සියල්ල එක් සැකිල්ලකට (matrix) ඇතුළත් කළ අතර, එමඟින් යම් නිශ්චිත ක්ෂේත්‍රයකට අදාළ සියලුම දත්ත පහසුවෙන් නිරීක්ෂණය කිරීමටත්, ඒ ඒ ප්‍රදේශවල ආහාර පද්ධතියේ විවිධ අවධීන් සම්බන්ධයෙන් ජනතාව ලැබූ අත්දැකීම් ග්‍රහණය කර ගැනීමටත් අවස්ථාව ලැබුණි. මීට අමතරව, විවිධ සහභාගිවන්නන්ගේ ප්‍රතිචාරයන්, ප්‍රධාන වශයෙන් නැවත නැවතත් මතු වූ පොදු තේමාවන්, විවිධ ප්‍රදේශ අතර පැවති සමානකම් සහ සුවිශේෂී සිදුවීම් ලෙස සංක්ෂිප්ත කරමින් ක්‍රමවත් කිරීමට මෙම ක්‍රියාවලිය උපකාරී විය.

මෙම වාර්තාව සම්පාදනය කිරීමේ දී ද සාකච්ඡා ගලාගිය ආකෘතිය ම අනුගමනය කරන ලද්දේ, සහභාගිවන්නන් ප්‍රායෝගික ව භාවිත කරන විකල්ප ක්‍රමවේදයන් ඔවුන්ට අදාළ ක්ෂේත්‍රයේ ආහාර පද්ධතියේ සියලුම අවධීන් හි දී විදහා දැක්වෙන බව තහවුරු කිරීම සඳහා ය. එබැවින්, සෑම පරිච්ඡේදයක් මඟින් ම ඔවුන් සතු විශේෂඥ දැනුම සහ අදාළ ක්ෂේත්‍රයන් හී ආහාර පද්ධතිය සම්බන්ධයෙන් ඔවුන් ඉදිරිපත් කළ නිර්දේශයන් ඉදිරිපත් කරනු ලබයි.



Jaffna
යාපනය
யாழ்ப்பாணம்
Kilinochchi
කිලිනොච්චිය
கிளிநொச்சி
Mullaitivu
මුලතිව්
முல்லைத்தீவு
Mannar
මන්නාරම
மன்னார்
Vavuniya
වවුනියාව
வவுனியா
N
W
E
S
Anuradhapura
අනුරාධපුරය
அனுராதபுரம்
Trincomalee
ත්‍රිකුණාමලය
திருகோணமலை
Puttalam
පුත්තලම
புத்தளம்
Polonnaruwa
පොළොන්නරුව
பொலன்னறுவை
Kurunegala
කුරුණෑගල
குருணாகல்
Matale
මාතලේ
மாத்தளை
Ampara
අම්පාර
அம்பாறை
Batticaloa
මඩකලපුව
மட்டக்களப்பு
Kandy
මහනුවර
கண்டி
Gampaha
ගම්පහ
கம்பஹா
Kegalle
කෑගල්ල
கேகாலை
Badulla
බදුල්ල
பதுளை
Colombo
කොළඹ
கொழும்பு
Nuwara Eliya
නුවරඑළිය
நுவரெலியா
Ratnapura
රත්නපුරය
இரத்தினபுரி
Kalutara
කළුතර
களுத்துறை
Monaragala
මොනරාගල
மொனராகலை
Galle
ගාල්ල
காலி
Hambantota
හම්බන්තොට
ஹம்பாந்தோட்டை
Matara
මාතර
மாத்தறை

## පර්යේෂණ සොයාගැනීම්

### 1. වී

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික භූ දර්ශනය සහ කතිකාව තුළ වී වගාවට තවදුරටත් ප්‍රධාන තැනක් හිමිව තිබේ. සන්ධිස්ථානීය සිදුවීම් දෙකකට පසුව එළඹි කාලසීමාව තුළ සහල් වගාව ශීඝ්‍රයෙන් වර්ධනය වී ඇති බව ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අස්වැන්න පිළිබඳ දත්ත පෙන්වා දෙයි (Watchdog, 2022). වියළි කලාපීය ඉඩම් වී වගාව සඳහා රටේ සෙසු ප්‍රදේශවලින් පැමිණි ගොවීන් වෙත නැවත බෙදා දීමට කටයුතු කළ මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය මෙහි පළමුවැන්න විය. දෙවැන්න වූයේ මුළු ජනගහනයම පෝෂණය කිරීම සඳහා වැඩි ඵලදායිතාවක් පොරොන්දු වෙමින්, රසායනික පොහොර සහ දෙමුහුන් වී ප්‍රභේද හඳුන්වා දුන් හරිත විප්ලවය රට වැළඳ ගැනීමයි. මෙම වෙනස්කම් මධ්‍යයේ වුව ද, සාම්ප්‍රදායික වී වගා ක්‍රම සහ දේශීය බීජ තවමත් භාවිතයේ පවතී.

පර්යේෂකයන් මහනුවර, දඹුල්ල, තංගල්ල, අම්පාර සහ මොනරාගල යන ස්ථාන 5 ක දී වී ගොවීන් 30 දෙනෙකු හමු වූ අතර, මෙම වගා ක්‍රමවල එකතුවක් ප්‍රායෝගිකව භාවිත කරන ගොවීන් ඔවුන් අතර දක්නට ලැබිණි.

නිෂ්පාදනයේ දී:

විකල්ප නිෂ්පාදන ක්‍රම අනුගමනය කරන සහභාගිවන්නන් අතුරින් බහුතරයක් විකිණීම සහ පරිභෝජනය සඳහා සාම්ප්‍රදායික වී ප්‍රභේද නිෂ්පාදනය කරති. අනෙක් අය වෙළෙඳපොළ සඳහා දෙමුහුන් වී නිෂ්පාදනය කරන අතර ම, තමන්ගේ පවුලේ පරිභෝජනයට සහ ප්‍රජාව තුළ විකිණීම සඳහා අවම වශයෙන් සාම්ප්‍රදායික වී අක්කරයක්වත් වගා කොට තිබිණි.

> මගේ නම පියශිකා වික්‍රමගේ, මම මිද්දෙනියෙන්. මම කළු හීනටි වී පාරිසරික ගොවිතැන් ක්‍රම භාවිත කරමින් වගා කරනවා. මගේ කෙතේ, මම කෘත්‍රිම රසායනික ද්‍රව්‍ය වෙනුවට කොම්පෝස්ට්, වර්මිකොම්පෝස්ට් සහ මාළු ටොනික් වැනි ජෛව පොහොර භාවිත කරනවා.
>
> නමුත් මෙම ගමන ආරම්භයේ දී පහසු වුනේ නැහැ. අපේ ප්‍රදේශයේ, ගොවිතැන් බොහෝ වසර ගණනාවක් තිස්සේ රසායනික පොහොර සහ කෘමිනාශක මත දැඩි ලෙස යැපෙන තත්ත්වයකට පත් ව තිබුණා. මම පාරිසරික ගොවිතැන් කරා යාමට තීරණය කළ විට, අප සාමාන්‍ය දෙයක් ලෙස පිළිගත් බොහෝ ක්‍රම ගැන ප්‍රශ්න කිරීමට සිදු වූ අතර, රසායනික පොහොර නොමැති ව ගොවිතැන් කළ නොහැකි කියා අවට අසල්වැසියන් සැක කළා. මටත් සමහර අවස්ථාවල බියක් සහ අවිනිශ්චිතතාවක් දැනුණා.
>
> එසේ වුව ද, අපේ පසේ, අපේ සෞඛ්‍යයේ සහ අපේ අනාගතයේ ආරක්ෂාව ඇති ව වගා කිරීමට මට අවශ්‍ය වුනා. ක්‍රමක්‍රමයෙන්, අත්දැකීම් සහ ඉගෙනීම තුළින්, ජෛව පාරිසරික ක්‍රමවල ශක්තිය මට තේරුම් ගැනීමට හැකි විය. කෙමෙන් පස සෞඛ්‍ය සම්පන්න වෙනවා මා දුටුවා එසේ ම කළු හීනටි වැනි සාම්ප්‍රදායික බීජ සැලකිල්ලෙන් හා ඉවසිලිවන්තකමින් වගා කළ හැකි ආකාරය මම දුටුවා.

බීජ සඳහා පස සහ පරිසර පද්ධතිය සකස් කිරීමට වෙහෙසක් දැරීමට සිදු වුව ද, දිගුකාලීන ව දේශීය සහල් නිෂ්පාදනයට වැය වන්නේ අවම පිරිවැයක් බව සියලුම ප්‍රදේශවල ගොවීන් එකඟ වූ කරුණක් විය. ණය පියවා ගැනීමට සහ ජීවත් වීම සඳහා මුදල් උපයා ගැනීමට බලාපොරොත්තුවෙන් සිටින අනෙකුත් බොහෝ ගොවීන්ට මෙය වගාවට පිවිසීමේ බාධකයක් ලෙස දැකගත හැකි විය. දේශීය සහල් වගා කිරීමේ දී පොහොර, පළිබෝධනාශක සහ යන්ත්‍ර සූත්‍ර වැනි අතිරේක යෙදවුම් සඳහා යන පිරිවැය අඩු වන බව පිළිගන්නා අතර ම, දේශීය වී වගාව තුළින් ඵලදායී අස්වැන්නක් ලබා ගැනීමට ගතවන කාලය ඔවුන්ගේ වත්මන් තත්ත්වය හමුවේ ඔවුන්ට දැරිය නොහැකි කාලයකි.

කාබනික හෝ කෘෂි-පාරිසරික ගොවිතැන සිදු කිරීම සඳහා බොහෝ දෙනෙක් තම නිවෙස්වල දී ම තමන්ට අවශ්‍ය පොහොර නිෂ්පාදනය කර ගනිමින් සිටියහ. මත්ස්‍ය සහ පළතුරු ටොනික්, සත්ව අපද්‍රව්‍ය සහ ගිනිසීරියා වැනි වනාන්තරයෙන් හමුවන දේශීය කොළ වර්ග භාවිත කිරීම වැනි ක්‍රමවේදයන් බහුල ව යොදා ගනු ලබන අතර, එමඟින් නිෂ්පාදන පිරිවැය අඩු මට්ටමක පවත්වා ගනී.

ඔවුන් පොදුවේ දක්වන ප්‍රධාන කනස්සල්ලක් වන්නේ ගොවියා තවදුරටත් ස්වාධීන නොවීමයි. මීට පෙර ඔවුන් සාම්ප්‍රදායික දැනුම සහ වසර ගණනාවක කෘෂිකාර්මික පළපුරුද්ද තුළින් 'මහපොළොව සහ එහි රටාවන්' හඳුනාගෙන සිටි අතර, ඒ අනුව ඔවුන්ට තම වගාවන් හැඩගස්වා ගත හැකි විය. එහෙත්, අද වන විට රජය සහ 'නිදහස් වෙළෙඳපොළ' විසින් සකස් කරන ලද රාමු සහ රෙගුලාසිවලට යටත් වීමට ඔවුන්ට සිදු ව තිබේ. වගාව සඳහා ජලය මුදා හරින්නේ කවදා ද, කුමන වර්ගයේ පොහොර කොපමණ ප්‍රමාණයක් භාවිත කළ යුතු ද යන්න නීති මගින් නියම කෙරේ. මෙම කොන්දේසි ගොවියාට දක්වන්නේ ඉතා අඩු සහයෝගයකි, ඒ වෙනුවට ඉන් සිදු වන්නේ වෙළෙඳ ව්‍යාපාරිකයන්ගේ සහ මහා පරිමාණ ආර්ථික ක්‍රියාකාරීන්ගේ සාර්ථකත්වය තහවුරු කිරීමයි.

සාම්ප්‍රදායික ගොවිතැන තුළ සෑම ගොවියෙකුම තම ඉඩමේ විවිධ බෝග වගා කළ අතර, එමගින් වසර පුරා ගොවි පවුලේ ආහාර සුරක්ෂිතතාව සහතික විය. අදාළ කාලවකවානුවලට අනුව බෝග වගා කළ අතර, වසර පුරා අඛණ්ඩ අස්වැන්නක් පැවතුණි. වාරිමාර්ග යෝජනා ක්‍රම මගින් නිර්මාණය කරන ලද නව කෘෂි ජනපදවල භෝග වගාව සීමා වී තිබේ. ගොවීන් පවසන්නේ ජනපද පිහිටුවීමට අවසර දෙන ලියකියවිලි සහ පසුව නිකුත් කරන ලද චක්‍රලේඛවල වගාවේ දී ඇතැම් බෝග සඳහා ප්‍රමුඛත්වය දිය යුතු බවට සඳහන් වන බවයි. මෙය සාමාන්‍යයෙන් සහල් සහ තවත් එක බෝග ප්‍රභේදයක් වන අතර, බොහෝ විට මිරිස්, බොම්බයි ලූණු, සෝයා හෝ කෙසෙල් විය හැකි ය. ඒ අනුව, මෙම යෝජනා ක්‍රමය සහ වත්මන් ආර්ථික ක්‍රමය වසර පුරා මහා පරිමාණ ඒක බෝග වගාවක් ඉල්ලා සිටියි. එබැවින් ගොවීන්ට වගා කළ හැක්කේ වෙළෙඳපොළ වෙතින් අපේක්ෂා කරන මෙම කාලීන භෝග පමණි. වසර පුරා සහ ගොවීන්ගේ ප්‍රයෝජනය සඳහා භාවිත කළ හැකි පොල්, අඹ, කොස් වැනි බහු වාර්ෂික භෝග සඳහා අවසර හිමි වන්නේ නැත.

**අගය එකතු කිරීම:**

ගොවීන් බීජ, පොහොර, සීසෑම, වැපිරීම සහ අස්වනු නෙළීම සඳහා විශාල මුදලක් වැය කරයි. මේවා බොහෝ විට ලබා ගන්නේ ණය මගින් වන අතර, එම පිරිවැය පියවා ගත යුත්තේ අස්වැන්නෙනි. ඒ අනුව, බොහෝ දෙනෙක් තම නිෂ්පාදන හැකි ඉක්මනින්, සාමාන්‍යයෙන් තෙත් වී ලෙස විකිණීමට බලාපොරොත්තු වෙති. වී කෙරීම සඳහා වන යන්ත්‍රවලට මුදල් වැය වන බව ගොවීන් පැවසූ අතර, එබැවින් පවතින තත්ත්වය තුළ ඔවුන්ට තම අස්වැන්න මහා පරිමාණ මෝල් හිමියන්ට විකිණීම පහසු ය. මෙම සමාගම් සහල් වෙළෙඳපොළ පාලනය කරන අතර, මිල ඉහළ නැංවීම සඳහා ධාන්‍ය තොග රැස්කර තබා ගනී. බහුතරයක් ගොවීන් තමන්ට වී විකුණන බව සහතික කර ගැනීමට අවශ්‍ය ප්‍රාග්ධනය සහ සම්පත් ද ඔවුන් සතුව පවතී. අස්වනු නෙලන කාලය තුළ මහා පරිමාණ මෝල් මගින් කපාගත් වී අස්වනු කුඹුරෙන් සෘජු ව ම ලබා ගැනීමට වාහන එවනු ලබයි. මේ හේතුවෙන් ගොවියාට ප්‍රවාහන පිරිවැයක් දැරීමට සිදු නොවන අතර ම, එය මහා පරිමාණ මෝල් හිමියන්ගේ වී රැස්කර තබා ගැනීම ද ඉහළ නංවන්නකි.

ඇතැම් ගොවි සංවිධාන වී මෝලක් මිල දී ගෙන පැවති අතර, අස්වනු නෙලා ගැනීමෙන් පසුව ලැබුණු වී වලින් සහල් සහ සහල් පිටි සකස් කර ගැනීමට ඔවුන්ට හැකි විය. එවිට සංගමයට හෝ එහි ගොවීන්ට සහල් ගබඩා කර තබා ගෙන, මිල යහපත් වන විට වෙළෙඳපොළට නිකුත් කළ හැකි විය. දැනට, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් ගොවි සංගම් සඳහා අඩු හවුල් පිරිවැයක් යටතේ එවැනි යන්ත්‍ර සූත්‍ර සපයනු ලබයි.

මන්නාරමේ නානාත්තන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මුල්ලිමොතායි හී, ගොවීන් එකතු වී ආහාර නිෂ්පාදනය සහ වෙළෙඳපොළ මත තම පාලනය තහවුරු කිරීම සඳහා මුල්ලිමොතායි ගොවි නිෂ්පාදක සාමූහිකය පිහිටුවා ගත්හ. වෙළෙන්දන්ට අඩු මිලට අමු වී අස්වැන්න පමණක් විකිණීම වෙනුවට, සාමූහිකය තම නිෂ්පාදන අගය-වර්ධිත නිෂ්පාදන බවට සැකසීම ආරම්භ කළේය.

ඔවුන්ගේ ප්‍රධාන මුලපිරීමෙන් එකක් වන්නේ උදෑසන ආහාරයක් හෝ කෙටි ආහාරයක් ලෙස භාවිත කරන පෝෂ්‍යදායී සෞඛ්‍ය මිශ්‍රණයක් වන "සත්තුම" නිෂ්පාදනය කිරීමයි. අමුද්‍රව්‍ය සියල්ල ම පාහේ ප්‍රජාව විසින් ම වගා කරනු ලබන අතර, එක් අමුද්‍රව්‍යයක් පමණක් බාහිරින් ලබා ගනී. ගොවීන් සාමූහික ව නිෂ්පාදනය පිරිසිදු කිරීම, බැද ගැනීම, කුඩු කිරීම, ඇසුරුම් කිරීම සහ වෙළෙඳාම් කිරීම සිදු කරති.

අම්පාරේ වී ගොවීන් තම තොගවලින් කොටසක් ප්‍රධාන වශයෙන් සමපෝෂ සහ අනෙකුත් පෝෂණීය මිශ්‍රණ නිපදවන කාන්තාවන් ප්‍රමුඛ කණ්ඩායම් වෙත ලබා දීමට කටයුතු කර තිබිණි.

**අලෙවිකරණය:**

සහල් යනු රට පුරා සිටින බොහෝ දෙනෙකුගේ ආහාර වේලෙහි ප්‍රධාන අංගයකි. මහා පරිමාණයෙන් වගා කරන දෙමුහුන් සහල් ප්‍රභේද සඳහා වැඩි ම ඉල්ලුමක් පවතී. සාම්ප්‍රදායික සහල් නිෂ්පාදනය කරන ගොවීන් පැවසුවේ එම ප්‍රභේද සඳහා විශාල, තිරසර වෙළෙඳපොළක් සොයා ගැනීමට ඔවුන් දැඩි උත්සාහයක නිරත බවයි. සාම්ප්‍රදායික සහල්වල ඉහළ පෝෂණ ගුණයක් අඩංගු වේ. දිගුකාලීන ව, මෙම සහල් - ඇතුළු අනෙකුත් දේශීය ආහාර බෝග - පරිභෝජනය කිරීමෙන් රෝගාබාධ වැළඳීමේ ප්‍රවණතාව අඩු කර ගත හැකි බව ගොවීහු විශ්වාස කරති. කෙසේ වෙතත්, මෙම සෞඛ්‍ය ප්‍රතිලාභ පිළිබඳ ව පොදු ජනතාව තුළ පුළුල් දැනුමක් නැත. දැනට, මහා පරිමාණ කෘෂි ව්‍යාපාරිකයන් දේශීය සහල් නිෂ්පාදනය කර ඒවා සුපිරි වෙළෙඳසැල්වල ඉහළ මිලකට අලෙවි කරමින් සිටී. එහි ප්‍රතිලාභ පිළිබඳ දැනුම ව්‍යාප්ත කිරීමෙන් වෙළෙඳපොළ වර්ධනය කර ගත හැකි අතර සුළු පරිමාණ නිෂ්පාදකයින්ට ද අවස්ථාව සැලසිය හැකි ය.

වෙළෙඳපොළ පාලනය කරනු ලබන්නේ මහා පරිමාණ මෝල් සමාගම් සහ වෙළෙඳ ව්‍යාපාරිකයන් විසිනි. සමහර විට, තනි ව්‍යාපාරිකයෙකුට සියලුම ප්‍රධාන ආර්ථික මධ්‍යස්ථාන මගින් අලෙවි නියෝජිත ආයතන පවත්වාගෙන යා හැකි ය. මෙම සමාගම් විසින් කෘත්‍රිම හිඟයක් නිර්මාණය කළ හැකි අතර, එසේ සිදු කළ අවස්ථාවන් ද පවතී. අස්වනු නෙලීමෙන් පසු ගොවීන්ට සහල් සඳහා ඉතා අඩු මුදලක් ගෙවා තිබිය දී ත්, ඔවුන්ගේ තොග අධික මිලකට අලෙවි කිරීමට මේ ඔස්සේ ඔවුන්ට අවස්ථාව පවතී. එබැවින් මෙම ව්‍යාපාරිකයන් වෙළෙඳපොළෙන් ප්‍රතිලාභ ලබන අතර ගොවීන් දිගින් දිගට ම ණය බරින් පීඩා විඳිති.

**සම්පත්:**

<u>ඉඩම්</u>

රැස්වීම්වලට සහභාගී වූවන් අතර 'අඳ ගොවි' ක්‍රමය බහුල ව ක්‍රියාත්මක වේ. මෙහි දී ගොවියෙකු මහා පරිමාණ ඉඩම් හිමියෙකුගෙන් බදු ගත් ඉඩමක වගා කරනු ලබයි. ඉන්පසු ගොවියා නිෂ්පාදනයෙන් කොටසක් ඉඩම් හිමියාට ලබා දීමට බැඳී සිටී. ඉඩමේ වගා කරන්නේ කුමක් ද යන්න තීරණය කරනුයේ ගොවියා නොව ඉඩම් හිමියා විසිනි.

ඉඩම් පිළිබඳ ගැටලු ශ්‍රී ලංකාවේ සිදු වූ, විශේෂයෙන් ම යුද්ධය අවසන් වීමෙන් පසු ශීඝ්‍රයෙන් සිදු වූ මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති තුළ ද දැකගත හැකි ය. බොහෝ විට, මෙම ජල විදුලි සහ අධිවේගී මාර්ග ව්‍යාපෘති ඇතැම් ප්‍රදේශ සංවර්ධනය කිරීම පිණිස සිදු කරනු ලැබුවේ, ප්‍රදේශයේ ගොවිතැනට සිදුවන පාරිසරික හා ජීවනෝපාය බලපෑම පිළිබඳ පූර්ණ තක්සේරුවකින් තොරව ය.

මධ්‍යම පළාතේ ගොවීන් පෙන්වා දුන්නේ මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතිය වර්ෂාපතන රටාවන්ට බලපා ඇති අතර ඔවුන්ගේ වගාවන් අඩාල කර ඇති බවයි. දකුණේ, දක්ෂිණ අධිවේගී මාර්ගය වී කුඹුරු අක්කර ගණනාවක් මැදින් ගමන් කළ අතර අලි මංකඩ අවහිර වීමෙන් වගා බිම්වල සත්ව තර්ජන ඉහළ යාමට මත්තල ගුවන් තොටුපළ හේතු විය.

<u>ජලය</u>

ශ්‍රී ලංකාවේ වී වගාව පොදු ක්‍රමවේද දෙකක් යටතේ සිදු කෙරේ. වසර ගණනාවක් මුළුල්ලේ ඍතුමය ලක්ෂණ වෙනස් වී ඇති ආකාරය තම වගාව සඳහා වැසි ජලය මත යැපෙන ගොවීන් පෙන්වා දෙන ලදී. අද වන විට බලාපොරොත්තු වූවාට වඩා කලින් හෝ පසුව වැසි ලැබෙන අතර, ගොවීන් පෙන්වා දුන්නේ මෙහි ප්‍රතිඵලයක් ලෙස පසුගිය කන්න දෙකේදී බරපතළ බෝග හානි සිදු වී ඇති බවයි.

මහවැලි හෝ ගල්ඔය ව්‍යාපෘති වැනි වාරිමාර්ග යෝජනා ක්‍රම තුළ තම කුඹුරු පිහිටා ඇති ගොවීන් වෙනත් ආකාරයක කාලීන ගැටලුවක් පෙන්වා දෙයි. ඇළ මාර්ගවලට ජලය මුදා හැරීමේ තීරණය කන්න රැස්වීම්වල දී ගනු ලබන්නේ වාරිමාර්ග අමාත්‍යාංශයේ ප්‍රධානත්වයෙන් මහවැලි සංවර්ධන අධිකාරිය, ලංකා විදුලිබල මණ්ඩලය, වනජීවී අමාත්‍යාංශය සහ සංචාරක අමාත්‍යාංශයෙන් සමන්විත මධ්‍යම මණ්ඩලයක් විසිනි.

මෙම රැස්වීමට ගොවි සංවිධාන සහභාගී වන බව සහතික කරන ව්‍යුහයක් දැනටමත් පවතී. කෙසේ වුව ද, සම්මුඛ සාකච්ඡාවලට සහභාගී වූ ගොවීන් පෙන්වා දුන්නේ බොහෝ අවස්ථාවල දී දේශපාලන පක්ෂ, අමාත්‍යාංශ හෝ වී මෝල් හිමියන්ට සමීප සබඳතා ඇති සංගම් බොහෝ විට මෙම රැස්වීම් පාලනය කරන බවයි. එබැවින් එකී සංගම්වල 'හඬ' ප්‍රදේශයේ සියලුම ගොවීන් නියෝජනය නොකරන අතර ම අදාළ වාරි යෝජනා ක්‍රමයට අයත් ගොවීන් නියෝජනය කරන්නේ ද ඉතා අවම වශයෙනි.

තව ද, ගොවීහු පෙන්වා දුන් පරිදි ජලය මුදා හැරීමේ දී ප්‍රථමයෙන් විදුලි උත්පාදනයටත්, දෙවනු ව සංචාරක ව්‍යාපාරයටත්, තෙවනු ව පමණක් කෘෂිකර්මාන්තයටත් ප්‍රමුඛත්වය ලබා දෙයි. මෙම වැඩපිළිවෙළ තමන්ගේ නිෂ්පාදනයට සහ ඒ මගින් මුළු රටේම ආහාර ලබා ගැනීමේ හැකියාවට තර්ජනයක් බව ගොවීන්ගේ අදහසයි. මේ සම්බන්ධ අවසාන තීරණය වාරිමාර්ග දෙපාර්තමේන්තුව සතුවන අතර, මෙම තීරණ ගැනීමේ ක්‍රියාවලියට තමන්ගේ හඬ වඩාත් අර්ථවත් ලෙස නියෝජනය විය යුතු බව ඔවුහු යෝජනා කරති.

යන්ත්‍ර සූත්‍ර

යන්ත්‍ර සූත්‍ර භාවිතය විශේෂයෙන් ම තැනිතලා ඉඩම් වගා කිරීමේ දී බහුල ව දක්නට ලැබේ. මධ්‍යම පළාතේ ගොවීන් කඳුකරයේ හෙල්මළු ක්‍රමයට වී වගා කරන අතර එහි දී යන්ත්‍ර සූත්‍ර භාවිත කළ නොහැක. යන්ත්‍ර සූත්‍ර භාවිත කරන ගොවීන් පෙන්වා දෙන්නේ බොහෝ මාදිලි විදේශයන්ගෙන් ගෙන්වන ඒවා වන අතර, එමගින් දේශීය නිෂ්පාදන කර්මාන්තයකින් ඉතිරි කර ගත හැකි ව තිබූ මුදල් පිටතට ගලා යන බවයි. මෙසේ ප්‍රවර්ධනය කළ යුතු දේශීය තාක්ෂණය සඳහා උදාහරණයක් ලෙස ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවෙකු වන ජේ. විජේවර්ධන මහතාගේ අත් ට්‍රැක්ටරය ඔවුහු පෙන්වා දෙති. මෙම යන්ත්‍රය සහ ගොවිතැනට අවශ්‍ය අදාළ අනෙකුත් උපකරණ නිෂ්පාදනය කළ හැකි ක්‍රියාවලියක් නිර්මාණය කිරීමෙන් ශ්‍රී ලංකාවෙන් මුදල් පිටතට ගලා යාම වළක්වා ගත හැකි ය. මීට අමතර ව, එමගින් නම්‍යශීලී ලෙස උපකරණ අලුත්වැඩියා කිරීමට සහ ප්‍රතිස්ථාපනය කිරීමට ද හැකි ය.

උපකරණ බොහෝ විට ප්‍රදේශයේ පොහොසත් වෙළෙඳුන් හෝ පුද්ගලයන් සතු වන අතර, ඔවුන් කන්නය උදාවන විට සී සෑම හෝ අස්වනු නෙලීම සඳහා ඒවා කුලියට දෙයි. මෙය ගොවියෙකුගේ නිෂ්පාදන පිරිවැය තවත් ඉහළ නන්වන්නකි. අස්වැන්න අඩු වී ඔවුන්ට ලාභදායී නොවුව ද, උපකරණය සඳහා ගෙවන මිල වෙනස් වන්නේ නැත.

බීජ

සාම්ප්‍රදායික බීජ ප්‍රභේද සමග කෘෂි-පාරිසරික ගොවිතැන විශාල වශයෙන් හෝ සම්පූර්ණයෙන් ම පාහේ සිදු කළ ගොවීන්, එක් එක් අස්වැන්න සමග බීජ සුරැකීමට සහ ගබඩා කිරීමට තනි තනිව උත්සාහයන් ගෙන තිබිණි. රාජාංගනයේ ගොවි සමූහයක් විසින් දේශීය බීජ ප්‍රභේද 80ක් පමණ ගබඩා කර පවතී. තව ද, දඹුල්ලේ එක් ගොවියෙකු සතු ව ප්‍රභේද 30 ක එකතුවක් විය. ඔවුන් මෙම බීජ තම ප්‍රජාවේ මෙන් ම අනෙකුත් ප්‍රදේශවල ගොවීන් සමග බෙදා ගන්නා අතර, ඔවුන් සමග සම්බන්ධ වීමට හැකි වූ සහ දේශීය බීජ අත්හදා බැලීමට උනන්දුවක් දැක් වූ ගොවීන් සමග ද බෙදා ගෙන තිබිණි.

මූල්‍ය

දශක ගණනාවක් තිස්සේ ශ්‍රී ලාංකික ගොවීන් සාධාරණ මූල්‍ය විසඳුම් නොමැතිකම හේතුවෙන් පීඩා විඳිති. දේශීය බැංකුවලට බොහෝ ගොවීන් සතු ව නොමැති, නැතහොත් හදිසි ණයක් අවශ්‍ය වූ විට ඉක්මනින් ඉදිරිපත් කළ නොහැකි පුළුල් ලියකියවිලි, ඇපකරුවන් සහ ඇප තැන්පතු අවශ්‍ය වේ. මෙයින් ඔවුන්ට අවම ලියකියවිලි සහිතව, නමුත් ඉහළ පොලියකට ඉක්මනින් ණය ලබා දෙන සමාගම්වලින් ණය ගැනීමට සිදුවේ. සිදුවෙමින් පවතින දේශගුණික විපර්යාස කෘෂිකර්මාන්තයේ අස්ථාවරත්වය ඉහළ නංවා ඇති අතර, ඔවුන්ගේ අවදානම තව දුරටත් උත්සන්න කොට තිබේ.

ගොවීන් සූරාකන ක්ෂුද්‍ර මූල්‍ය ණයවලට එරෙහි මෑතකාලීනම අරගලයට 2020 වසරේ දී ගොවීන් අවතීර්ණ විය. ගොවි සංවිධාන සෑම විටම තම ඉතුරුම් වර්ධනය කර ගනිමින් සහ තම සාමාජිකයින්ට ණය ලබා දෙමින් ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් වැනි ආයතනවලින් බැහැර වීමට උත්සාහ කොට තිබේ.

ඔවුන් මෙය විවිධ ක්‍රම කිහිපයකින් සිදු කරයි. පළමුවැන්න, සාමාජික දායකත්ව ගාස්තු මඟිනි. කාලයත් සමග එකතු වන මුදලින් සංගමයට තම සාමාජිකයින්ට අඩු පොලී අනුපාතයක් යටතේ කුඩා ණය ලබා දීමට හැකි වන අතර, ඒවා අස්වැන්න නෙලීමෙන් පසු ගෙවිය හැකි ය. මහියංගණය, රාජාංගණය සහ සූරියවැව යන ප්‍රදේශවල සංගම් මෙම ක්‍රමය ක්‍රියාත්මක කළ ගොවි සංගම් අතර විය. මේවා මඟින් සමාගම්වලට ලබා දිය හැකි ආකාරයේ මහා පරිමාණ ණය ලබා දීමට නොහැකි වුව ද, අවශ්‍යතාව ඇති සාමාජිකයින්ට සහයෝගය දැක්වීමට ඒවාට හැකියාව පවතී.

තවත් ක්‍රමයක් නම් තම සාමාජිකයන්ගේ නිෂ්පාදන සතිපතා අලෙවි කිරීමයි, එහි දී සියලුම සාමාජිකයින් තම භාණ්ඩ විකිණීමෙන් පසු හවුල් ලාභයක් රඳවා ගනු ලබයි. මෙම සමිති මූල්‍ය ගනුදෙනුවකින් ඔබ්බට ගිය

නිර්මාණශීලී ක්‍රම මගින් සාමාජිකයින්ට සහය විය හැකි ක්‍රමවේදයක් සොයා ගෙන තිබිණි. පොලොන්නරුවේ සංගමයක් විසින් මාරුවෙන් මාරුවට ලබා දෙන භාණ්ඩ කූඩයක් සකස් කර තිබූ අතර, සාමාජිකයන් තම නිවෙස්වල ඇති දේ වලින් ඊට දායක විය; සම්පූර්ණ කූඩය සෑම මසකම එක් සාමාජිකයෙකුට බැගින් හිමිවිය.

හිඟුරක්ගොඩ හී චන්දනපොකුණ ගම්මානය, ක්ෂුද්‍ර මූල්‍ය ණය බරින් දැඩි ලෙස පීඩාවට පත් ව සිටියේ ය. 2018 දී, පීඩාවට පත් කාන්තාවන් පිරිසක් ණය චක්‍රවලින් මිදීමට සහ තම ග්‍රාමීය ආර්ථිකය ගොඩනැගීමට චන්දනපොකුණ විමුක්ති ගැමි ගොවි කාන්තා සංවිධානය පිහිටුවා ගැනීමට එකතු වූහ. මෙම සාමූහිකයට අද ක්‍රියාශීලී සාමාජිකයින් 30 දෙනෙකු සිටින අතර, නිතිපතා සහභාගී වන තවත් 20 දෙනෙකු සිටිති. සාමාජිකයින් මාසික ගාස්තුවක් ලෙස රු. 100 ක් සහ සෑම අස්වනු කාලයක දී ම රු. 1,000 කින් දායක වෙති. මෙම එකතු කළ මුදල මගින්, කණ්ඩායම විකල්ප ආර්ථික ක්‍රියාකාරකම් රාශියක් ගොඩනගා ගෙන ඇත.

එකක් නම් අව ම පොලී අනුපාතයක් වන සාමාන්‍ය වාර්ෂික පොලිය 6% කින් ණය ලබා දෙන ප්‍රජා ණය යෝජනා ක්‍රමයයි. තවත් මුලපිරීමක් ක්‍රියාත්මක වන්නේ සෑම මසකම 25 වැනිදා පවත්වනු ලබන ඔවුන්ගේ මාසික රැස්වීමේ දී ය. සෑම සාමාජිකයෙකුම තම අස්වැන්නෙන් කොටසක්, දැව හැඳි වැනි අතින් සාදන ලද භාණ්ඩ, හෝ කිරිපිටි සහ සීනි වැනි දෛනික අවශ්‍යතා ද්‍රව්‍ය ලෙස ඔවුනට හැකි ඕනෑ ම දෙයක් රැගෙන එති. මෙම දායකත්වයන් සලාක පැකේජයක් එකතු කෙරෙන අතර, එය එක් සාමාජිකයෙකුට තෑග්ගක් ලෙස ලබා දෙනු ලැබේ. මෙම ද්‍රව්‍යවල මුළු අගය සාමාන්‍යයෙන් රු. 16,000 ක් පමණ වන අතර, සෑම සාමාජිකයෙකුම සීට්ටු ක්‍රමයක් මගින් මෙම සලාකය ලැබේ.

**ගබඩා කිරීම/සංරක්ෂණයː**

හිඟුරක්ගොඩ ඇතැම් ගොවීන් පැවසුවේ අස්වැන්න ලෙස නෙලාගත් වී තම නිවෙස්වල ගබඩා කර තබා ගැනීමට තමන්ට හැකි වූ බවත්, මුදල් අවශ්‍ය වූ විට ඒවා මුදා හරින බවත් ය. මොනරාගල අනෙකුත් ගොවීන් පැවසුවේ තමන් අධික ලෙස වනාන්තර බහුල ප්‍රදේශවල ජීවත් වූ බැවින් සහ වී ආහාරයට ගැනීම සඳහා අලි ඇතුන් නිවසට පහර දෙන බැවින් තම නිවෙස්වල මේ ආකාරයෙන් වී ගබඩා කළ නොහැකි බවයි.

එය වී විකිණීමේ ක්‍රියාවලිය ද මධ්‍යගත කරනු ඇති බැවින් සියලුම ස්ථානවල, සමුපකාර ගබඩා ආකෘතියක් යෝජනා කරන ලදී. තනි ගොවි සමිතියක මට්ටමින් හෝ ප්‍රදේශයක් තුළ ගොවි සමිති සාමූහිකයක් ලෙස සමුපකාර ගබඩා කිරීමේ ක්‍රියාවලිය ප්‍රධාන ප්‍රවාහය බවට පත් කර ගැනීමෙන් ගොවීන්ට ඔවුන්ගේ වී තොග කෙරෙහි වැඩි පාලනයක් ලබා ගත හැකි වනු ඇත.

**ආයතනː**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ ගොවිජන සේවා දෙපාර්තමේන්තුව ගොවීන්ගේ අවශ්‍යතාවලට ප්‍රතිචාර දැක්වීම සඳහා ප්‍රමුඛතම ආයතන ලෙස ස්ථාපනය කොට තිබේ. කෙසේ වුව ද, එම කාර්යාල තුළ ධාරිතාව ගොඩනැගීමේ සහ ප්‍රමුඛතා මාරු කිරීමේ අවශ්‍යතාවක් පවතින බව සම්මුඛ සාකච්ඡාවට භාජනය වූ ගොවීන්ගේ විශ්වාසය විය. සාම්ප්‍රදායික බීජ වගා කිරීම සඳහා කෘෂි-පාරිසරික ක්‍රම භාවිත කිරීම පිළිබඳ ඉතා අඩු හෝ කිසිඳු දැනුමක් නොමැති ව, රසායනික පොහොර සහ දෙමුහුන් බීජ භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා පමණක් කාර්යමණ්ඩලය පුහුණු කොට තිබේ. සහභාගිවන්නන් මේ සම්බන්ධයෙන් පුළුල් දැනුවත් කිරීම් ගොඩනැගීමට යෝජනා කළ අතර, එය කාබනික, දේශීය ආහාර සඳහා වෙළෙඳපොළ වර්ධනය කිරීමට ද උපකාරී වනු ඇත.

කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා ළඟා නොවන ඇතැම් ස්ථාන ද විය. තමන්ගේ ප්‍රදේශයට අඩු අවධානයක් යොමු වී ඇති බව ගොවීන්ගේ අදහස වූ අතර නිලධාරියා නිතිපතා එහි පැමිණියේ නැත.

සැසිවාරයට සහභාගී වූ ගොවීන් දෙමුහුන් සහ සාම්ප්‍රදායික සහල් ප්‍රභේද දෙකම වගා කළහ. පළමුවැන්න සඳහා, ඔවුන් කෘෂිකර්ම දෙපාර්තමේන්තු මධ්‍යස්ථාන වලින් සහ පෞද්ගලික සමාගම්වලින් දෙමුහුන් බීජ මිල දී ගෙන තිබිණි. රජයේ බීජ ගොවිපොළවල් තිබිය යුතු ධාරිතාවෙන් ක්‍රියාත්මක නොවන බව බොහෝ දෙනෙක් පෙන්වා දුන්හ. රජයේ සහ පෞද්ගලික සමාගම්වල බීජ බොහෝ විට දෙමුහුන් ප්‍රභේද වූ අතර ඒවා නිසි ලෙස වර්ධනය වීමට රසායනික පොහොර අවශ්‍ය විය. මේ ආකාරයෙන්, හරිත විප්ලවයේ සිට

දේශීය බීජ ලබා ගැනීමේ හැකියාව ක්‍රමයෙන් නැති වී ගොස් තිබේ. ගොවීන්ට සාම්ප්‍රදායික සහල් ප්‍රභේද වගා කිරීමට අවශ්‍ය වුව ද, ඒවා පහසුවෙන් ලබා ගැනීමට නොමැති බැවින් ඔවුන්ට එසේ කිරීමට නොහැකිව තිබිණි.

**ශ්‍රමය:**

වී වගාවේ දී ශ්‍රමය විවිධ ස්වරූප ගනී. ඇතැම් ගොවීන් පැවසුවේ පිරිවැය හේතුවෙන් කුලී ශ්‍රමයෙන් බැහැර වී, කුඹුරුවල වැඩ කිරීමට තමන්ට තම පවුල්වලින් සහය ලැබුණු බවයි. කුඩා ප්‍රදේශවල, තම කුඹුරේ වැඩ අවසන් කළ ගොවීහු හවුල් වැඩ ක්‍රමයක් යටතේ තම අසල්වැසියාගේ හෝ සංගම් සාමාජිකයෙකුගේ කුඹුරුවල වැඩ කිරීමට යති.

පවතින ප්‍රවණතාවක් වූයේ බාල පරම්පරාව නාගරික ප්‍රදේශවලට සංක්‍රමණය වීමත් සමඟ, බොහෝ විට ගොවියාට සියලු වගා කටයුතු තනිවම කිරීමට සිදු වීමයි. තරුණයින් වෙනත් තැන්වල රැකියා සොයන බැවින් මෙය ගොවීන් මූලික කරගත් වගාවේ අනාගතය පිළිබඳ ව ප්‍රශ්න මතු කරයි.

මෙම ගොවීන්ගෙන් බහුතරයක් කෘෂි පාරිසරික ක්‍රම මඟින් තම වී වගා කරගෙන ගිය බැවින්, මහා පරිමාණ රසායනික පාදක වගාවට වඩා අඩු ශ්‍රමයක් සහ අවධානයක් ඒ සඳහා අවශ්‍ය වන බව ඔවුන්ගේ අදහස විය. මෙම ක්‍රමයට මාරු වීම, කුඩා ආකාරයකින් හෝ 'මිනිසුන් නැවත භූමිය කරා' රැගෙන ආ හැකි ක්‍රමයක් විය හැකි බව ඔවුන්ගේ අදහස විය. රසායනික ද්‍රව්‍ය බහුලව භාවිත වන වගාවන් හී සේවකයින් ජලය සහ පස හේතුවෙන් රෝගාතුර වීම කෙරෙහි නැඹුරු වූ අතර, මෙම ක්‍රමය කෙනෙකුගේ සෞඛ්‍යයට අවදානමක් නොවන බව ඒ අනුව තහවුරු විය.

**පරිභෝජනය:**

මහා පරිමාණයෙන් හෝ මධ්‍ය පරිමාණයෙන් සහල් වගා කරන ගොවීන් තම පවුලේ පරිභෝජනය සඳහා එයින් කොටසක් තබා ගන්නා බව පෙන්වා දුන්හ. වාරිමාර්ග යෝජනා ක්‍රමයට අයත් ඉඩම්වල, ගොවීන් සහ ඔවුන්ගේ පවුල් වී වගා නොකරන තමන්ගේ 'ගොඩ' ඉඩම්වල එළවළු සහ අනෙකුත් ආහාර බෝග වගා කරති. අනෙකුත් පුද්ගලයන් ද තම ගෙවතුවල එළවළු සහ පළා වර්ග සීමිත මට්ටමින් වගා කරන අතර, මෙයින් ඔවුන්ට තමන්ගේ ම ඉඩමේ නිෂ්පාදනවලින් පමණක් පවුල සඳහා සමබර ආහාර වේලක් සහතික කර ගැනීමේ අවස්ථාව පවතී. ගෘහස්ථ පරිභෝජනය සඳහා අවශ්‍ය නොවන ඕනෑම ප්‍රමාණයක් අතිරේක ආදායමක් සඳහා අලෙවි කරනු ලබයි. ඔවුන් තම මුදලින් වැඩි ම කොටසක් වැය කරනුයේ මස් සහ බිත්තර වැනි ප්‍රෝටීන සඳහා ය.

සහල් පරිභෝජනය සම්බන්ධයෙන් ගත් කළ, තම අස්වැන්න සම්පූර්ණයෙන් ම මහා පරිමාණ මෝල් හිමියෙකුට විකුණා සහල් නැවත කඩවලට පැමිණි පසු ඒවා මිල දී ගන්නා ගොවීන් සිටිති. අනෙකුත් ගොවීන්ට කුඩා ප්‍රජා මට්ටමේ හෝ ස්වාධීන වී මෝල් සඳහා ප්‍රවේශය තිබිය හැකි ය. මෙම අවස්ථාවල දී, ඔවුන් ඉතිරි කොටස වෙළෙඳපොළට යැවීමට පෙර සහල් ප්‍රමාණයෙන් කොටසක් තම පවුල සඳහා තබා ගනී.

## 2. ධීවර කර්මාන්තය

ශ්‍රී ලංකාව ජාතික ආහාර සුරක්ෂිතතාව, පෝෂණය සහ ග්‍රාමීය ජීවනෝපාය සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන පොහොසත් ජලජ සම්පත් සතු රටකි. එය දළ වශයෙන් කිලෝමීටර 1,785 ක් දිග වෙරළ තීරයකින් සහ වර්ග කිලෝමීටර 517,000 ක පමණ අනන්‍ය ආර්ථික කලාපයකින් (EEZ) සමන්විත වේ. මීට අමතර ව, ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර මිරිදිය සහ කිවුල් ජල පද්ධති මඟින් හෙක්ටයාර 420,000 කට ආසන්න ප්‍රමාණයක් ආවරණය කරයි. මෙම විවිධ ජලජ පරිසරයන් පුළුල් පරාසයක ධීවර ක්‍රම සඳහා දායක වේ.

කොම්සම තංගල්ල, යාපනය, මන්නාරම, මඩකලපුව සහ අම්පාර යන ස්ථාන 5 ක දී මුහුදු සහ කලපු ප්‍රදේශවල ධීවර කර්මාන්තයේ යෙදෙන ප්‍රජාවන් හමු විය

**නිෂ්පාදනය:**

සියලුම දිස්ත්‍රික්කවල, ධීවර කර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය ලෙස පවතින අතර, ගෙවතු වගාව, කුඩා පරිමාණ ආහාර සැකසීම, සත්ව පාලනය සහ කාලීන කුලී ශ්‍රමය මඟින් එය අතිරේක ව ශක්තිමත් කරයි.

බහුදින බෝට්ටු, එක්දින බෝට්ටු, කුඩා FRP යාත්‍රා සහ අතින් දැල් දැමීමේ ශිල්පීය ක්‍රම භාවිතයෙන් සිදු කෙරෙන වෙරළාසන්න සහ කලපු ධීවර කර්මාන්තය මත ප්‍රජාවන් සිය ප්‍රධාන ජීවිකාව සරි කර ගනී. සාම්ප්‍රදායික ක්‍රම අනුගමනය කරන සුළු පරිමාණ ධීවර කර්මාන්තය, දේශීය ආහාර පද්ධති සහ ජීවනෝපාය පිළිවෙත් පවත්වාගෙන යාමේදී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි.

බොහෝ ප්‍රදේශවල, කාලීන අවිනිශ්චිතතාවන්ට මුහුණ දීම සඳහා ධීවර කර්මාන්තය කෘෂිකර්මාන්තය සමඟ ඒකාබද්ධ කොට තිබේ.

මෙසේ අල්ලනු ලබන විශේෂ අතර ඉස්සන්, දැල්ලන්, කකුළුවන්, සාවාලෙයි, සුරාවුන්, තොණ්ඩන්, කීරි, කටා, වන්නු සහ විවිධ කලපු විශේෂ ඇතුළත් වේ. කාලීන රිද්මයන් නිෂ්පාදනය දැඩි ලෙස හැඩගස්වන අතර, මාස හයක හොඳ ආදායමකින් වසර පුරා නිවාස නඩත්තු කළ හැකි බව ධීවරයෝ අවධාරණය කරති. දිස්ත්‍රික්ක පුරා සිටින ධීවරයන්ගේ අදහසක් වූයේ සාම්ප්‍රදායික ධීවර කන්නවලට බාධාවක් සිදු ව ඇති බවයි, වෙනස් වන වැසි සහ සුළං රටාවන් මඟින් මසුන් ලබා ගැනීමේ හුරුපුරුදු කාලසීමාව ඒ අනුව වෙනස් වී තිබේ.

ඇතැම් ප්‍රජාවන් රසායනික ද්‍රව්‍යවලින් තොර සහ තිරසර ධීවර ක්‍රම අනුගමනය කිරීමට උනන්දුවක් දැක් වූ නමුත් ඒ සඳහා අවශ්‍ය තාක්ෂණය සහ පුහුණුව නොපවතී.

**අගය එකතු කිරීම:**

අගය එකතු කිරීම ගෘහස්ත මට්ටමින් හෝ ප්‍රජා මට්ටමින් ප්‍රධාන වශයෙන් සිදු කරනු ලබන අතර, එහිදී කාන්තාවන් ප්‍රධාන භූමිකාවක් ඉටු කරයි. ක්‍රියාකාරකම් අතර මසුන් වේලීම සහ ලුණු දැමීම (කරවල), අච්චාරු සැකසීම, ඇඹුල්තියල්, ජාඩි, පැපිකෝ සහ මාළු පේස්ට් ඇතුළත් වේ. මේවා ගෘහස්ථ පරිභෝජනය සඳහා භාවිත කරන අතර නැවුම් මසුන් අලෙවි කරන ස්ථානවලට ආසන්න වෙළෙඳපොළේ ද අලෙවි කරනු ලැබේ.

මෙම ස්ථානවලින් මසුන් මිලදී ගන්නා නමුත් ඒවා ටින් මාළු නිෂ්පාදනය කරන කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තශාලා වෙත රැගෙන යනු ලබයි. මෙවැනි කර්මාන්තශාලා තමන්ට සමීපව පිහිටුවා තිබුනේ නම්, එමඟින් රැකියා උත්පාදනය වන අතර ප්‍රදේශයේ ආර්ථිකය ශක්තිමත් වන බව ධීවර සංගම්වල අදහස විය.

සමහර ප්‍රදේශවල මත්ස්‍ය පාදක පොහොර, රසකාරක කැට, ඉස්සන් සහ දැල්ලන්ගෙන් සාදන ලද කෙටි ආහාර සහ සැකසූ මුහුදු පැලෑටි/මුහුදු නෙළුම් වැනි නව නිෂ්පාදන සඳහා ඇති හැකියාව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, අගය එකතු කිරීම ප්‍රධාන බාධාවලට මුහුණ දෙයි: පුහුණුව නොමැතිකම, යන්ත්‍ර සූත්‍ර සඳහා අවම ප්‍රවේශය, අසමාන ගුණාත්මක පාලනය සහ බාල ගණයේ මසුන් මත යැපීම, ඊට හේතු වී තිබේ.

විදේශීය සහ දේශීය ප්‍රභේද මිශ්‍ර කරන ඉස්සන් ගොවිපළවල් වෙළෙඳපොළ විකෘතිතා ඇති කරන අතර කුඩා ධීවරයින්ට අසාධාරණ තරඟකාරිත්වයක් ඇති කරනු ලබයි.

**අලෙවිකරණය:**

සෑම දිස්ත්‍රික්කයකම, මසුන් මිල දී ගැනීම සහ මිල නියම කිරීම පාලනය කරන්නේ අතරමැදියන් සහ පෞද්ගලික ඒකාධිකාරයන් විසිනි. ගබඩා පහසුකම් නොමැතිකම හේතුවෙන් ධීවරයින් බොහෝ විට තම අස්වැන්න වහා ම විකුණා දමන අතර ඒ සඳහා හිමි වනුයේ ඉතා අඩු මිලකි. මෙයින් කෘෂිකාර්මික කර්මාන්තවල පවතින තත්ත්වය ද පිළිබිඹු වේ.

අතරමැදියන් බොහෝ විට ශීතකරණ සහිත වෑන් රථ සමඟ කෙලින්ම වරායට පැමිණෙන බැවින් ධීවරයින්ට ප්‍රවාහනය සඳහා වියදම් කිරීමට සිදු වන්නේ නැත. කෙසේ වුවද, ඔවුන් ඉතා අඩු මිලට මසුන් මිල දී ගෙන පෞද්ගලික වෙළෙඳුන් විසින් නියම කරන ලද සැලකිය යුතු ඉහළ මිල ගණන් යටතේ ඒවා අලෙවි කරනු ලබයි. ඒ අනුව, අස්වැන්නෙන් ලැබෙන සැබෑ ලාභය ධීවරයන් වෙත පැමිණෙන්නේ නැත.

ශ්‍රී ලංකා වෙළෙඳපොළ තුළ ආනයනික මසුන්, විශේෂයෙන්ම හාල්මැස්සන්, ප්‍රමාණාත්මකව දේශීය නිෂ්පාදකයින්ට බලපෑමක් ඇති කරන අතර, ඔවුන්ට කොපමණ ප්‍රමාණයක් අලෙවි කිරීමට සහ උපයා ගැනීමට හැකි ද යන්න කෙරෙහි එතුළින් බලපෑම් එල්ල වේ.

ඇතැම් ප්‍රජාවන් ප්‍රජාව විසින් පවත්වාගෙන යනු ලබන වෙන්දේසි, නියාමනය කරන ලද මිල ක්‍රම හෝ රජය විසින් පහසුකම් සපයන වෙළෙඳපොළවල් නිර්දේශ කළහ. යාපනයෙන් වියළි මසුන් සීමිත ලෙස අපනයනය කිරීම සඳහා පවුල් ජාලයන් භාවිත කරනු ලබයි.

යාපනය කරයිනාගාර් හි අම්බල් ධීවර සමුපකාර සමිතිය, සෑම උදෑසනකම මාළු වෙන්දේසියක් පවත්වයි. කුඩා පරිමාණ ධීවරයින්ට දිගු කලක් තිස්සේ අවාසිදායක වී ඇති, අතරමැදි වෙළෙන්දන් මිල නියම කිරීමට ඉඩ දීම වෙනුවට, සමුපකාරය තම සාමාජිකයින්ට විනිවිද පෙනෙන, විවෘත වෙන්දේසි ක්‍රියාවලියක් හරහා තම අස්වැන්න විකිණීමට හැකියාව ලබා දෙයි. මෙය සෑම ධීවරයෙකුටම දවසේ වෙළෙඳපොළ සෘජුවම පිළිබිඹු කරන සාධාරණ මිලක් ලැබෙන බව සහතික කරන අතර, මිල නියම කිරීමේ බලය ධීවරයින් අතට ආපසු ගෙන යයි.

සෑම සාමාජිකයෙකුගේම දෛනික ආදායමෙන් කොටසක් වසර ගණනාවක් පුරා ක්‍රමයෙන් වර්ධනය වී ඇති සාමූහික ඉතිරිකිරීමේ අරමුදලකට යොමු වෙයි. මෙම අරමුදල මගින්, සමිතිය සිය සාමාජිකයින්ට අඩු පොලී අනුපාත යටතේ ණය ලබා දීමටත්, ධීවරයින්ට අවශ්‍ය උපකරණ සහ අනෙකුත් අත්‍යවශ්‍ය දෑ මිලදී ගැනීමටත් හැකියාව ලබයි. සාමාජිකයින් ද ඔවුන්ගේ දෛනික අස්වැන්නෙන් එක් මාළුවෙකු හෝ වැඩි ගණනක් පොදු මසුන් එකතුවකට දායක කිරීමට ආරාධනා ලැබෙන අතර, සමිතිය ඒවා වෙනම වෙන්දේසි කර, ආදායම සෘජුවම සාමූහික ඉතිරිකිරීම් වෙත යොමු කරයි.

මෙම සමිතිය කරයිනාගාර් හි ධීවරයින් 300 කට ආසන්න පිරිසකගේ ජීවනෝපාය නියෝජනය කරයි.

**සම්පත්:**

<u>යන්ත්‍ර සූත්‍ර සහ ඉන්ධන</u>

දැල්, ඉන්ධන, අලුත්වැඩියාවන් සහ උපකරණවල මිල ඉහළ යමින් පවතී. යන්ත්‍ර සූත්‍ර සහ අයිස් කර්මාන්තශාලා වෙත ද ඇත්තේ සීමිත ප්‍රවේශයකි. පසුගිය වසර කිහිපය තුළ, ඉන්ධන සැපයුම සීමා වීමටත්, මිල ඉහළ නැංවීමටත් හේතු වන දේශීය හා ජාත්‍යන්තර සිදුවීම් කිහිපයක් සිදු වූ අතර, එයින් අදහස් කරන්නේ ධීවරයින්ට මේවා දරාගත නොහැකි බැවින් බෝට්ටු මුහුදු යාමට නොහැකි වූ බවයි.

<u>ස්වභාවික සම්පත්</u>

දේශගුණික විපර්යාසවල විශාල ගෝලීය රටාවන් හේතුවෙන් වෙරළබඩ පරිසර පද්ධති, කඩොලාන සහ මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන පුළුල් ලෙස විනාශ වී තිබේ. මීට අමතරව, ප්ලාස්ටික් සහ අපද්‍රව්‍යවලින් සිදුවන දූෂණය වැනි මිනිසා විසින් ඇති කරන ලද ක්ෂණික ගැටලු වෙරළබඩ භූ දර්ශනවලට සහ ධීවර බිම්වලට තර්ජනයක් වී තිබේ. ඇතැම් විශේෂවල (මුහුදු කුඩැල්ලන් මෙන් ම කලපු ජීවී) විශේෂ පරිහානිය මෙම වෙනස්කම්වල සමහර දර්ශක ලෙස ධීවරයෝ පෙන්වා දෙති.

<u>ඉඩම් සහ අවකාශයන්</u>

උතුරු පළාතේ මුහුදු තීරයේ ඉන්දීය ට්‍රෝලර් යාත්‍රාවල පැවැත්ම දේශීය ධීවරයන්ගේ ආරක්ෂාවට සහ ජීවනෝපායට තර්ජනයක් බව තහවුරු වී තිබේ. මෙම ට්‍රෝලර් යාත්‍රා මගින් දේශීය ධීවර දැල් විනාශ කරන අතර ඒ සඳහා කිසිදු වන්දියක් ලබා දෙන්නේ නැත. ට්‍රෝලර් යාත්‍රා මගින් කිසියම් ප්‍රදේශයක විශාල මසුන් ප්‍රමාණයක් අල්ලා ගන්නා බැවින්, ඒවා දේශීය ධීවරයින්ට අල්ලා ගත හැකි ප්‍රමාණය ද අඩු කරයි. සාකච්ඡා වේදිකා වලට ප්‍රජාව ද සම්බන්ධ කර ගනු ලබන දේශසීමා ධීවර සංවාද යාන්ත්‍රණයක අවශ්‍යතාව සහභාගිවන්නන් විසින් මතු කරන ලදී.

සංචාරක ව්‍යාපෘති, වැලි කැණීම් සහ සංවර්ධන කටයුතු හේතුවෙන් සිදුවන වෙරළ විනාශයෙන් ද ධීවර ප්‍රජාවන් පීඩාවට පත්ව සිටිති. ඉඩම් හිමිකම් සම්බන්ධයෙන් සංචාරක බලධාරීන් සමග ගැටුමක් හටගෙන පවතින අතර, ඇතැම් විට ඔවුන්ගේ සාම්ප්‍රදායික ධීවර බිම් වෙත ප්‍රවේශය සීමා වී තිබේ.

ගෘහස්ථ සම්පත්

මේවාට බොහෝ විට රන් ආභරණ ආශ්‍රිත ඉතිරි කිරීම්, කුඩා සත්ව පාලනය, ගෙවතු වගාව, වඩු කාර්මික කුසලතා සහ විදේශගත පවුලේ සාමාජිකයන්ගෙන් ලැබෙන මුදල් ඇතුළත් වේ.

**ගබඩා කිරීම සහ සංරක්ෂණයඃ**

සියලුම දිස්ත්‍රික්කවල පවතින වඩාත්ම කැපී පෙනෙන අඩුවක් වන්නේ ගබඩා කිරීමයි. ධීවරයින්ට හෝ ධීවර සංගම්වලට තමන්ගේම අයිස් කර්මාන්තශාලා හෝ ශීතාගාර ධාරිතාවන් නොමැති බැවින් ගබඩා කිරීමේ පුරුද්දක් නොපවතී. නිසි සිසිලනයකින් තොරව මසුන්ගේ ගුණාත්මකභාවය පිරිහී යන අතර, එමඟින් ඔවුන්ගේ අස්වැන්න කලින් මිලදී ගැනීමට කැමති ඕනෑම අයෙකුට විකිණීමට ඔවුන්ට සිදුව තිබේ.

සංරක්ෂණ ක්‍රමවලට මසුන් සහ අනෙකුත් මුහුදු ආහාර ලුණු දැමීම සහ වේලීම ඇතුළත් වූ අතර ඒවා නිවසේ පරිභෝජනය කරන අතර වෙළෙඳපොළේ ද අලෙවි කරනු ලබයි.

**ආයතනඃ**

ධීවර සමුපකාර පවතින නමුත් ඒවායේ සඵලතාවය බෙහෙවින් වෙනස් වේ. බොහෝ ඒවා බලපත්‍ර නිකුත් කිරීමට හෝ පොදු කරුණු සාකච්ඡා කිරීමට සීමා වී ඇති අතර, සාමාජිකයින් සඳහා ලබා දෙන්නේ දුර්වල ප්‍රායෝගික සහයෝගයකි.

පුහුණුව, දැනුවත් කිරීම සහ නීතිමය ආධාර සඳහා රාජ්‍ය නොවන සංවිධාන (මොන්ලාර්, එල්එස්ටී, නැෆ්සෝ, එම්එස්ඊඩීඕ) මත යැපීමක් පවතී.

ජීවනෝපාය ගැටලුවලට විසඳුම් සෙවීම සඳහා ධීවර නිලධාරීන්ගේ හෝ පරීක්ෂකවරුන්ගේ මැදිහත්වීම සීමිත බව ධීවරයෝ පෙන්වා දෙති. ව්‍යාප්ති සේවා ආකාරයෙන් අධ්‍යාපනය හෝ තාක්ෂණය සැපයීම සඳහා මෙම නිලධාරීන් සහ ප්‍රාදේශීය බලධාරීන් අතර සම්බන්ධීකරණයක් ද නොමැත.

මන්නාරම සහ මඩකලපුව යන ප්‍රදේශවල සම්මේලන හෝ සංගම් විසින් ඇතැම් අලෙවිකරණ පද්ධති පාලනය කරන නමුත් ඒවායේ විනිවිදභාවය ඇත්තේ සීමිත මට්ටමක ය.

**ශ්‍රමයඃ**

ධීවර ශ්‍රමය මූලික වශයෙන් පවුල පදනම් කරගත් එකකි. කුලී ශ්‍රමය භාවිත කරන විට, පංගු ක්‍රමය වැනි ලාභ බෙදා ගැනීමේ ආකෘති පොදු වේ, උදාහරණයක් ලෙස, රු. 70,000 ක උපයනු ලබන මුදලින් අඩක් බෝට්ටු හිමියාට සහ ඉතිරිය කාර්යමණ්ඩලය අතර බෙදී යයි.

වියළීම, වර්ග කිරීම, අලුත්වැඩියා කිරීම සහ දැල් මැසීමේ දී කාන්තා ශ්‍රමය ප්‍රධාන වේ, නමුත් එය අවතක්සේරු කර ඇති අතර නායකත්ව ව්‍යුහයන් තුළ පිළිගැනෙනුයේ ඉතා කලාතුරකිනි. දිස්ත්‍රික්ක කිහිපයක පවතින සංස්කෘතික සම්මතයන් මඟින් කාන්තාවන්ට බෝට්ටු හැසිරවීම හෝ ක්‍රියාත්මක කිරීම සීමා කොට තිබේ.

**පරිභෝජනයඃ**

ධීවරයෝ දළ වශයෙන් වසරෙන් අඩක් නැවුම් මසුන් පරිභෝජනය කරති. වාරයෙන් බැහැර කාලසීමාවන් තුළ, කුටුම්භයන් වෙළෙඳපොළෙන් මිලදී ගන්නා මසුන්, කරවල සහ ගෙවතුවල වගා කරන එළවළු මත පදනම් වේ. වෙළෙඳපොළ මිල ඉහළ යාම හේතුවෙන් සමහර පවුල්වලට ඒවා මිල දී ගැනීමේ හැකියාව අඩු වී ඇත. ශීතකරණ නොමැතිවීම ගෘහස්ථ ආහාර ගබඩා කිරීම සීමා කොට තිබේ.

## 3. අනෙකුත් ක්ෂේත්‍ර භෝග

එළවළු, පළතුරු, ධාන්‍ය, කුළුබඩු - වී වගාව ගණනය කිරීමෙන් පසුව, මෙම විශාල කාණ්ඩ 'අනෙකුත් ආහාර භෝග' ලෙස වර්ගීකරණය කර ඇත. මේවා විවිධ පරිමාණයෙන් වගා කරනු ලබයි. ඇතැම් විට බෝගවල එකතුවක් ලෙස වගා කෙරෙන අතර, නිර්මාණාත්මක නිෂ්පාදකයින් තම නිෂ්පාදන විවිධ ආකාරවලින් වෙළෙඳපොළට සූදානම් බව සහතික කිරීම සඳහා අගය එකතු කිරීම් සිදු කරති.

කොමිසම මොනරාගල, තංගල්ල, යාපනය, දෙනියාය, අම්පාර, මහනුවර සහ හැටන් යන ප්‍රදේශවල විවිධ ආහාර බෝග වගා කරන ප්‍රජාවන් හමු විය.

**නිෂ්පාදනය:**

කොමිසමට සහභාගී වූ ගොවීන් කව්පි, මිරිස්, වම්බටු, ධාන්‍ය, පොල්, කෙසෙල්, අල වර්ග සහ ගම්මිරිස් සහ කුරුඳු වැනි වැවිලි බෝග ඇතුළු නමුත් ඒවාට පමණක් සීමා නොවී විවිධ බෝග වගා කරති. එළවළු සම්බන්ධයෙන් ගත් කළ, ඔවුන්ගේ වගා බිම්වල පිහිටීම අනුව ලූණු, ලීක්ස්, කැරට්, රාබු, අල සහ වට්ටක්කා වගා කරනු ලබයි. බොහෝ ගොවීන් කොටු වගාව, හේන් වගාව, ඒකාබද්ධ මිශ්‍ර වගාව සහ කෘෂි වන වගා පද්ධති උපයෝගී කරගෙන තිබේ.

එළවළු ගොවීන් පැවසුවේ තමන් තම බෝග සඳහා බොහෝ විට රසායනික පොහොර භාවිත කරන බවත්, ඒවා මත යැපීම අඩු කිරීමට උත්සාහ කරමින් සිටින බවත්ය. ඔවුන් කාබනික බෝග නිෂ්පාදනයට ක්‍රමයෙන් මාරු වෙමින් සිටිති. ඔවුන් නිපදවන සීමිත කාබනික ප්‍රමාණයන් මිලදී ගත් පුද්ගලයින් පවසන්නේ එම නිෂ්පාදන රසායනිකව වගා කරන ප්‍රභේදවලට වඩා රසවත් බවයි. ඔවුන් වගා කරන කාබනික නිෂ්පාදන ප්‍රමාණය ඔවුන්ගේම නිවෙස්වල භාවිත කිරීමට ඉඩ සලසා තිබේ. කෙසේ වුවද, ඔවුන්ට එහි විශාල ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීමට නොහැකිය. ඔවුන්ගේ වත්මන් තත්ත්වය යටතේ වෙළෙඳපොළ පුළුල් වුවහොත්, ඔවුන් දුෂ්කරතාවට පත්වනු ඇත.

ඌව කලාපයේ වගාවෙන් විශාල කොටසක් බඩඉරිඟු වලින් සමන්විත වේ. දෙමුහුන් ප්‍රභේදවලට එරෙහිව දේශීය සහල්වල ඇති ප්‍රතිලාභ වලට සමාන ව, දේශීය බඩඉරිඟු වර්ධනය වීමට අවශ්‍ය වනුයේ අඩු පොහොර ප්‍රමාණයකි. එබැවින් ඇතැම් ගොවීන් මෙම ප්‍රභේදය භාවිත කිරීමට උත්සාහ කරති.

ඒකාබද්ධ මිශ්‍ර වගාව යනු බොහෝ ප්‍රදේශවල භාවිත වන ක්‍රමයකි. ශාකවල ඇති විය හැකි රෝගාබාධ කළමනාකරණය කරමින්, එකට 'ගැළපෙන' බෝග වගා කිරීමේ දී උපායශීලී විය යුතු ආකාරය ගොවීහු පැහැදිලි කරති. විවිධ බෝග සඳහා විවිධ පොහොර අවශ්‍යතා පවතින බැවින් ඒවා ප්‍රවේශමෙන් සමබර කළ යුතු ය. බෝග විවිධත්වය පසට හිතකර වේ. සැපයුම මත පදනම් ව ඉල්ලුම වෙනස් වන බව ඔවුන්ට හැඟෙන බැවින්, විවිධ නිෂ්පාදන වගා කිරීම සහ එක් එක් කන්නය සමඟ ඔවුන් වගා කරන දේ වෙනස් කිරීම ගොවියාට ද වාසිදායක වේ.

මගේ නම දේවානන්දන් සත්‍යවදනී, මම මුල්ලිමොතායි ගම්මානයෙන්. මමත් මුල්ලිමොතායි ගොවි නිෂ්පාදක සාමූහිකයේ සාමාජිකාවක්.

නැවත පදිංචි කිරීමේ කාලය තුළ, අපේ පවුලට අක්කර භාගයක ඉඩමක් ලැබුණා. අපි ඉඩම පවුලේ සාමාජිකයින් අතර කොටස් තුනකට බෙදාගත්තා, එක් බෝගයක් මත පමණක් රැඳී නොසිට, විවිධ බෝග රාශියක් එකට වගා කරන්න අපි තීරණය කළෙමු. අපේ ගෙදර අවට, අපි වම්බටු, මිරිස්, බෝංචි, කොළ, එළවළු, අඹ, කොස්, පේර, අනෝදා, කෙසෙල්, ජම්බු සහ ඖෂධීය පැළෑටි වගා කරමු. අපට පොල් ගස් 30 ක් පමණ ද තියෙනවා. ඒ සමඟ, අපි කුකුළන්, එළුවන් සහ ගවයන් ද ඇති කරමු.

පෙර, බොහෝ පවුල් ප්‍රධාන වශයෙන් එක් බෝගයක් මත රඳා පැවතුණු නමුත්, බහු බෝග වගාව අපව වඩාත් සුරක්ෂිත කරන බව අපි ඉගෙන ගත්තෙමු. එක් බෝගයක් අසාර්ථක වුව ද හෝ මිල පහත වැටුණ ද, එවිට අපිට ආර්ථික ව සහායට තවත් බෝග, පලතුරු හා ගවසම්පත් ඇත. එයින් අදහස් වන්නේ අප වෙළෙඳසැල් වලින් එළවළු හෝ ආහාර මිල දී ගැනීම සඳහා වැඩි මුදලක් වියදම් කිරීමට අවශ්‍ය නොවන බවයි, මන් ද අපට අවශ්‍ය බොහෝ දේ අපේ ම ඉඩමෙන් ලැබෙන නිසා ය.

වත්ත වගාවෙන්, සතුන්ගෙන් සහ මගේ සැමියාගේ වැඩකිරීමෙන් ලැබෙන ආදායම එකතුව අපේ පවුල පෝෂණය කිරීමට උපකාරී වෙයි. බහු බෝග වගාව මගින්, අපට වඩා සෞඛ්‍ය සම්පන්න හා ස්වාධීන ජීවන රටාවක් ගොඩනගමින් අපේ ඔරොත්තු දීමේ හැකියාව සහ ගෘහස්ත ආදායම දෙකම වැඩිදියුණු කිරීමට හැකි වී ඇත.

**අගය එකතු කිරීම:**

ආහාර නොවන භෝග වගා කරන සුළු පරිමාණ වගාකරුවන් සහ නිෂ්පාදකයින් විසින් විශාල වශයෙන් අගය එකතු කිරීම් සිදු කරනු ලබයි. ඔවුන් තමන්ගේ හෝ තම සංගමයේ ධාරිතාව මත පදනම් ව විවිධ මට්ටම් වලින් එය සිදු කොට තිබේ.

තම සාමාජිකයින් අතර ප්‍රමාණවත් මුදලක් රැස් කර ගැනීමට හැකි වූ සමහර කණ්ඩායම් විසින් වී මෝල් මිල දී ගෙන තිබුණි. ඔවුන් දැන් සහල් සහ ධාන්‍ය පිටි බවට පත් කර කඩ සාප්පුවල හෝ කෙලින්ම දේශීය ආහාර පිළියෙළ කරන පුද්ගලයින්ට අලෙවි කරමින් සිටී. අනෙක් අයට රාජ්‍ය නොවන සංවිධානවල සහය ඇති ව එවැනි යන්ත්‍ර මිල දී ගැනීමට හැකි ව ඇති අතර, එම යන්ත්‍රය සමිතියක සියලුම සාමාජිකයින් විසින් භාවිත කරනු ලැබේ.

මුං ඇට සහ ධාන්‍ය පිරිසිදු කර සකස් කරනු ලබන අතර, සමහරක් කෙටි ආහාර සහ පිටි සැකසීමට භාවිත කරයි. පරිභෝජනය සඳහා භාවිතයට සහ විකිණීමට අමතර ව, පොල් තෙල්, තන්තු නිෂ්පාදන සහ අත්කම් නිර්මාණ සඳහා භාවිත වේ. පළතුරු වියළා හෝ චිප්ස් ලෙස බැද කඩ සාප්පුවල විකුණනු ලබන අතර, අනෙක් ඒවා චට්නි හෝ ජෑම් ලෙස සකස් කරනු ලබයි. බඩඉරිඟු ත්‍රිපෝෂ හෝ කුඩා දරුවන් ඉලක්ක කරගත් සෞඛ්‍ය සම්පන්න ධාන්‍ය මිශ්‍රණ නිෂ්පාදනය කරන පුද්ගලයින්ට අලෙවි කරනු ලැබේ. මුළුතැන්ගෙයි අපද්‍රව්‍ය ඔවුන්ගේ වගාවන් සඳහා ස්වභාවික පොහොර සෑදීමට භාවිත කරයි.

**අලෙවිකරණය:**

බොහෝ ගොවීන් සතිපතා වෙළෙඳපොළ, ගම්වල සාප්පු සහ සුළු පරිමාණ සෘජු වෙළෙඳාම් මගින් මේවා අලෙවි කරනු ලබයි. ඇතැමුන් මාර්ගගත අලෙවිකරණය සඳහා සමාජ මාධ්‍ය භාවිත කරති.

එළවළු ගොවීන් ආදායම් ලබන්නේ ප්‍රාදේශීය වෙළෙඳසැල්වලට සහ ආර්ථික මධ්‍යස්ථානවලට තොග වශයෙන් විකිණීමෙනි. ඕනෑම අවස්ථාවක රට පුරා වගා කරන එළවළු ප්‍රමාණය සහ ඒවා නැවුම් ව පවතින සාපේක්ෂ ව කෙටි කාලය ගොවීන්ට නිතිපතා කොපමණ මුදලක් උපයා ගත හැකි ද යන්න තීරණය කරයි. නිශ්චිත ප්‍රදේශයක වගා කරන්නන් බොහෝ දෙනෙකු සිටින බැවින් තමන්ගේ නිෂ්පාදන - අතරමැදියන්ට හෝ කඩ සාප්පුවලට - අලෙවි කළ නොහැකි වීමේ ගැටලුවලට ඔවුහු මුහුණ දෙති.

නිෂ්පාදන වලින් විශාල කොටසක් දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට යොමු කරනු ලබයි. මධ්‍යම කඳුකරයේ වගා කරන්නන් සඳහා බණ්ඩාරවෙල ද ප්‍රධාන ස්ථානයකි. නුවරඑළිය දිස්ත්‍රික්කයේ එළවළු ගොවීන් කේන්ද්‍රගත වී ඇති බැවින්, තමන්ගේ නිෂ්පාදන සඳහා ප්‍රදේශය තුළ මධ්‍යස්ථානයක් පිහිටුවන ලෙස ගොවි කණ්ඩායම් කිහිපයක් දිස්ත්‍රික් ලේකම්වරයාගෙන් (GA) ඉල්ලා ඇත.

අතරමැදියන් ගොවීන්ගෙන් අඩු මිලකට එළවළු මිල දී ගන්නා අතර, බොහෝ විට ඒවා එළවළු වගා බිම් වෙතින්ම මිල දී ගැනීම සිදුවන්නකි. එසේ ගෙන එන එළවළු මෙම මධ්‍යස්ථානවල දී නැවත අලෙවි කරනු ලබයි. මෙම මධ්‍යස්ථානවල දී එකී නිෂ්පාදන වැඩි මිලකට අලෙවි කරනු ලබන බැවින්, එළවළු විකිණීමේ සම්පූර්ණ ලාභය ගොවියාට හිමි වන්නේ නැත. නියෝජිතයන් සහ වෙළෙඳුන් විසින් නියම කරන අත්තනෝමතික මිල ගණන් වෙනුවට සාධාරණ මිලකට මිල දී ගත හැකි පරිදි, මිල දී ගැනීමේ දී රජයට ශක්තිමත් භූමිකාවක් පැවතිය යුතු බව ගොවීන්ගේ අදහසයි.

අනුරාධපුරය මාරදන්කඩවල හි, නිෂ්පාදක සමිති තුනක් එකතු වී මාරදන්කඩවල ගොවි නිෂ්පාදක සාමූහිකය පිහිටුවා ගෙන ඇත. රාහුල මාවත ගොවි නිෂ්පාදක සමිතිය එළවළු සහ වී ගොවීන්ගෙන් සමන්විත වන අතර, ඔවුන්ගෙන් බහුතරයක් දැන් සාම්ප්‍රදායික වී වර්ග වගා කරන අතර කාබනික ක්‍රම යටතේ ද වගා කරති. නාවක්කුලම ගොවි නිෂ්පාදක සමිතිය ප්‍රධාන වශයෙන් ගවයන් සහ එළුවන් ඇති කරන කිරි නිෂ්පාදකයින්ගෙන් සමන්විත වෙයි. කිරි නිෂ්පාදන හැරුණු විට, ඔවුන් ජීවාමෘත සහ වර්මිකොම්පෝස්ට් වැනි කාබනික ආදාන සකස් කරන අතර, ඒවා අනෙකුත් සමිති දෙකට ඔවුන්ගේ ඉඩම්වල භාවිතය සඳහා සපයයි. තෙවන සමිතිය වන හල්මිල්ලව ගොවි නිෂ්පාදක සමිතිය, ප්‍රධාන වශයෙන් අගය-වර්ධිත නිෂ්පාදනයේ නිරත වෙයි. ඔවුන් කුළු බඩු මිශ්‍රණ, අච්චාරු ආදිය සකස් කරති. ඔවුන් මාරදන්කඩවල පිහිටි සාමූහිකයේ සිල්ලර අලෙවි කේන්ද්‍රය වන මරදන්කඩවල කෘෂිපාරිසරික ගොවි නිෂ්පාදක කේන්ද්‍රය ද පරිපාලනය කරති.

සාමූහිකයේ සාමාජිකයින් 70 සිට 80 දෙනෙකු පමණ සිටින අතර, ඔවුන්ගෙන් බහුතරය කාන්තාවන් වෙයි. සමිති තුනෙන් එක් එක් සමිතිය තමන්ගේ ම අභ්‍යන්තර ඉතිරිකිරීමේ යාන්ත්‍රණයක් පවත්වාගෙන යන අතර, සාමූහිකය සමස්තයක් ලෙස හවුල් ඉතිරිකිරීමේ අරමුදලක් ද පවත්වාගෙන යයි.

**සම්පත්:**

ඉඩම්

රටේ බොහෝ ස්ථානවල වී ගොවීන්ට ඔවුන්ගේ ඉඩම් හිමිකම පිළිබඳ 'කිසිදු ගැටලුවක්' නොමැති වුව ද, බඩඉරිඟු සහ අනෙකුත් නිෂ්පාදකයින්ට තත්ත්වය එසේ නොවන බව ගොවීන්ගේ අදහස වී තිබේ.

ඔවුන් පෙන්වා දෙන සැලකිය යුතු තර්ජනයක් වන්නේ වගා බිම් විශාල ප්‍රමාණයක් මේ වනවිට රක්ෂිත වනාන්තර ලෙස සලකුණු කර තිබීමයි, එමඟින් ඔවුන්ට වර්ධනය වීමට සහ ජීවනෝපාය කටයුතුවල නිරත වීමට ඇති හැකියාව සීමා වේ. මෙම රක්ෂිත බොහෝ විට සලකුණු කර ඇත්තේ මිනිසුන් දශක ගණනාවක් තිස්සේ වගා කරමින් පෝෂණය කළ ඉඩම් ප්‍රදේශවල ය. ආරක්ෂිත වනාන්තර වැස්ම ව්‍යාප්ත කිරීම මඟින් වගාව සඳහා භාවිත කරන ඉඩම්වල නිවාස ඉදිකිරීමට මිනිසුන් පොළඹවන අතර, එමඟින් ගොවියාට නිෂ්පාදනය කළ හැකි ස්ථාන සීමා කරන චක්‍රයක් නිර්මාණය කොට තිබේ.

පෞද්ගලික පුද්ගලයන් විසින් නේවාසික ඉදිකිරීම් සහ සංවර්ධන කටයුතු සඳහා ඉඩම් විකිණීම තවත් සීමාකාරී සාධකයක් විය. ගොවීන් පැවසුවේ තමන්ට තම වගාවන් ව්‍යාප්ත කිරීමට අවශ්‍ය වුව ද, එම අරමුණු සඳහා ඉඩම් වෙන් කර තිබූ බැවින් එය කළ නොහැකි වූ බවයි.

යාපනයේ දී සම්මුඛ සාකච්ඡාවට භාජනය වූ ගොවීහු මිලිටරිකරණය ඔවුන්ගේ වගාවට සහ ජීවනෝපායට බලපාන ආකාරය පැහැදිලි කළහ. හමුදා සෙබළුන් දැන් හමුදා කඳවුරු තුළ පවතින සාම්ප්‍රදායික සිවිල් ඉඩම්වල බෝග වගා කරති. මිනිසුන් වගා කිරීමට පුරුදු ව සිටි මෙම ඉඩම් දැන් ඔවුන්ට ළඟා විය නොහැකි මට්ටමක පවතින නමුත්, හමුදාව එකී එලදාව දේශීය වෙළෙඳපොළේ, බොහෝ විට දේශීය නිෂ්පාදකයින්ට දැරිය නොහැකි අඩු මිලකට විකිණීමෙන් ලාභ ලබමින් සිටී.

තේ වතුවල ජීවත්වන සහ ඒවාට ආසන්නව වගා කරන මලෙයියහ දෙමළ ගොවීන් තම නිෂ්පාදන කෙරෙහි වතු කළමනාකාරිත්වයට ඇති පාලනය පිළිබඳ ව අදහස් දැක්වූහ. ඇතැම් වතුයායවල විශේෂයෙන් ම පවුලක් පරම්පරා ගණනාවක් පුරා එහි වගා කර ඇත්නම් තෝරාගත් ප්‍රදේශවල එළවළු වගා කිරීමට ඉඩ සලසා දී තිබේ. අනෙක් ඒවායේ, කළමනාකාරිත්වය සේවකයින් පිළිබඳ ව දැඩි අවධානයෙන් සිටින අතර ලයින් කාමරවලට ආසන්නව වගා කිරීමට උත්සාහ කරන පොල් හෝ කෙසෙල් ගස් කැපීම සඳහා සේවකයින් එවනු ලබයි.

මිලිටරිකරණය සහ වතු කළමනාකරණ පාලනය පිළිබඳ ව මෙම වාර්තාවේ වෙන ම පරිච්ඡේදයක සාකච්ඡා කරනු ඇත.

බීජ

තමන් දිගු කලක් තිස්සේ වගා කරන දෙමුහුන් බීජ දේශීය පසෙහි සාර්ථක නොවන බව කඳුකරයේ ගොවීන් සොයා ගෙන තිබේ. සුළු පරිමාණ වගාකරුවන් තමන්ගේ ම බීජ සාදා ගන්නා අතර, ඒවා මිල දී ගන්නේ වසර 5 ක ට වරක් පමණි.

බීජ සංරක්ෂණ කණ්ඩායම් ක්‍රියාත්මක වන මොනරාගල සහ උතුරු මැද පළාතේ සමහර කොටස්වල දේශීය බීජ භාවිතය ශක්තිමත් ව පවතී. ඔවුන් සාම්ප්‍රදායික ප්‍රභේද වගා කර සංරක්ෂණය කරන අතර, ඒවා තමන්ගේ ම වගාවන්හි අත්හදා බැලීම සඳහා ජාල සහ අනෙකුත් ගොවීන් අතර බෙදා ගනී, කෘෂි පාරිසරික ක්‍රමවලට මාරු වීම ද දිරිමත් කරයි.

මොනරාගල දිස්ත්‍රික්කයේ පිහිටි විකල්පනී ජාතික කාන්තා සම්මේලනය, කාන්තා නායකත්වයෙන් යුත් බීජ සංරක්ෂණය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, ගොවීන්ගේ බීජ ස්වෛරීත්වය සඳහා වූ අයිතිවාසිකම් වෙනුවෙන් දශක දෙකකට වැඩි කාලයක් පෙනී සිට ඇත.

විකල්පනී හී සාමාජිකයින් ගෙදර පදනම් කරගත් සහ ප්‍රජා බීජ බැංකු දෙකම පවත්වාගෙන යන අතර, ඔවුන් අතර බීජ හුවමාරු කිරීමේ සහකාරී ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරති. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ 2003 අංක 22 දරන බීජ පනතට අනුව විධිමත්ව ලියාපදිංචි කරන ලද ඔවුන්ගේ බීජ නිෂ්පාදන හා අලෙවිකරණ සමිතියක් හා බීජ නිෂ්පාදන ගොවිබිම් ද ඔවුන් කළමනාකරණය කරති. බීජ මොනරාගල සහ බුත්තල අවට සාමාජිකයින්ගෙන් ලබා ගනු ලැබේ.

මෙම සියලු උත්සාහයන් එකතු ව, ගුණාත්මක බීජ නිෂ්පාදනය සහතික කරන අතරම, ඉදිරි පරම්පරාවන් සඳහා දේශීය බීජ වර්ග සක්‍රීයව ප්‍රවර්ධනය කිරීම හා සංරක්ෂණය කිරීම සිදු කරයි.

රාජාංගනය දේශීය බීජ සුරකින්නන්ගේ ප්‍රාථමික කෘෂි නිෂ්පාදන අලෙවි සමිතිය, රාජාංගනය ප්‍රදේශයට ආවේණික පරිසරය ආරක්ෂා කිරීමට සහ බීජ හා ජනාවලිය සංරක්ෂණය කිරීමට යන හවුල් අභිප්‍රායයකින් පිහිටුවනු ලැබීය. සමිතියේ දැනට සාමාජිකයින් 60 දෙනෙකු සිටින අතර, ඔවුන් සාමූහිකව වී, අල, රනිල, එළවළු සිට විවිධ කෙසෙල් වර්ග දක්වා බොහෝ විවිධ ප්‍රභේද සංරක්ෂණය කරති.

එහි තරුණ සාමාජිකයින් අතර රසික නම් ගොවියෙකු හා අධ්‍යාපනඥයෙකු සිටින අතර, ඔහු පෞද්ගලික ව ශ්‍රී ලංකාවට ආවේණික වී වර්ග 80 ක් සංරක්ෂණය කර ඇත. සමිතිය සමඟ එකතු ව, ඔහු මෙම ප්‍රභේද ආරක්ෂා කිරීමට හා ප්‍රචලිතව තබා ගැනීමට උදවු කරමින්, රට පුරා ගොවීන් සමඟ බීජ හුවමාරු කිරීමේ කටයුතුවල සක්‍රීයව සහභාගී වෙයි.

ජලය

වී වගාවට දී ඇති ප්‍රමුඛතාව ගොවීන්ගේ ප්‍රතිචාරවලින් පැහැදිලි වේ. බොහෝ සම්පත් 'ප්‍රධාන බෝගය' වෙත යොමු කරන අතර ම, එළවළු නිෂ්පාදනය සඳහා තත්ත්වය එසේ නොවන බව ඔවුන්ගේ අදහසයි. වැසි කාලයෙන් පරිබාහිර කාලය සම්බන්ධ ව, දඹුල්ලේ සහ මොනරාගල ගොවීන් පෙන්වා දුන්නේ වාරි වැව් සහ ඇළ මාර්ගවලින් ජලය ප්‍රථමයෙන්ම වී කුඹුරුවලට යොමු කරන බවයි. තෝරාගත් ස්ථානවල ඇති වැසි ජල ටැංකි පසුව භාවිතය සඳහා ජලය ගබඩා කිරීමට උපකාරී වන නමුත් මෙය ඒකාකාරී පරිචයක් නොවේ.

මූල්‍ය

සම්මුඛ සාකච්ඡාවට භාජනය වූ ගොවීන් විවිධ සැපයුම්කරුවන්ගෙන් මූල්‍ය සම්පත් සහ සහය ලබා ගෙන තිබිණි. ඇතැමුන් ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්වලින් ණය ලබාගෙන තිබූ අතර ඔවුන් සෙමෙන් ආපසු ගෙවීමට උත්සාහ කරන ණය බරින් පසුවූහ. ඔවුන් පැවසුවේ රාජ්‍ය සහ විධිමත් බැංකු පද්ධති තමන් වැනි ඉහළ අවදානමක් ඇති පුද්ගලයින්ට ණය ලබා නොදෙන බව හෝ ණයක් ලබා ගැනීම සඳහා ලියකියවිලි රාශියක් අවශ්‍ය වන බවයි. මේවා සැපයීමට නොහැකි වීම හෝ මුදල් හදිසියෙන් අවශ්‍ය වීම හේතුවෙන් බොහෝ දෙනෙක් ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් වෙත යොමු ව තිබිණි.

සියලුම ගොවීන් ඔවුන්ගේ ප්‍රජා මට්ටමින් ඉතුරුම් කණ්ඩායම්වලට සහභාගී වූ අතර ණය ගැනීමට පෙර සිට ම මේවායේ කොටස්කරුවන් වී සිටියහ. මෙම කණ්ඩායම් සාමාජිකත්වය, මාසික ඉතුරුම් සඳහා කුඩා මුදලක් ලබා ගත් අතර ඔවුන්ගේ ඉතුරුම් ධාරිතාව අනුව රුපියල් 100,000 දක්වා ණය ලබා දී තිබිණි. පවුලේ සාමාජිකයෙකුගේ මරණයකදී සහ සාමාජිකයෙකු රෝගාතුර වූ විටද ඔවුන් ස්ථාවර මුදල් ප්‍රමාණයක් ලබා දුන්හ.

මෙම කුඩා කණ්ඩායම් බොහොමයක් මූලික වශයෙන් සමුපකාර ලෙස ක්‍රියා කළ ද, ලියකියවිලි සහ එයින් ඇති විය හැකි අධීක්ෂණය පිළිබඳ පැකිලීමකින් යුතුව බොහෝ දෙනෙක් සමුපකාර ලෙස ලියාපදිංචි වී නොතිබුණි. කෙසේ වෙතත්, ඔවුන් ණය සඳහා 0.5% ක් තරම් අඩු පොලී අනුපාත ලබා දුන් අතර, ඔවුන්ගේ නිෂ්පාදන විකිණීමෙන් ලැබෙන ලාභය කණ්ඩායම් සාමාජිකයින් අතර බෙදා ගන්නා ලදී. සාමාජිකයින් නොවන අයට ද මෙම කණ්ඩායම්වලින් ණය ලබා ගත හැකි නමුත් එය තරමක් ඉහළ පොලී අනුපාත යටතේ විය.

**ගබඩා කිරීම/සංරක්ෂණය:**

නිසි ගබඩා පහසුකම් නොමැතිකම හේතුවෙන් බොහෝ එළවළු බෝග ඉක්මනින් විකිණිය යුතුය. ගෘහස්ථව ගබඩා කර ඇති සහල් ඉව මඟින් හඳුනා ගත හැකි අලි ඇතුන්ගෙන් සිදුවිය හැකි හානිය වී ගොවීන්ට සහල් වහාම විකිණීමට බල කරනු ලබන්නකි.

**ආයතන:**

සියලුම ප්‍රදේශවල, අදාළ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවල රජයේ නිලධාරීන්ගෙන් ලැබෙන දායකත්වය සීමිත විය. ගොවීන් තමන්ගේ දැනුම වර්ධනය කර ගැනීමට සහ වඩාත් තිරසාර ක්‍රම අත්හදා බැලීමට බලාපොරොත්තු වන නමුත්, කෘෂිකාර්මික නිලධාරීන් තවදුරටත් එම පැරණි ක්‍රමවේදම භාවිත කිරීමට සහ රසායනික පොහොර භාවිත කිරීමට ඔවුන්ට උපදෙස් දෙන බව ගොවීන් සොයා ගෙන තිබේ.

රාජ්‍ය නොවන සංවිධාන විසින් කෘෂි පාරිසරික පුහුණු වැඩසටහන්, ප්‍රජා ණය ක්‍රම සහ ණය බරින් පීඩිත පුද්ගලයන්ට නීතිමය ආධාර සැපයීම මඟින් ගොවීන්ට සහයෝගය දක්වයි. ඔවුන් පළාත් පුරා සිටින ගොවීන්ට එකිනෙකා හමුවීමට, බීජ බෙදා ගැනීමට සහ එකිනෙකාගේ ගොවිතැන් හෝ නිෂ්පාදන පිළිවෙත් වලින් ඉගෙන ගැනීමට ජාල නිර්මාණය කරති.

බොහෝ නිෂ්පාදකයින් සඳහා ස්වයං අධ්‍යයනය දැනුම ලබා ගැනීමේ ප්‍රධාන මූලාශ්‍රයක් බවට පත් ව තිබේ. මෙය යූ ටියුබ් (YouTube) වීඩියෝ නැරඹීමෙන් සහ එම ක්‍රම තමන් විසින් ම අත්හදා බැලීමෙන් සහ/හෝ අනෙකුත් ගොවි කණ්ඩායම් සමඟ සාකච්ඡා කිරීමෙන් සිදු වන්නකි. යම් ප්‍රදේශයක වැඩ කරන ගොවීන් අතර හෝ ජාල මගින් දැනුම බෙදා ගැනීම සහ බීජ බෙදා ගැනීම මඟින් ඔවුන්ට තම අස්වැන්න වැඩි දියුණු කර ගැනීමට හැකි ව තිබේ.

**ශ්‍රමය:**

ශ්‍රම හුවමාරු ක්‍රම (අත්තම්) සියලුම ප්‍රදේශවල පවතින අතර, එමඟින් ගොවීන්ට ශ්‍රමිකයන් කුලියට ගැනීම වෙනුවට අන්‍යෝන්‍ය වශයෙන් වැඩ හුවමාරු කර ගැනීමට ඉඩ සැලසේ. නිෂ්පාදනය, බීජ සංරක්ෂණය සහ පාරිසරික ගොවිතැනෙහි කාන්තාවන් ප්‍රධාන භූමිකාවක් ඉටු කරයි. කෙසේ වෙතත්, දිනක කෘෂිකාර්මික ශ්‍රමය සඳහා ගෙවන වේතනයේ විෂමතාවක් පවතින අතර, පිරිමින්ට වඩා කාන්තාවන්ට ගෙවනුයේ අඩු මුදලකි.

කෘෂිකර්මාන්තයෙන් තරුණ ප්‍රජාව බැහැර වීම සැලකිය යුතු ශ්‍රම අභියෝගයක් වන අතර, එය සැබවින් ම ආහාර නිෂ්පාදනයේ අනාගතයට ද අභියෝගයකි. මෙය ආකාර දෙකකින් සිදු වේ. පළමුවැන්න, තරුණයින් රැකියා අවස්ථා සොයා නාගරික ප්‍රදේශවලට සංක්‍රමණය වීමයි. දෙවැන්න, කෘෂිකාර්මික ප්‍රදේශවලට ආසන්නව රැඳී සිටීමට තෝරා ගන්නා තරුණයින් වගාවට සම්බන්ධ නොවන වෙනත් රැකියා සෙවීමට යොමු වීමයි. අභියෝග අතරට මේවා ඇතුළත් වේ:

ගොවීන් ශ්‍රම හුවමාරු ක්‍රම (අත්තම් ක්‍රමය) සඳහා නිල පිළිගැනීමක් ලබා දෙන ලෙස සහ NVQ මට්ටමේ පාඨමාලා මගින් තරුණ තරුණියන්ට පුහුණුව ලබා දෙන ලෙස ඉල්ලා සිටියහ.

**පරිභෝජනය:**

ගොවීන් තමන් වගා කරන නිෂ්පාදන වලින් වැඩි ප්‍රමාණයක් පරිභෝජනය කරන අතර කණ්ඩායම් තුළ භාණ්ඩ හුවමාරු කර ගනිති. විවිධ බෝග මිශ්‍රණයක් වගා කරන අයට තමන්ගේ ම වගාවෙන් තම පවුලේ පෝෂණ අවශ්‍යතා වලින් වැඩි ප්‍රමාණයක් සපුරා ගැනීමට හැකි ව තිබේ.

තරුණ පරම්පරාව කඩෙන් මිල දී ගන්නා ආහාරවලට වැඩි කැමැත්තක් දක්වන අතර, ගොවීන් මෙය හඳුනා ගනු ලබන්නේ සංස්කෘතික අභියෝගයක් වශයෙනි. ඇතැමුන් විශේෂයෙන් ප්‍රකාශ කරන්නේ දේශීය නිෂ්පාදනවල ප්‍රතිලාභ පිළිබඳ ප්‍රචාරණය සහ දැනුවත් කිරීම මඟින් ගොවියාට වැඩි ආදායමක් උපයා ගත හැකි අතරම දේශීය ආර්ථිකයෙන් ඩොලර් පිටතට ගලා යාම සීමා කළ හැකි බවයි.

**4. ආහාර නිෂ්පාදනය හා සම්බන්ධ අනෙකුත් ගෘහස්ත ජීවනෝපායන්**

**හැඳින්වීම:**

නිෂ්පාදනයේ මූලික අදියරෙන් ඔබ්බට ආහාර සැකසීම ශ්‍රී ලංකාවේ පුළුල් ජීවනෝපාය මාර්ගයක් වන අතර එය ගෘහස්ථ මට්ටමේ සිට කාර්මික මට්ටම දක්වා ක්‍රියාත්මක වේ. දඹුල්ල, මඩකලපුව, මන්නාරම සහ අම්පාර යන ප්‍රදේශවල පුද්ගලයන් සහ සාමූහිකයන් ගොවිතැනෙන් ඔබ්බට ගොස් සැකසීම, ගබඩා කිරීම, අලෙවිකරණය සහ ප්‍රජා හුවමාරු පද්ධති ඇතුළුව ආහාර නිෂ්පාදනයේ නිරත ව සිටී.

**නිෂ්පාදනය:**

නිෂ්පාදන ක්‍රියාකාරකම් වලට සහල්, සම්බෝල, මිශ්‍රණ (මික්ස්චර්), අච්චාරු, තෙල්, සබන් කුඩා පරිමාණයෙන් සැකසීම සහ සත්ව පාලනය ඇතුළත් වේ. මෙහි සඳහන් නිෂ්පාදකයා වී වගාව, ගෙවත්තක් පවත්වාගෙන යාම, සහ සත්ව පාලනය (ගවයන් සහ කුකුළන් ඇතුළුව) නිරත වේ. සහල් සැකසීම කුඩා පරිමාණයෙන් සිදු කරනු ලබන්නේ මිල දී ගත් වී සහ බාහිර මෝල් සේවා උපයෝගී කරගනිමිනි.

බොහෝ කුටුම්භයන් එළවළු, පලතුරු, ඖෂධීය ශාක සහ පළා වර්ග සහිත මධ්‍යම හෝ මහා පරිමාණ ගෙවතු පවත්වාගෙන යති. කොවිඩ්-19 (COVID-19) කාලය තුළත්, පසුව ඇති වූ ආර්ථික අර්බුදයේ දී ත් ගෙවතු වගාව අත්‍යවශ්‍ය වූ අතර, එය ස්ථාවර ජීවනෝපායක් සහ ආහාර ප්‍රභවයක් ලෙස තවදුරටත් පවතී. ගෙවතු වගාවට අමතර ව බොහෝ කාන්තාවන් නිවස පදනම් කරගත් සුළු පරිමාණ ආහාර නිෂ්පාදනයේ නිරත ව සිටී.

මෙම නිෂ්පාදකයින් ද විවිධ පරිමාණයන්ගෙන් ක්‍රියාත්මක වන බව සඳහන් කළ යුතු ය. ඇතැමුන් විශාල පරිමාණයේ නිෂ්පාදකයින් වන අතර කුලී ශ්‍රමිකයන් තබා ගැනීමේ හැකියාව පවතී. අනෙකුත් නිෂ්පාදකයින් ක්‍රියාත්මක වනුයේ නිවසක පවුල පදනම් කරගත් මෙහෙයුමක් වශයෙනි.

**අගය එකතු කිරීම:**

නිෂ්පාදකයින් විවිධ අගය එකතු කළ නිෂ්පාදනවල නිරත වන අතර අවශ්‍ය අවස්ථාවල දී ඒ සඳහා සහතික හෝ බලපත්‍ර ලබාගෙන ඇත. මෙම නිෂ්පාදනවලින් වැඩි ප්‍රමාණයක් සිදු කරනු ලබන්නේ කාන්තාවන් විසින් වන අතර, එය සිදු වන්නේ ගෘහස්ථ රාජකාරිවලට සමාන්තරවය, ඔවුන් මෙම කාර්යය සඳහා අවුයම 3 ට අවදි වෙති.

සැකසීම: රතු සහ සුදු සහල්, සහල් පිටි, ඖෂධීය කොළ කුඩු

ආහාර නිෂ්පාදන: කරවල, සම්බෝල, අච්චාරු, චිප්ස්

සෞඛ්‍ය ආරක්ෂණ නිෂ්පාදන: ශාකසාර හිසකෙස් තෙල්, ස්වභාවික ද්‍රව්‍යවලින් සාදන ලද සබන්

පිසූ ආහාර: වටලප්පන්, කේක්, මුරුක්කු, ඉඳිආප්ප, තල කැම

ජාතික ධීවර සහයෝගිතා ව්‍යාපාරය, ගාල්ල, මාතර, යාපනය සහ කළුතර ඇතුළු දිස්ත්‍රික්කවල කාන්තා ධීවරයින් 200 කට වැඩි පිරිසක් සමඟ කටයුතු කරමින්, දේශීය ආහාර සංරක්ෂණය සහ කුඩා පරිමාණ නිෂ්පාදනය මත පදනම් වූ විකල්ප ආහාර පද්ධති ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කරයි. ඔවුන්ගේ ගෙවතු වගාවෙන් හා මාළු අස්වැන්න භාවිත කරමින්, කාන්තාවන් වැඩි කාලයක් රැකගත හැකි සහ වැඩි වෙළෙඳ අගයක් සහිත වියළි මාළු, අච්චාරු, කුළු බඩු සහ අනෙකුත් ආහාර නිෂ්පාදන සකස් කරති.

මෙම මුලපිරීම, කාන්තාවන්ට දෛනික මාළු විකිණීම පමණක් මත රඳා නොසිට ඔවුන්ගේ ආදායම් මාර්ග විවිධාංගීකරණය කිරීමට උදවු කර ඇත. එය බොහෝ විට වෙළෙඳ මිල පාලනය කරන මධ්‍යස්ථකරුවන් සහ මාළු වෙළෙන්දන් විසින් සූරාකෑමට ලක් වීමේ අවදානම ද අඩු කර ඇත. ඔවුන්ගේ ප්‍රජාවන් තුළ ආහාර සකස් කිරීම හා සංරක්ෂණය කිරීම හරහා, කාන්තාවන්ට ගෘහස්ත ආදායම වැඩි කිරීමට, ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීමට සහ දේශීය ආහාර පද්ධති මත වැඩි පාලනයක් ගොඩනඟා ගැනීමට හැකියාව ලැබෙයි. මෙම මුලපිරීම සාම්ප්‍රදායික දැනුම, සාමූහික සංවිධානය සහ ප්‍රජා පදනම් ආර්ථික ඔරොත්තු දීමේ හැකියාව ද ප්‍රවර්ධනය කරයි.

**අලෙවිකරණය:**

මෙම නිෂ්පාදකයින් විසින් භාවිත කරනු ලබන විකුණුම් නාලිකා විවිධ වේ. ඒවාට ගමේ ප්‍රාදේශීය වෙළෙඳසැල්, සතිපතා වෙළෙඳපොළ, තමන්ට සමීප හෝ සමහර විට විදේශයන්හි සිටින පාරිභෝගිකයින් වෙත සෘජු ඇණවුම් ඇතුළත් වේ. ධාන්‍ය කැඳ සහ ත්‍රිපෝෂ වැනි පෝෂණීය ආහාර පිළියෙළ කරන නිෂ්පාදකයන් සමහර විට තම නිෂ්පාදන ෆාමසි (ඖෂධසැල්) වෙත අලෙවි කරති. මීට අමතරව, බොහෝ දෙනෙක් තම නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීමට, සබඳතා ඇති කර ගැනීමට සහ ඒවා විකිණීමට ෆේස්බුක් (Facebook) වැනි මාර්ගගත (online) වේදිකා භාවිත කරති. බෙදා හැරීම් අලුයම සිදු කෙරේ.

ඇතැම් වෙළෙඳපොළවල් සඳහා පාරිභෝගිකයින් ළඟා වීම අඩු මට්ටමක පවතින අතර, නිෂ්පාදකයාට තම භාණ්ඩ එහි රැගෙන යාමට සහ ආපසු ගෙන ඒමට ප්‍රවාහනය සඳහා විශාල මුදලක් වැය කිරීමට සිදු වේ. ලාභයෙන් ප්‍රතිශතයක් ලබා ගන්නා අතරමැදියන් නොමැති වුවද, සංවිධානාත්මක අවකාශයන් නොමැතිකම කුඩා පරිමාණ නිෂ්පාදකයින්ට අභියෝගයකි.

නිවස පදනම් කරගත් මහා පරිමාණ නිෂ්පාදකයින්ට වැඩි වෙළෙඳපොළ ප්‍රවේශයක් ලැබෙන්නේ ඔවුන්ට ගැනුම්කරුවන්ට අඩු මිලක් ලබා දීමට හැකි බැවිනි. කුඩා නිෂ්පාදකයින්ට මේ ආකාරයෙන් මිල අඩු කිරීමට නොහැකි බැවින් ඔවුන්ගේ ආදායම අඩු මට්ටමක පවතී.

**සම්පත්:**

<u>දැනුම</u>

නිෂ්පාදකයින් ප්‍රජා ජාල, පුද්ගලික අත්දැකීම් සහ අනෙකුත් කාන්තාවන් අතර සිදුවන අවිධිමත් දැනුම හුවමාරුව මත යැපෙති. නැෆ්සෝ (NAFSO), කාන්තා ග්‍රාමීය සංවර්ධන සමිති, ප්‍රාදේශීය සමිති වැනි රාජ්‍ය නොවන සංවිධාන සමහර විට මාරුවෙන් මාරුවට එවැනි නිෂ්පාදකයින් සඳහා පුහුණුව සහ ධාරිතාව ගොඩනැගීමේ වැඩසටහන් සංවිධානය කරයි.

<u>ජලය</u>

ගෙවතු වගාව බොහෝ සෙයින් රඳා පවතින්නේ ප්‍රදේශයට වැසි ජලය ලැබීම මතය. මිනිසුන්ට වසර පුරා ජලය සහතික කර ගැනීමට අවශ්‍ය නම්, ඔවුන්ට ක්‍රියාත්මක වීමට විදුලිය අවශ්‍ය වන මෝටර් සහ නල සවි කිරීමට සිදු වේ. එය ඔවුන්ගේ පිරිවැය බරට එකතු වන අතිරේක වියදමකි.

<u>මූල්‍ය</u>

ක්ෂුද්‍ර මූල්‍ය පොලී අනුපාත අතිශයින් ඉහළය. ඇතැම් විට විවිධ සමාගම්වල එය 17% දක්වා වේ. බොහෝ නිෂ්පාදකයින් පෙර ණය පියවීම සඳහා නැවත නැවතත් ණය ගනිති. මුස්ලිම් කාන්තාවන් කියා සිටියේ තමන්ගේ ආගමික සිරිත් විරිත්වලට අනුකූලව තමන් ණය ගැනීම සම්පූර්ණයෙන්ම මගහරින බවයි.

භෞතික

ඇතැම් නිෂ්පාදකයින් සැකසීම සඳහා වන යන්ත්‍ර සූත්‍ර වැනි භෞතික සම්පත් සම්බන්ධයෙන් අභියෝගයකට මුහුණ දෙමින් සිටී. සාමූහිකයන්ට ඇඹරුම් යන්ත්‍ර (grinders), මිශ්‍රණ යන්ත්‍ර (mixers), වියළන යන්ත්‍ර (dryers) හෝ අනෙකුත් උපකරණවල පිරිවැය හවුලේ දැරීමට ධාරිතාව තිබිය හැකි නමුත්, තනි නිෂ්පාදකයින් ඒ සඳහා දැඩි උත්සාහයක යෙදෙති.

මෙම නිෂ්පාදකයින්ගෙන් බොහෝ දෙනෙක් තම නිෂ්පාදන සැකසීම සඳහා ගොවීන්ගෙන් හෝ ධීවරයින්ගෙන් අමුද්‍රව්‍ය මිල දී ගනිති. මිල ගණන් උච්ඡාවචනය වීමෙන් අදහස් වන්නේ මෙම අමුද්‍රව්‍ය ඉතා මිල අධික වන හෝ ඔවුන්ට මිල දී ගත නොහැකි කාලසීමාවන්ට ඔවුන් මුහුණ දෙන බවයි.

**ගබඩා කිරීම**

නිෂ්පාදකයින් භාණ්ඩ ගෘහස්ථ මට්ටමින් ගබඩා කරන අතර, එමඟින් ඔවුන්ට නිෂ්පාදනය කළ හැකි පරිමාණය සීමා වේ. එයින් අදහස් කරන්නේ ඔවුන්ට ආදායමක් අවශ්‍ය වූ විට, පසු දිනක දී විකිණීම සඳහා තම නිෂ්පාදන තබා ගැනීමට නොහැකි වන බවයි. අමුද්‍රව්‍ය සහ නිමි භාණ්ඩ ගබඩා කිරීම අභියෝගයකි.

**ආයතනඃ**

කොමිසමට සහභාගී වූ කුඩා පරිමාණ නිෂ්පාදකයින් සියල්ලම ප්‍රාදේශීය රාජ්‍ය නොවන සංවිධාන හෝ පුහුණු සහය ලබා දුන් ප්‍රජාව පදනම් කරගත් සංවිධාන සමග සම්බන්ධ වී සිටියහ. කාන්තා ග්‍රාමීය සංවර්ධන සමිති (WRDS) හරහා ඔවුන්ගේ ජාල මගින් ඔවුන්ට පාරිභෝගිකයින් වෙත සහ නිෂ්පාදන විකිණීමට ස්ථාන සඳහා යම් ප්‍රවේශයක් ලැබුණි. කෙසේ වෙතත්, මෙම ප්‍රවේශය අසමාන වන අතර, එවැනි සහයෝගයක් ලබා ගැනීම සඳහා රජය හෝ රාජ්‍ය නොවන සංවිධාන විසින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් පිළිබඳ ව බොහෝ දෙනෙකු දැනුවත් නොවීම මඟින් මෙය තවත් සංකීර්ණ වේ.

**ශ්‍රමයඃ**

මෙම වර්ගයේ ආහාර නිෂ්පාදන විවිධ ක්‍රම මඟින් සිදු කෙරේ. ඇතැම් ස්ථානවල, මිනිසුන් සාමූහිකයන් පිහිටුවාගෙන ආහාර හෝ සැකසූ භාණ්ඩ එකට නිෂ්පාදනය කරති. තරමක් විශාල පරිමාණයෙන් ක්‍රියාත්මක වන අනෙකුත් නිෂ්පාදකයන්ට, වැඩ සඳහා කුලී ශ්‍රමිකයන්ගේ සේවය ලබා ගැනීමේ හැකියාව පවතී.

අනෙක් අවස්ථාවල දී, පුද්ගලයන් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් තම නිවෙස් තුළ ම නිෂ්පාදනය සිදු කරති. උදාහරණයක් ලෙස, එක් සහභාගිවන්නෙකු පැවසුවේ නිෂ්පාදනය ගෘහස්ථ සාමාජිකයින් දෙදෙනෙකු විසින් සිදු කරනු ලබන අතර, එය අධික වැඩ බරක් නිර්මාණය කරන බවයි. නිෂ්පාදනය සහ නිවසේ රාජකාරි සමබර කර ගැනීම සඳහා අලුයම වැඩ කරන වේලාවන් අවශ්‍ය වේ.

නිවස පදනම් කරගත් මෙම ආහාර සහ අගය එකතු කළ නිෂ්පාදකයින්ගෙන් බහුතරය කාන්තාවන් වේ. එසේ කිරීමෙන්, ඔවුන් නිවසේ මෙන්ම නිෂ්පාදන කටයුතු දෙකෙහිම ශ්‍රමයෙන් වැඩි කොටසක් උසුලති. කුලී ශ්‍රමය හෝ ළමා සුරැකුම් සඳහා ස්ථාවර ප්‍රවේශයක් නොමැත.

**පරිභෝජනයඃ**

දේශීය ව නිෂ්පාදනය කරන සහල්, සම්බෝල, අච්චාරු සහ කිරි නිෂ්පාදන කුටුම්භයන් විසින් පරිභෝජනය කරන අතර අසල්වැසියන්ට ද අලෙවි කරනු ලබයි. සහභාගිවන්නන් පෙන්වා දුන්නේ ආහාර මිල ගණන්, විශේෂයෙන්ම පෝෂණීය ආහාර සහ නිෂ්පාදනවල මිල ඉහළ යමින් පවතින බවයි. එබැවින් ගෙවත්තක් පවත්වාගෙන යන කුටුම්භයන් සම්පූර්ණයෙන් ම පාහේ තමන්ගේ ම නිෂ්පාදන මත යැපීම සිදුවන්නකි. බොහෝ පවුල් වේලකට එක එළවළු ව්‍යංජනයක් වත් මෙතුළින් ලබා ගනිති. භාණ්ඩ හුවමාරු ක්‍රම මඟින් ප්‍රජාවේ ආහාර සුරක්ෂිතතාව ශක්තිමත් වන අතර ගමේ බොහෝ නිවෙස්වලට පෝෂණීය නිෂ්පාදන රාශියකට ප්‍රවේශය ඇති බව එමඟින් සහතික කෙරේ.

## සාධාරණ ආහාර පද්ධතියක් වෙත පරිවර්තනය වීම සඳහා ඇති ව්‍යුහාත්මක බාධාවන්

සාධාරණ ආහාර පද්ධතියක් ගොඩනැගීමට බාධාවන් රාශියක් ඇත. අපගේ උපදේශන වාරයන් පුරා, ජනතාව විසින් ම මතු කරන ලද මෙවැනි අභියෝග රැසක් කොමිසම වෙත ඉදිරිපත් විය. මේවා පවතින සියලුම බාධකවල සම්පූර්ණ ලැයිස්තුවක් නොවන නමුත්, එක් එක් ප්‍රදේශවල ජනතාව වඩාත් පීඩාකාරී යැයි සලකන ව්‍යුහාත්මක බාධාවන් මෙයින් නිරූපණය වේ.

මිලිටරිකරණය, යටත් විජිත යුගයේ වතු ව්‍යුහයන් සහ නව කෘෂිකාර්මික ව්‍යාපාරික සැකසුම් මගින් ප්‍රජාවන්ට ආහාර නිෂ්පාදනය කිරීමට ඇති අවස්ථාව හුදෙක් අවහිර කිරීම පමණක් සිදු නොකරයි. ඔවුන්ගේ නිෂ්පාදන ක්‍රියාවලිය වෙළෙඳපොළ තුළ දේශීය වගාකරුවන් අඩපණ කරයි. එසේ ම, එම නිෂ්පාදන ඉලක්ක කර ඇත්තේ ඔවුන් අත්පත් කරගෙන සිටින ඉඩම්වලට බොහෝ දුරින් පිහිටි ප්‍රභූ හෝ අපනයන වෙළෙඳපොළවල් වේ. ප්‍රජාවන් තමන් වගා කරන දෙයින් කොටසක් විකිණීමට අදහස් කළ ද, ඔවුන්ගේ ආහාර නිෂ්පාදන සම්බන්ධතාව එදිනෙදා පරිභෝජනය, පවුලේ පැවැත්ම සහ ප්‍රජා සබඳතා සමඟ බැඳී පවතී. මෙය ආයතනික සහ මිලිටරි ආකෘතිවල දක්නට නොලැබෙන ලක්ෂණයකි.

තීරණ ගැනීමේ දී, විශේෂයෙන් ඉඩම් සහ වගාවන් සම්බන්ධයෙන් තීරණ ගන්නේ කවුරුන් ද යන්න පිළිබඳ ව පීතෘ මූලිකත්වය සහ ස්ත්‍රී පුරුෂ භාවය දැඩි ලෙස බලපායි. ආහාර නිෂ්පාදනයේ දී සහ සාම්ප්‍රදායික දැනුම ආරක්ෂා කිරීමේ දී කාන්තාවන් දිගු කලක් තිස්සේ අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කර ඇති නමුත්, කෘෂිකාර්මික ශ්‍රමය පිළිබඳ ප්‍රධාන ධාරාවේ අවබෝධය තුළ මෙම භූමිකාවන් නොසලකා හරිනු ලැබේ.

### හමුදාව විසින් ඉඩම් අත්පත් කර ගැනීම සහ ආහාර පද්ධතිය

උතුරු පළාතේ විශාල ඉඩම් ප්‍රමාණයක් තවමත් හමුදාව යටතේ පවතී. එම ප්‍රදේශවල හමුදාව යටතේ තිබූ සමහර ඉඩම් සිවිල් වැසියන්ට නිදහස් කර ඇති අතර, නමුත් යුද්ධය අවසන් වී වසර දාහතකට පසුවත්, ආරක්ෂක යටිතල පහසුකම් පුළුල් කිරීම සඳහා නව ඉඩම් අත්පත් කරගෙන ඇත. වලිකාමම් උතුර පලාලි ප්‍රදේශයේ පමණක් අක්කර 3,000 කට ආසන්න ප්‍රමාණයක් තවමත් හමුදා පාලනය යටතේ පවතී. මෙම කලාපය තුළ තිබූ සිවිල් වැසියන්ගේ නිවාස බුල්ඩෝසර් කර විනාශ කර ඇත. සිවිල් අයිතිකරුවන් විසින් සිදුකරන ලද අධිකරණ ක්‍රියාමාර්ග සහ විරෝධතාවලින් පසුව, ගමන් කළ හැක්කේ කාට ද සහ කවදා ද යන්න පිළිබඳ දැඩි නීති රීති යටතේ මාර්ග කිහිපයක් විවෘත කර ඇත.

මෙම කලාපයේ නිවාස තිබූ පදිංචිකරුවන් ඉඩම සමඟ සමීප සබඳතාවක් පවත්වමින් ජීවත් වූහ. පොල්, කොස් සහ අඹ වැනි ස්වභාවික ව වැඩෙන බහු වාර්ෂික ගස් එම පවුල් වලට වසර පුරා ආහාර ලබා දුන්නේ ය. මීට අමතර ව ඔවුන් කෙසෙල්, එළවළු සහ මිරිස් ද වගා කළහ. දැන් අවතැන් වී කුලී නිවාසවල හෝ ඥාතීන් සමඟ ජීවත් වන ඔවුන්ට පෙර පරිදි ඉඩම් පරිහරණය කිරීමට හෝ වගා කිරීමට අවස්ථාවක් නොමැත. තමන්ගේ ම ඉඩමක වගා කරමින් සහ ගෙවත්තකින් නිෂ්පාදන ලබා ගනිමින් ලබාගත් ස්වයංපෝෂිතභාවය අවතැන් වීමත් සමඟ ඔවුන්ට අහිමි වී ඇත.

තම පවුල් කලින් පදිංචිව සිටි ඉඩම්වල යුද හමුදාව දැන් බඩඉරිඟු, පොල්, කෙසෙල්, බණ්ඩක්කා, මිරිස්, අඹ සහ වම්බටු වගා කරමින්, සත්ව පාලනය පවත්වාගෙන යමින් සහ යෝගට් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාමත් සමඟ මෙම පාඩුව තවත් දරුණු වේ. මෙම භාණ්ඩ සාමාන්‍ය සිවිල් නිෂ්පාදකයන්ට ලබා දිය නොහැකි අඩු මිලකට හමුදාව විසින් දේශීය වෙළෙඳපොළට මුදා හරින අතර, එමගින් අවතැන් වූ ප්‍රජාවන්ගේ සමස්ත ආර්ථිකය ම අඩපණ වේ. සමහර අවස්ථාවල දී, එම ඉඩම්වල කලින් පදිංචි ව සිටි අයට දැන් හමුදාව විසින් දෛනික වේතනයක් ගෙවනු ලබන කම්කරුවන් ලෙස තමන්ගේම ඉඩමේ වැඩ කිරීමට සිදු වී ඇති බව සැසිවාරයට සහභාගි වූ අය සඳහන් කළහ. රැකියාවක් සොයා ගැනීම අපහසු ආර්ථික තත්ත්වයක් තුළ, සුළු ආදායමක් හෝ සහතික කරන මෙම රැකියා කිරීමට ජනතාව පෙළඹේ. හමුදාවට තම ඉඩම්වලින් ඉවත් වන ලෙසත්, තමන්ට නැවත ප්‍රවේශ වීමට අවශ්‍ය ගොවිපොළවල් සහ පූජනීය ස්ථාන වැනි පොදු ස්ථාන පිළිබඳවත් සඳහන් කරමින් මෙම ප්‍රජාවන් විරෝධතා රාශියක් සිදු කර ඇත. මේ සම්බන්ධයෙන් අධිකරණයේ නඩු පවරා තිබුණ ද, ඉඩම් අත්පත් කර ගැනීම තවමත් එලෙසම පවතී.

**වතුකර ඉඩම්, දේශපාලන ආන්තිකරණය සහ ආහාර පද්ධතිය**

මධ්‍යම කඳුකරයේ කොමිසමට සහභාගී වූ ගොවීන් සහ කෘෂිකාර්මික කම්කරුවන් පෙන්වා දුන්නේ, ඔවුන්ගේ වගා කිරීමේ හැකියාව තීරණය කරන්නේ ඔවුන් ජීවත් වන වතු කළමනාකාරීත්වය විසින් බවයි. සමහර වතුවල, පරම්පරා ගණනාවක් තිස්සේ යම් බිම් කොටසක් වගා කළ පවුල්වලට සහ පුද්ගලයන්ට එය දිගටම කරගෙන යාමට අවසර ලැබේ. වගාවේ පවතින දිගුකාලීන ස්වභාවය නිසා වතු කළමනාකාරීත්වය දැන් එයට ඉඩ ලබා දී ඇත. එහෙත් අනෙකුත් වතුවල කම්කරුවන් තමන්ගේ ලයින් කාමර ඉදිරිපිට ඇති කුඩා ඉඩක හෝ යමක් වගා කිරීමට උත්සාහ කරන මොහොතේම එයට එරෙහි ව දැඩි පියවර ගනු ලැබේ. සහභාගි වූ පිරිස් විස්තර කළේ ඔවුන් කෙසෙල් හෝ කුඩා පොල් පැල වගා කිරීමට උත්සාහ කළ ද, ඒවා වැඩෙන්නට පටන් ගන්නා විට වතු කළමනාකාරීත්වය විසින් සේවකයන් එවා එම ගස් කපා දමා පැල ඉවත් කරන බවයි.

මෙම සීමා කිරීම් ක්‍රියාත්මක කිරීමේ දී පැහැදිලි වාර්ගික අසමානතාවක් පවතී. වගා කිරීමට සහ කුඩා ව්‍යාපාර ආරම්භ කිරීමට උත්සාහ කරන කම්කරුවන්ට දැඩි සීමාවන් පනවා ඇත. කෙසේ වෙතත්, වතුකරයට කිසිදු සම්බන්ධයක් නැති, සමහර විට ආසන්න ගම්මානයෙන් හෝ නගරයෙන් පැමිණෙන පිටස්තර පුද්ගලයන්ට වතුයාය තුළ තමන්ට රිසි සේ වගා කිරීමට සහ ඉදිකිරීම් කිරීමට අවසර ලැබේ. මෙවැනි තත්ත්වයන් යටතේ මලෙයාහ දෙමළ කම්කරුවන්ට තම නිවස ඉදිරිපිට මිරිස් පැල කිහිපයක් පවා වගා කිරීමට තහංචි පනවා ඇති අතර, ගමේ සිංහල ජනතාවට වතු ඉඩම් තුළ තේ වගා කිරීමට පවා අවසර දී ඇත. මෙම තොරතුරු මධ්‍යම කඳුකරයේ හැටන් හී මෙන් ම දකුණු කඳුකරයේ දෙනියාය ප්‍රදේශයේ පැවැත් වූ සැසිවාරවල දී ද ඉදිරිපත් විය.

සහභාගි වූ කිහිප දෙනෙකු සඳහන් කළේ තම නිවාස ඉදිරිපිට කුඩා ප්‍රමාණවලින් වගා කිරීමට තමන්ට අවසර ලැබුණු බවයි. මිරිස් සහ මඤ්ඤොක්කා මෙලෙස වගා කිරීමෙන් ඔවුන්ගේ මාසික ගෘහ වියදම් අඩු කර ගැනීමටත්, සීමිත ආදායම අනෙකුත් අත්‍යවශ්‍ය දේ සඳහා ඉතිරි කර ගැනීමටත් හැකි වූ බව ඔවුහු පැවසූහ.

ඉඩම් සහ නිවාස හිමිකම දශක ගණනාවක් තිස්සේ මලෙයහ දෙමළ ප්‍රජාවේ දේශපාලන ඉල්ලීම්වල ඉහළින් ම ඇත. පරම්පරා ගණනාවක් තිස්සේ ලයින් කාමරවල ජීවත් වෙමින් වැඩ කළ ද, ශ්‍රම බලකාය තමන් යටතේ තබා ගැනීමට අවශ්‍ය නිසා වතු සමාගම් විසින් ක්‍රමානුකූල ව ඔවුන්ගේ අයිතිය ප්‍රතික්ෂේප කරනු ලබයි. මෙම ප්‍රතික්ෂේප කිරීම හුදෙක් නිවාස ප්‍රශ්නයක් පමණක් නොවේ. එය ආහාර පද්ධතියට පූර්ණ ලෙස දායක වීමට එම ප්‍රජාවට ඇති අයිතියට සෘජු හා දරුණු බලපෑම් ඇති කරයි. ශ්‍රී ලංකාවේ, රජය විසින් පවත්වාගෙන යනු ලබන ගොවිජන සේවා මධ්‍යස්ථානවල ලියාපදිංචි වීම සඳහා ඉඩම් ඔප්පුවක් තිබීම පූර්ව අවශ්‍යතාවකි. මෙම ලියාපදිංචිය නොමැති ව ගොවියෙකුට ව්‍යාප්ති සේවා, වෙළෙඳපොළ තොරතුරු, පුහුණුව, සහනාධාර හෝ ගොවි සංවිධානවල සාමාජිකත්වය ලබා ගත නොහැක. වාරිමාර්ග සංවිධාන ද පිළිගන්නේ ඉඩම් හිමි ගොවීන් පමණි. මෙයින් අදහස් කරන්නේ මෙම ඉඩම්වල වගා කරමින් තම පවුල් පෝෂණය කළ මලෙයහ දෙමළ වතු කම්කරුවන් බොහෝ දෙනෙකු විධිමත් කෘෂිකාර්මික ආධාර පද්ධතියෙන් සම්පූර්ණයෙන් ම බැහැර වී ඇති බවයි.

මෙම බැහැර කිරීම මගින් වතු ආර්ථිකය ඓතිහාසික ව සැලසුම් කර ඇති ආකාරය පෙන්වා දෙයි. බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනය යටතේ ශ්‍රී ලංකාවට ගෙන එන ලද මලෙයහ දෙමළ ප්‍රජාව වැවිලි පද්ධතියට ඇතුළත් කර ගනු ලැබුවේ සිරකර තැබූ ශ්‍රම බලකායක් ලෙස ය. නිදහස ලබා දශක ගණනාවකට පසුවත්, එම සැකසුමේ ව්‍යුහාත්මක තත්ත්වයන් තවමත් පවතී. ඉඩම් ලබා නොදීම, නිවාස රැකියාව සමඟ බැඳ තිබීම සහ ස්වාධීනව වගා කිරීමේ හැකියාව සීමා කිරීම මීට ඇතුළත් වේ. මෙය අහම්බෙන් සිදු වූවක් නොව, ශ්‍රම පාලනය පවත්වාගෙන යාම සඳහා වූ හිතාමතා ඇති කළ යාන්ත්‍රණයකි. මෙහි ප්‍රතිවිපාක ආහාර සුරක්ෂිතතාවට මෙන් ම දේශපාලන හඬට ද බලපායි. ගොවිජන සංවිධානවලින් සහ වාරිමාර්ග ආයතනවලින් බැහැර කිරීම මගින් ගොවීන්ට තම ගැටලු ඉදිරිපත් කිරීමට, ප්‍රතිපත්ති හැඩගැස්වීමට සහ සාමූහික ව බලපෑම් කිරීමේ බලය ගොඩනැගීමට ඇති අවකාශය අහිමි කරයි. විශේෂයෙන් ම වතු ආශ්‍රිත ආහාර නිෂ්පාදනයේ වැදගත් කාර්යභාරයක් ඉටු කරන මලෙයහ දෙමළ කාන්තාවන් දෙගුණයකින් බැහැර

කරනු ලබන්නේ ස්ත්‍රී පුරුෂ භාවය නිසා සහ කුලී කම්කරුවන් ලෙස වර්ගීකරණය කරන, කුල මත පදනම් වූ ශ්‍රම ධූරාවලිය මගිනි. වතු ක්‍රමය මගින් මලෙයහ දෙමළ ජනතාවට තමන් පදිංචි ඉඩමේ අයිතිය අහිමි කිරීම පමණක් නොව, ඔවුන් ගොවීන් ලෙස හඳුනා ගැනීම පවා වළක්වා ඇත. මෙහි ප්‍රතිඵලය වී ඇත්තේ ආහාර නිෂ්පාදනයට ගැඹුරින් සම්බන්ධ වී සිටිය ද, තමන්ගේ ම ආහාර පිළිබඳ අනාගතය තීරණය කිරීමට ඉඩ සලසන අයිතිවාසිකම්, සම්පත් සහ ආයතනික පිළිගැනීමෙන් ක්‍රමානුකූලව බැහැර කරන ලද ප්‍රජාවක් බිහි වීමයි.

**කෘෂිකාර්මික ව්‍යාපාර සහ ආහාර පද්ධතිය සමාගම්කරණය වීම**

ඌව පළාත සිසිල් කඳුවල සිට වියළි තැනිතලා දක්වා විවිධ පරිසර පද්ධතිවලින් සමන්විත ය. කඳුකර ප්‍රදේශයේ තේ වතු බහුල වුව ද, 1980 දශකයේ සිට වියළි කලාපයේ විශාල ප්‍රදේශයක් වාණිජ කෘෂිකර්මාන්තය සඳහා එළි පෙහෙළි කර ඇත. මෙයින් විශාලතම එකක් වන්නේ සීනි නිෂ්පාදනය සඳහා උක් වගා කිරීමට රජයට අයත් ලංකා සීනි සමාගම පැල්වත්ත සහ සෙවණගල ප්‍රදේශවල ගෙන යන උත්සාහයයි. මෙම වතු ක්‍රම දෙකකට නිෂ්පාදනය කරයි. වැව්ලි අක්කර ප්‍රමාණයට තම ඉඩම් පවරා දුන් ප්‍රදේශයේ ගොවීන්, තම අස්වැන්න නැවත කර්මාන්ත ශාලාවට විකුණන පිටස්තර වගාකරු ආකෘතියක් (out grower model) යටතේ වැඩ කරති. වගා කිරීම සඳහා පිටතින් ගෙන ආ අයට කළමනාකරණය කිරීමට අක්කර ප්‍රමාණයක් ලබා දේ. උක් වගාව නිසා ප්‍රදේශයේ උෂ්ණත්වය ඉහළ ගොස් ඇති අතර, උක් ගස් මගින් පොළොවෙන් විශාල ජල ප්‍රමාණයක් උරා ගන්නා බැවින් නියඟ පවා ඇති වී තිබේ. එය නඩත්තු කිරීම සඳහා භාවිත කරන අධික රසායනික ද්‍රව්‍ය ප්‍රමාණය කෙතරම් ද යත්, පසෙහි වෙනත් ඕනෑ ම වගාවක් කිරීමට පවා දැන් දැඩි රසායනික යෙදවුම් අවශ්‍ය වේ.

කර්මාන්ත ශාලාව සඳහා වගා කරන ගොවීන්ට ඔවුන්ගේ ඉඩමේ වෙනත් කිසිදු බෝගයක් වගා කළ නොහැකි ලෙස කොන්දේසිය පනවා ඇත. හේන් වගාවේ සිට උක් ඒකභෝග වගාව දක්වා මාරු වීම නිසා, සමබර ආහාර වේලක් ලබා ගැනීමට හෝ අලෙවි කිරීමට විවිධ නිෂ්පාදන නොමැති වීමෙන් ගොවීන් සහ පවුල් පීඩාවට පත් වී ඇත. එක් බෝගයක් මත මෙලෙස යැපීම නිසා මිල උච්චාවචනයන්, දේශගුණික විපර්යාස සහ තමන්ට පාලනය කළ නොහැකි කර්මාන්තශාලා තීරණ හමුවේ ගොවි පවුල් දැඩි අනතුරකට ලක් වී ඇත. උපදේශන වාරයන්ට සම්බන්ධ වූ කාන්තා ගොවීන් නිරීක්ෂණය කර ඇති පරිදි, ඔවුන්ගේ දෙමාපියන්ගේ පරම්පරාවේ දී ගොවි පවුලක් ආහාර හිඟයකට මුහුණ දීම අසාමාන්‍ය දෙයකි. අද වන විට එක් බෝගයක් පමණක් වගා කරන ගොවීන්ට තම පවුල් නිසි ලෙස පෝෂණය කිරීමට හෝ වෙළෙඳපොළේ විශ්වාසදායක ලෙස අලෙවි කිරීමට හෝ නොහැකි වී තිබේ.

ජනතා විරෝධතා හේතුවෙන් උක් වගාව සඳහා ඌව පරිසරය සහ ගොවිතැන් රටා තවදුරටත් විනාශ කිරීම නතර වී ඇත. එවැනි විරෝධතා මගින් ආයෝජන ලෙස රට ට අවශ්‍ය විදේශ විනිමය ලැබීම අඩපණ වන බවට බොහෝ විට තර්ක ඉදිරිපත් වේ. මෙමගින් ජාතික ආර්ථික ප්‍රතිපත්තියේ බර දැනටමත් එහි පිරිවැය දරන ප්‍රජාවන් මත පටවන අතර, සමාගම් වගවීමෙන් නිදහස් කරයි. ඌව පළාතේ මෙම තත්ත්වය උක් අංශයට පමණක් සීමා වූවක් නොවේ. එය කෘෂිකාර්මික ව්‍යාපාර ව්‍යුහයන් ශ්‍රී ලංකාවේ ආහාර පද්ධති හැඩගස්වන සහ සීමා කරන ආකාරය පිළිබඳ පුළුල් රටාවක් පිළිබිඹු කරයි. 1960 දශකයේ හරිත විප්ලවයේ සිට ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ රසායනික යෙදවුම් භාවිතය ශීඝ්‍රයෙන් වර්ධනය වී ඇති අතර, එය ඒකභෝග වගා ක්‍රමවලට පක්ෂව තිරසාර, දැනුම මත පදනම් වූ ක්‍රම අත්හැරීමට ගොවීන්ට බල කර ඇත. පස නිසරු වීම, පාරිසරික බාධා සහ වියළි කලාපයේ නිදන්ගත වකුගඩු රෝගය (CKDu) පැතිරීම මෙහි ප්‍රතිවිපාක වේ.

බීජ සමාගම්කරණය වීම මෙම යැපීම තවදුරටත් ගැඹුරු කර ඇත. කලෙක ගොවීන්, විශේෂයෙන්ම කාන්තා ගොවීන්, දේශීය බීජ වර්ග සුරැකීම සහ හුවමාරු කර ගැනීම සිදු කළ නමුත් දැන් එය සම්පූර්ණයෙන් ම කෘෂිකාර්මික ව්‍යාපාරික සමාගම් වෙත පැවරී ඇත. ගොවීන් දැන් තමන්ගේ පාරිසරික හා ප්‍රජා දැනුම භාවිත කරනවා වෙනුවට සෑම කන්නයකම සමාගම් වලින් බීජ හා අනෙකුත් දෑ මිල දී ගනිති. සහභාගි වූ අය සඳහන් කළ පරිදි, බීජ, ට්‍රැක්ටර් කුලියට ගැනීම සහ අනෙකුත් සැපයුම් සඳහා වැඩි වැඩියෙන් සමාගම් මත යැපෙන්නට සිදු ව අතර, සාම්ප්‍රදායික ගොවිතැන් ක්‍රම ක්‍රමයෙන් විනාශ වෙමින් පවතී.

කෘෂිකාර්මික ව්‍යාපාරවල බලපෑම ගොවි බිමෙන් ඔබ්බට ප්‍රතිපත්ති දක්වා ම විහිදේ. කාර්මිකකරණය, නාගරික සංවර්ධනය සහ අපනයන ඉලක්ක කරගත් නිෂ්පාදනයට ප්‍රමුඛත්වය දෙන සාර්ව ආර්ථික ප්‍රතිපත්ති දේශීය කෘෂිකර්මාන්තය අඩපණ කර ඇත. මෙම ක්ෂේත්‍රය දැන් වාණිජ අවශ්‍යතා මත හැඩගැසී ඇත. ගොවීන්ට ඒකභෝග වගාව දිරිමත් කරන උපදෙස් ලැබෙන අතර, සහනාධාර ව්‍යුහයන් මගින් රසායනික යෙදවුම් මිල දී ගැනීම දිරිමත් කෙරේ. ග්‍රාමීය කෘෂිකර්මාන්තය සඳහා රජයේ ආයෝජනය ශීඝ්‍රයෙන් පහත වැටී ඇති අතර, පෞද්ගලික කෘෂිකාර්මික ව්‍යාපාර එම අඩුව පිරවීමට පැමිණ ඇත්තේ තමන්ගේ ම කොන්දේසි මත ය. මෙය ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීමට වඩා යැපීම වැඩි කරයි. මෙම බාධාවන් අයිතිවාසිකම්වලට වඩා ලාභය ආරක්ෂා කිරීම සඳහා හිතාමතා ම සකස් කරන ලද ප්‍රතිපත්තිවල ප්‍රතිඵල වේ.

**ආහාර පද්ධතිය තුළ පීතෘමූලිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය**

ශ්‍රී ලංකාවේ ආහාර පද්ධතිය තුළ කාන්තාවන් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. බෝග වගා කිරීම, සත්ව පාලනය, ආහාර පිළියෙළ කිරීම, බීජ සංරක්ෂණය සහ පරම්පරා ගණනාවක් පුරා සාම්ප්‍රදායික දැනුම ලබා දීම වෙනුවෙන් ඔවුන් කටයුතු කර ඇත. දකුණු ආසියාවේ වගා කරන ආහාරවලින් 50% කට වඩා වැඩි ප්‍රමාණයක් නිපදවීමට කාන්තාවන් දායක වේ. එහෙත් මෙවැනි ප්‍රධාන භූමිකාවක් තිබිය දී ත්, ආහාර පද්ධතිය තුළ ඔවුන්ට ලැබෙන ගෞරවය, පිළිගැනීම සහ අවස්ථාවන් ඉතා සීමිත ය. කාන්තාවන් ගොවීන් හැටියට විධිමත් ලෙස හඳුනා ගන්නේ කලාතුරකිනි. ශ්‍රී ලංකාවේ 'ගොවියා' යන නාමය ලැබීමත් සමඟ ඉඩම් ලියාපදිංචිය, ගොවිජන ආධාර සේවා, ණය, වෙළෙඳපොළ සහ ආයතනික නියෝජනය සඳහා ප්‍රවේශය ලැබේ.

මෙහි මූලික බාධකය වන්නේ ඉඩම් හිමිකමයි. ගෝලීය වශයෙන් කාන්තා ගොවීන්ට හිමි වන්නේ ඉඩම්වලින් 2% ක් පමණක් වන අතර, ශ්‍රී ලංකාව ද මෙයට ව්‍යතිරේකයක් නොවේ. ඉඩම් ඔප්පුවක් නොමැතිව කාන්තාවන්ට ගොවිජන සේවා මධ්‍යස්ථානවල ලියාපදිංචි විය නොහැකි අතර, එය රජයේ සහනාධාර සහ අනෙකුත් සේවාවන්ට ඇති දොරටුවයි. ඔවුන් ගොවි සංවිධානවල සාමාජිකත්වය සඳහා නුසුදුස්සන් වන බැවින් සාමූහික ව කටයුතු කිරීමට හෝ ප්‍රතිපත්ති හැඩගැස්වීමට ඇති හැකියාව අහිමි වේ. මෙම අවකාශයන්ගෙන් බැහැර කිරීම නිසා ඔවුන්ට නිෂ්පාදකයින් ලෙස ඇති අනන්‍යතාව සහ විධිමත් පිළිගැනීම අහිමි වන බව උපදේශනවලදී අනාවරණය විය.

ග්‍රාමීය කාන්තාවන්, විශේෂයෙන් ම කාන්තා ගොවීන්, නිෂ්පාදන හා ප්‍රජනන වගකීම් දෙකම සලකා බැලූ විට පිරිමින්ට වඩා දිනකට වැඩි පැය ගණනක් වැඩ කරන නමුත්, මෙම ශ්‍රමය සඳහා ලැබෙන ගෙවීම් අඩු අතර, එය අගය කිරීමක් ද සිදු නොවේ. කාන්තාවන්ගේ කෘෂිකාර්මික භූමිකාවන් බොහෝ විට ගෘහස්ථ වැඩ සමඟ සිදු කෙරෙන අතර, ඒවා ආර්ථික ක්‍රියාකාරකමකට වඩා පවුලේ වගකීමක් ලෙස වර්ගීකරණය කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, දිනපතා ගොවිතැන් කටයුතුවල නිරත වුව ද, කාන්තාවන් සහ ඔවුන්ගේ ප්‍රජාවන් ඔවුන්ව ගොවීන් ලෙස හඳුනා නොගනිති.

කාන්තා ගොවීන් ඓතිහාසික ව දේශීය බීජ වර්ග සහ සාම්ප්‍රදායික ගොවිතැන් ක්‍රමවල ප්‍රධාන භාරකරුවන් වී ඇත. බීජ සමාගම්කරණය වීම මගින් මෙම භූමිකාව විනාශ කර ඇත. බීජ කෙරෙහි සමාගම් පාලනය පැවතීම නිසා තමන්ගේ ප්‍රායෝගික කෘෂිකාර්මික කාර්යය මෙන්ම අනන්‍යතාව සහ ප්‍රජා තත්ත්වය ද අහිමි වී ඇති බව කාන්තා ගොවීන් පවසති. මෙයට ප්‍රතිචාර වශයෙන්, බොහෝ කාන්තා ගොවි කණ්ඩායම් ප්‍රජා බීජ බැංකු පිහිටුවා ඇත. මෙම මුලපිරීම් හුදෙක් ආහාර නිෂ්පාදන ක්‍රියාවක් පමණක් නොව, සමාගම් ආක්‍රමණය හමුවේ බීජ ස්වෛරීභාවය සහ ප්‍රජා ඔරොත්තු දීමේ හැකියාව තහවුරු කිරීමකි. එබැවින් බීජ සඳහා කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ යුක්තිය මෙන් ම ආහාර ස්වෛරීභාවය පිළිබඳ ගැටලුවක් ද වේ.

## නිර්දේශ

වර්තමානයේ පවතින ගෝලීය ආර්ථික හා දේශපාලන ක්‍රමය තුළ යුක්තිය, තිරසරත්වය සහ ස්වෛරීභාවය යන මූලධර්ම මත පදනම් ව ශ්‍රී ලංකාවේ ආහාර පද්ධතියේ සම්පූර්ණ පරිවර්තනයක් පිළිබඳ සිතාගත නොහැකි ය. ගෝලීය ප්‍රාග්ධනය සඳහා ලාභ උපරිම කිරීමේ අරමුණ මගින් මෙහෙයවනු ලබන වර්තමාන ක්‍රමය විසින් මුළු ලෝකය ම බහුවිධ අර්බුදවලට තල්ලු කර ඇත.

ශ්‍රී ලංකාව වැනි රටවලට අපගේ ආහාර පද්ධතියෙන් ආරම්භ කර පද්ධති පරිවර්තනයක් සඳහා ආදර්ශය තුළින් නායකත්වය දිය හැකිය. පහත සඳහන් නිර්දේශ මාලාව මගින් එම ඉලක්කය වෙත ළඟාවීම සඳහා වන ගමන ආරම්භ කළ හැකි ය.

1. ශ්‍රී ලංකා රජය ආහාර, ඉඩම්, ජලය, බීජ සහ පොදු සම්පත් වෙත ප්‍රවේශ වීම සඳහා ඇති අයිතිය මූලික අයිතිවාසිකම් ලෙස පිළිගත යුතු ය.

2. ශ්‍රී ලංකාවට ආහාර ස්වෛරීභාවය සහ කෘෂි පරිසර විද්‍යාව යන මූලධර්ම මත පදනම් ව කෘෂිකර්මාන්තය, ධීවර කර්මාන්තය සහ වෙළෙඳාම ඇතුළු ආහාර පද්ධතිය පිළිබඳ අපගේ ප්‍රතිපත්ති රාමුව ප්‍රතිසංස්කරණය කිරීමේ කඩිනම් ක්‍රියාවලියක් අවශ්‍ය කරයි. සියලුම දෘෂ්ටිකෝණයන් අන්තර්ගත කර ගනු ලබන බව සහතික කිරීම සඳහා රජය ප්‍රමාණවත් ප්‍රතිපෝෂණ මාර්ග සහිත ව, ආහාර නිෂ්පාදකයන්, පාරිභෝගිකයන්, විශේෂඥයන් සහ අනෙකුත් පාර්ශවකරුවන් සමග සාකච්ඡා කර මෙම ප්‍රතිපත්ති කෙටුම්පත් කිරීම සඳහා කමිටුවක් පත් කළ යුතු ය.

   ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණවලට සමගාමීව, රජය ආහාර ස්වෛරීභාවය සහ කෘෂිපරිසර විද්‍යාව ප්‍රවර්ධනය කිරීම පිණිස විවිධ පාර්ශ්වකරුවන් අතර ඒකාබද්ධ දැක්මක්, වැඩසටහන් රාමුවක් සහ සම්බන්ධීකරණයක් සහතික කරන, අදාළ බලධාරීන්, ආයතන සහ නිෂ්පාදකයන්ගේ සංවිධාන ඒකාබද්ධ කරමින් ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු ය.

   මෙම ක්‍රියාකාරී සැලැස්ම මගින් ජාතික මට්ටමේ සිට ප්‍රාදේශීය මට්ටම දක්වා නිසි සම්බන්ධීකරණයක් සිදුවන බව සහතික කළ යුතු අතර, විවිධ අංශවල පර්යේෂණ, නවෝත්පාදන සහ අධ්‍යාපන ප්‍රමුඛතා සඳහා මග පෙන්වීමක් ද සපයා දිය යුතු ය. එමෙන් ම, මෙම ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා ම වෙන් වූ අධිකාරියක් ස්ථාපනය කළ යුතු ය.

3. රජය විසින් කෘෂිපරිසර විද්‍යාව ප්‍රධාන ආහාර නිෂ්පාදන උපාය මාර්ගය බවට පත් කිරීම සඳහා අවශ්‍ය යාන්ත්‍රණ සකස් කළ යුතු ය. ගැමි ගොවීන්ගේ සහ ග්‍රාමීය ප්‍රදේශවල වැඩ කරන අනෙකුත් පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රකාශනයෙහි (UNDROP) අත්සන්කාර පාර්ශ්වයක් ලෙස ශ්‍රී ලංකා රජය වහා ම අවශ්‍ය නීති සහ පද්ධතිමය ප්‍රතිසංස්කරණ මගින් නියෝග බලාත්මක කිරීමට පියවර ගත යුතු ය.

4. රජය ආහාර ස්වෛරීභාවයේ මූලධර්මවලට ප්‍රමුඛත්වය දෙන ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තියක් සකස් කළ යුතු ය. මෙහි දී අර්ථාන්විත ලෙස ප්‍රජාවන්ගේ සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ අදහස් විමසීමේ ක්‍රියාවලියක් අනුගමනය කළ යුතුය. සංවර්ධන ව්‍යාපෘති, ආයෝජන ව්‍යාපෘති, මහා පරිමාණ වාණිජ ඒකබෝග වගා ව්‍යාපෘති හෝ තිරසාර බලශක්ති ව්‍යාපෘති සඳහා ස්වභාවික සම්පත්, ගොවිබිම්, තෘණ බිම් සහ ධීවර කර්මාන්තය සඳහා යොදාගන්නා ප්‍රදේශවල හිමිකාරිත්වය නැතිකිරීම සහ/හෝ ඒවා විනාශ කිරීම වහාම නතර කළ යුතු ය.

5. රජය සංචාරක, විදුලිබල උත්පාදන සහ වනජීවී සංරක්ෂණ වැනි අනෙකුත් අදාළ අංශවල අවශ්‍යතා සපුරාලන අතර ම, වාරි ජලය වෙන් කිරීමේ දී සහ බෙදා හැරීමේ දී රජය කෘෂිකර්මාන්තයට ප්‍රමුඛත්වය දිය යුතු ය. එවැනි ක්‍රියාමාර්ග ගැනීමේ දී පොදු සම්පත්වලට හානි නොකළ යුතු අතර, අදාළ ප්‍රදේශවල පාරිසරික සමතුලිතතාව ප්‍රවර්ධනය කර ආරක්ෂා කළ යුතු ය. ජලය වෙත ප්‍රවේශය මූලික අයිතියක් ලෙස සුදුසු ව්‍යවස්ථාදායක රාමු ඔස්සේ සහතික කළ යුතු අතර, එම අයිතිය උල්ලංඝනය කරන හෝ අභිබවා යන කිසිදු නෛතික හෝ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග යක් නොගත යුතු ය. තව ද, ප්‍රාදේශීය වශයෙන් එම ප්‍රදේශවල පුළුල් පරිසර පද්ධති සමග (උදා: එල්ලංගා පද්ධති) සමග ස්වභාවයෙන් ම සම්බන්ධ වී ඇති ග්‍රාමීය වාරිමාර්ග පද්ධති ශක්තිමත් කර ආරක්ෂා කරන අතර ම, ප්‍රාදේශීය කෘෂිකාර්මික පිළිවෙත් තුළ ඇති විවිධ සාම්ප්‍රදායික ජල පරිහරණ ක්‍රම හඳුනාගෙන ඒවාට අනුගත විය යුතු ය.

6. රජය ගොවීන් සාම්ප්‍රදායික බීජ ප්‍රභේදවල භාරකරුවන් ලෙස පිළිගත යුතු අතර, එමගින් ඔවුන්ට බීජ නිෂ්පාදනය කිරීමට, සංරක්ෂණය කිරීමට සහ හුවමාරු කර ගැනීමට ඉඩ සලසා දිය යුතු ය. එමෙන් ම, රජය මෙරට ජාතික බීජ බැංකුවල තිබෙන පහසුකම් සහ ඒවායෙහි කාර්යයන් ද වැඩිදියුණු කළ යුතු ය. ඒ මගින් ගොවීන් සමග එක් ව දේශීය බීජ නිෂ්පාදනය, ආරක්ෂාව සහ ව්‍යාප්තිය සිදු කළ යුතු ය. ගොවීන් සඳහා පූර්ණ බීජ ස්වෛරීභාවයක් සහතික කිරීම පිණිස ජානමය වශයෙන් වැඩිදියුණු කරන ලද බීජවල ආයතනික හිමිකාරිත්වය විසින් නිර්මාණය කරන ලද සීමාවන් ඉවත් කළ යුතු ය.

7. පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති මගින් ආහාර ස්වෛරීභාවයේ මූලධර්ම උල්ලංඝනය නොකළ යුතු අතර, ප්‍රජාපාදක සුනිත්‍ය බලශක්තිය දිරිමත් කළ යුතු ය.

8. ජාත්‍යන්තර මූල්‍ය ආයතන සහ ණය දෙන්නන් විසින් උපදෙස් දී ඇති පරිදි 'රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව' ආකෘතිය යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා රජයට අයත් වතු, ගොවිපොළ සහ පර්යේෂණ මධ්‍යස්ථාන බදු දීම සහ පුද්ගලීකරණය කිරීම රජය විසින් වහා ම නතර කළ යුතු ය.

9. ජාත්‍යන්තර සහ කලාපීය නිදහස් වෙළෙඳ ගිවිසුම් අත්සන් කිරීමේ දී රජය ජීවනෝපායන්ට සහ ආහාර ස්වෛරීභාවයට ප්‍රමුඛත්වය දිය යුතු ය. එවැනි ගිවිසුම්වල කොන්දේසි පමණක් පදනම් කරගෙන ආහාර ආනයනය කිරීම සහ අපනයනය කිරීම දේශීය ගොවීන්ගේ ආහාර නිෂ්පාදන ක්‍රියාවලීන්ට බලපෑම් එල්ල කරන අතර ම ගුණාත්මක ආහාර සඳහා ජනතාවට ඇති අයිතිය ද උල්ලංඝනය කරන බැවින් එම ගිවිසුම්වල කොන්දේසි පමණක් පදනම් කරගෙන ආහාර ආනයනය කිරීම සහ අපනයනය කිරීම නතර කිරීමට පියවර ගත යුතු ය.

10. ආහාර වෙළෙඳපොළට මැදිහත් වීමේ දී සහ නියාමනය කිරීමේ දී රජය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළ යුතු ය. නිෂ්පාදන සඳහා නිසි මිල ගණන් සහ නිෂ්පාදකයින් සඳහා දැරිය හැකි පිරිවැයක් සහතික කිරීම සඳහා වී අලෙවි මණ්ඩලය සහ ලංකා ධීවර සංස්ථාව වැනි රාජ්‍ය ආයතන ශක්තිමත් කළ යුතු ය. පාරිභෝගික කටයුතු අධිකාරිය වසර පුරා උපරිම සිල්ලර මිල (යෝජනා ක්‍රමය) වඩාත් දැඩි ලෙස ක්‍රියාත්මක කළ යුතු ය.

11. කාන්තාවන් විසින් මෙහෙයවනු ලබන නිෂ්පාදක සහ අලෙවිකරණ කණ්ඩායම් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, සම්පත් සහ ධාරිතා වැඩිදියුණු කිරීම මගින් සමුපකාර-පාදක සැකසුම් සහ අලෙවිකරණ පද්ධති ශක්තිමත් කිරීම සඳහා රජය සක්‍රීය ලෙස සම්බන්ධ විය යුතු ය.

12. ප්‍රජාවන්ගේ ප්‍රාදේශීය ආර්ථිකය සම්බන්ධයෙන් එම ප්‍රජාවන්ගේ ක්‍රියාකාරීත්වය සහ තීරණ ගැනීම ශක්තිමත් කරන ප්‍රජා ණය සහ ණය දීමේ ක්‍රමවලට සහාය වීම සඳහා රජය යාන්ත්‍රණ නිර්මාණය කළ යුතු ය. ප්‍රජාවන් විසින් ගොඩනගා ගෙන ඇති මෙවැනි ඉතුරුම් සහ මූල්‍ය ක්‍රියාවලීන්ට බලපාන නීති සහ නියමයන් අහෝසි කළ යුතු ය.

13. රජය කෘෂිකාර්මික, ජලජ සහ පශු සම්පත් නිෂ්පාදන සඳහා පොදු අයිතිය සහිත පිරිසැකසුම්, සංරක්ෂණ සහ ගබඩා පද්ධති ස්ථාපනය කළ යුතු ය. එම නිෂ්පාදන සඳහා ඇති ප්‍රජාවන්ට අයත් පහසුකම්වලට ද රජය විසින් සම්පත් සපයා දිය යුතු ය. මෙම පහසුකම්වලට අදාළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම ද ජාතික ආහාර ස්වෛරීභාවය ඇතිකිරීම සඳහා අත්‍යවශ්‍ය අවශ්‍යතාවක් බව සැලකිල්ලට ගත යුතු ය.

14. සුළු පරිමාණ ආහාර නිෂ්පාදක සාමූහිකවලට ඔවුන්ගේ වගාවන්ට සුදුසු තාක්ෂණයන් සහ යන්ත්‍රෝපකරණ සාධාරණ මිලකට මිල දී ගැනීම සඳහා ප්‍රවේශය තිබෙන බව රජය විසින් සහතික කළ යුතු ය. එවැනි යන්ත්‍රෝපකරණ හෝ යෙදුම් සඳහා සමුපකාර අයිතිය ලබා දිය යුතු ය. එයට අමතර ව, නිෂ්පාදකයන්ට සහ ප්‍රජාවන්ට තමන්ගේ ම තාක්ෂණයන් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය දැනුම ලබා ගැනීමට හැකිවන පරිදි අධ්‍යාපනය සඳහා පහසුකම් සහ ඒවා නඩත්තු කිරීමට අවශ්‍ය සහාය සේවා රජය විසින් සපයා දිය යුතු ය.

15. රජය ආහාර අලෙවිකරණය සහ ප්‍රචාරණය පිළිබඳ මාර්ගෝපදේශ සකස් කළ යුතු ය. වෙළෙඳ දැන්වීම්වල හෝ නිෂ්පාදන ලේබලවල සඳහන් කර ඇති, පාරිභෝගිකයන්ගේ සෞඛ්‍යයට අවදානමක් ඇති කරන ඕනෑම නොමග යවන තොරතුරකට එරෙහි ව නීතිමය පියවර ගත යුතු ය. එයට අමතර ව, ප්‍රාදේශීය ආහාර විකල්පවලට සහ ඒවායෙහි ප්‍රතිලාභවලට ප්‍රමුඛත්වය දෙන, ශක්තිමත් පාරිභෝගික අධ්‍යාපන විෂය මාලාවක් මගින් සෞඛ්‍ය සම්පන්න පරිභෝජනය ප්‍රවර්ධනය කිරීමට පියවර ගත යුතු ය.

16. දේශගුණික විපර්යාස සහ ආපදා වලින් ආහාර සුරක්ෂිතතාවට එල්ලවන දැඩි බලපෑම් සැලකිල්ලට ගනිමින් රජය පුළුල් ආපදා පෙර සූදානම් වීමේ, අව ම කිරීමේ සහ නැවත ගොඩනැගීමේ සැලැස්මක් සකස් කළ යුතු ය. දේශීය ප්‍රජාවන් සමග සාකච්ඡා කර මෙම සැලැස්ම සකස් කළ යුතු අතර, එය ක්‍රියාත්මක කිරීමේ දී ඔවුන්ගේ සහභාගීත්වය සහතික කළ යුතු ය. දේශගුණික විපර්යාසවලට සහ ආන්තික කාලගුණික තත්ත්වයන්ට ජාතික වශයෙන් ප්‍රතිචාර දැක්වීමේ දී පරිසර, ආහාර සහ ජීවනෝපාය පද්ධතිවල ඔරොත්තු දීමේ හැකියාවට ප්‍රමුඛත්වය හිමි විය යුතු ය.

17. රජය රැකවරණ ආර්ථිකයේ දායකත්වය පිළිගැනීමට ලක්කරමින්, කාන්තාවන්ට වෙනස්කොට සලකන ආකාරයේ බාධක, එනම්, සම්පත් සහ වෙළෙඳපොළ වෙත ප්‍රවේශ වීම සඳහා ඇති නෛතික, ප්‍රතිපත්තිමය, සමාජීය, ආයතනික සහ ප්‍රායෝගික බාධක ඉවත් කිරීම, සහ කාන්තාවන් ආහාර නිෂ්පාදනය සම්බන්ධ තීරණ ගැනීමේ ක්‍රියාවලීන් හී කොටසක් වන බව සහතික කිරීම මගින් ආහාර පද්ධතියට දායකවීම සඳහා සියලුම කාන්තාවන්ට ඇති අයිතිය සහතික කරන ක්‍රියාවලියක් සකස් කළ යුතු ය.

18. මලෙයහ දෙමළ ප්‍රජාවගේ නීත්‍යානුකූල ඉඩම් අයිතිවාසිකම් සඳහා සහ උතුරු සහ නැගෙනහිර පළාත්වල ප්‍රජාවන්ගේ හමුදාකරණය යටතේ ඇති ඉඩම් නිදහස් කිරීම සඳහා වන දීර්ඝ කාලීන ඉල්ලීම් සපුරාලීමට රජය වහා ම ක්‍රියා කළ යුතු ය. මෙම ඉල්ලීම් සපුරාලීම සඳහා වන යාන්ත්‍රණ මගින් ආහාර ස්වෛරීභාවය සහතික කළ යුතු අතර, සංස්කෘතිය සහ ජීවනෝපායන් ආරක්ෂා කර, ගෞරවනීය ජීවිතයක් සඳහා අවශ්‍ය සියලු අවශ්‍යතා සපයා දිය යුතු ය.

19. ආහාර පද්ධතිය පරිවර්තනය කිරීමේ දී රජය තරුණයින්ගේ ක්‍රියාකාරී සහභාගීත්වයෙන් යුතු, ඵලදායී ලෙස භාවිත කළ හැකි පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහනක් සකස් කළ යුතු ය. මෙම ක්‍රියාමාර්ගය කෘෂිකර්මාන්තයෙන් හා ධීවර අංශවලින් ඈත්ව යන තරුණ පරම්පරාවන් එම අංශ වෙත නැවත ආකර්ෂණය කර ගැනීමට සහ ආහාර නිෂ්පාදනයේ අනාගත නායකයින් සහ නවෝත්පාදකයින් ලෙස ඔවුන්ගේ අනන්‍යතාව නැවත හැඩගැස්වීමට උපකාරී වනු ඇත.

## උපලේඛන

### 1. පහසුකම් සපයන්නන් සඳහා සාකච්ඡා මාර්ගෝපදේශ

කොමිෂන් සාමාජිකයා විසින් කෙටි පැහැදිලි කිරීම - ආහාර පද්ධතිය යනු අපගේ ආහාර (සහ අනෙකුත් කෘෂි නිෂ්පාදන) නිෂ්පාදනය, අගය වැඩි කිරීම, වෙළෙඳපොළට ගෙනයාම සහ භුක්ති විඳීම පිළිබඳ ය. වර්තමාන ආහාර පද්ධතිය පාරිභෝගිකයන්ට සාධාරණ මිලකට, හොඳ තත්ත්වයේ, පෝෂ්‍යදායී ආහාර සැපයීමට අපොහොසත් වී ඇත. එය නිෂ්පාදකයන්ට ගෞරවවත් ජීවනෝපාය සපයන දෙයකටද අපොහොසත් වී ඇත. බොහෝ අවස්ථාවල දී, ආහාර නිෂ්පාදනයේ වත්මන් ක්‍රමය පරිසර පද්ධති විනාශ කරමින් පවතී. වර්තමාන පද්ධතිය යටතේ, ආහාර නිෂ්පාදකයන්ට තම අයිතිවාසිකම් අයැදුම් කිරීමට අවශ්‍ය දේශපාලන හා සමාජ බලය නොමැත.

අපි සාකච්ඡා කරන්නේ මෙම ගැටලු විසඳීමට සහභාගීන් ක්‍රියාත්මක කරන විකල්ප ක්‍රියාවලි පිළිබඳවයි.

#### නිෂ්පාදනය පිළිබඳ ව

ඔබ නිෂ්පාදනය කරන්නේ කුමක් ද? බෝග වගාව, මත්ස්‍යයන් ඇල්ලීම, සත්ව පාලනය, වෙනත් ක්‍රියාකාරකම්.

ඔබ භාවිත කරන විකල්ප ක්‍රියාවලි මොනවා ද (පරිසර, ආර්ථික, තාක්ෂණික හා සමාජමය වශයෙන් තිරසර බවට යොමු කරමින්)?

> *උදා:* රසායනික හා පිටතින් ගෙනෙන ආදාන අඩු කිරීම, පරිසර විනාශය අඩු කිරීම, නිෂ්පාදනය විවිධාංගීකරණය.

#### අගය වැඩි කිරීම පිළිබඳ ව

ඔබගේ නිෂ්පාදන සැකසීමේ දී සහ අගය වැඩි කිරීමේ දී භාවිත කරන (හෝ යෝජනා කරන) ක්‍රියාවලි මොනවා ද? මැදිහත්කාරකයන්ගේ දුෂ්ප්‍රයෝජනයෙන් තොර ව ඉහළ මිලකට විකිණීම සඳහා ඔබ එය කෙසේ කරනවා ද? ඒ සඳහා අවශ්‍ය තාක්ෂණය සහ දැනුම ඔබට ලැබෙන්නේ කෙසේ ද?

#### වෙළෙඳපොළ පිළිබඳ ව

ඔබගේ නිෂ්පාදන විකිණීම ඔබ කෙසේ කරනවා ද? මැදිහත්කාරකයන්ගේ දුෂ්ප්‍රයෝජනය අඩු කරමින් සහ තිරසර ආදායම් සහතික කරමින් ඔබ සකස් කර ඇති (තනි පුද්ගලයින්ගේ හෝ එකමුතුවක් ලෙස) විකල්ප වෙළෙඳපොළ පද්ධති මොනවා ද?

#### සම්පත් පිළිබඳ ව

ඔබට අයිතිය සහ ප්‍රවේශය ඇති බව සහතික කිරීම සඳහා (හෝ යෝජනා කරන) විකල්ප ක්‍රම මොනවා ද?

මූල්‍ය සම්පත් - ණය, ඉතිරිකිරීම්, ණය පහසුකම්

ස්වභාවික සම්පත් - භූමි, ජලය, බීජ

තාක්ෂණික - යන්ත්‍රෝපකරණ, දැනුම

#### ගබඩා කිරීම / ආරක්ෂාව

ආහාර / බීජ ගබඩා කිරීමට ඔබ භාවිත කරන තාක්ෂණය හෝ පහසුකම් මොනවා ද? ආහාර ආරක්ෂා කිරීමේ ක්‍රම මොනවා ද?

#### ආයතන පිළිබඳ ව

ඔබ සම්බන්ධ වී ඇති සංවිධාන මොනවා ද? (සංගම්, සමූපකාර සමාගම්, අධිකාරි ආයතන)
ආහාර නිෂ්පාදකයන්ගේ දේශපාලන බලය වර්ධනය කිරීම සඳහා (විශේෂයෙන් ම කාන්තා සහ වගකීම් වලින් තොර කණ්ඩායම් පිළිබඳ) එකමුතු සංවිධාන පිළිබඳ ඔබගේ යෝජනා මොනවා ද?

**කම්කරුවන් පිළිබඳ ව**

සෑම කෙනෙකුටම ගෞරවවත් ජීවනෝපාය සහතික කිරීම සඳහා, නිෂ්පාදන වියදම් කාර්යක්ෂම කිරීම සඳහා ඔබ භාවිත කරන (හෝ යෝජනා කරන) කම්කරුවන් සංවිධානයේ විකල්ප ක්‍රියාවලි මොනවා ද?

**භුක්ති විඳීම පිළිබඳ ව**

බොහෝ අවස්ථාවල දී, ආහාර නිෂ්පාදකයන් තමන්ටම උචිත තත්ත්වයේ ආහාර නොලැබේ (විශේෂයෙන් ම වගා ව්‍යාපෘති, විශාල කාර්මික ගොවිතැනේ ගොවීන් ආදීන්).

ආහාර නිෂ්පාදකයන්ගේ ආහාර ආරක්ෂාව/ආහාරයට අයිතිය වැඩි කිරීම සඳහා ඔබගේ යෝජනා මොනවා ද?

තිරසර, සමානාත්මක ආහාර පද්ධතියක් ගොඩනගා ගැනීම සඳහා ඔබට වෙනත් යෝජනා ඇත්නම් කරුණාකර පවසන්න.

**2. පරීක්ෂණ පත්‍රය - සහභාගිවන්නන් සඳහා**

නම:

ස්ථානය / ගම්මානය:

අංශය: වී ගොවිතැන/ධීවර/කිරිගොවිතැන/තේ-රබර් වගාව/එළවළු/අනෙකුත් ආහාර බෝග/ ඒකාබද්ධ ගොවිතැන ............................................

ඔබගේ ප්‍රධාන ජීවනෝපාය කුමක් ද?.......................................................................................

මෙම ව්‍යාපාරය හැර වෙනුවට ඔබ වගා කරන/නිෂ්පාදනය කරන දේ මොනවා ද?

......................................................................................................................................

......................................................................................................................................

ඔබ කිසියම් සංවිධානයක් හෝ සංගමයක් හා සම්බන්ධ වී ඇත් ද?

......................................................................................................................................

......................................................................................................................................

එහි නම සඳහන් කරන්න: ......................................................................................................

ඔබට අයිති සම්පත් මොනවා ද? (භූමි/යන්ත්‍ර වැනි)

......................................................................................................................................

......................................................................................................................................

......................................................................................................................................

**3. කෘෂි පරිසර විද්‍යාවේ මූලධර්ම**

| ආර්ථික | දේශපාලනික | පාරිසරික | සමාජ සංස්කෘතික |
|---|---|---|---|
| ප්‍රාදේශීය වෙළෙඳපොළ බලය වැඩි කිරීම සහ සමාජ හා සහයෝගීතා ආර්ථික දැක්මක් ගොඩනැගීම අරමුණු කරයි | තීරණ ගැනීමේ දී ආහාර නිෂ්පාදකයින්ගේ / පාරිභෝගිකයින්ගේ ශක්තිමත් සහභාගීත්වය දිරිමත් කරයි | කෘෂි පරිසර පද්ධතිවල විවිධ කොටස් (ශාක, සතුන්, ...) ඒකාබද්ධ වීම වැඩි කරයි | ජනතාව අතර විවිධත්වය හා සහයෝගීතාව, කාන්තාවන් සහ තරුණ සවිබල ගැන්වීම් දිරිමත් කරයි |
| ගොවිපොළ ආදායම් විවිධාංගීකරණය කිරීම තුළින් හා ප්‍රජා ස්වාධීනත්වය ශක්තිමත් කිරීම තුළින් ඔරොත්තු දීමේ හැකියාව වැඩි කරයි | සහාය සපයන රාජ්‍ය ප්‍රතිපත්ති සහ ආයෝජන අවශ්‍ය වේ | කෘෂි රසායන භාවිතය හා ඒ මත යැපීම නැති කරයි | සෞඛ්‍ය සම්පන්න ආහාර හා ජීවනෝපායන් ප්‍රවර්ධනය කරයි |
| නිෂ්පාදකයින් හා පාරිභෝගිකයින් සහයෝගයෙන් කටයුතු කිරීම, සාධාරණ හා කෙටි බෙදාහැරීම් ජාලයන් ප්‍රවර්ධනය කරයි | ආහාර පද්ධතිවල විමධ්‍යගත, සාමූහික, සහභාගීත්ව පාලනයේ නව හා විකල්ප ක්‍රම ඇති කිරීම දිරිමත් කරයි | ජෛවවිවිධත්වය සහ පස පෝෂණය කරයි | ආහාර නිෂ්පාදකයින්, ප්‍රාදේශීය ප්‍රජාවන්, සංස්කෘතිය, දැනුම, අධ්‍යාත්මිකත්වය ශක්තිමත් කරයි |
| | බීජ, ඉඩම් සහ භූමි ප්‍රදේශවල පාලනය ජනතාවගේ අතට පත් කිරීම අරමුණු කරයි | දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමට සහ අනුවර්තනය වීමට සහාය වේ | ගොවීන් ගොවීන් අතර දැනුම බෙදා ගැනීම ප්‍රවර්ධනය කරයි |

ආහාර පොදු සම්පතක් ලෙස නොව වෙළඳ භාණ්ඩයක් ලෙස සලකනු ලබන තාක් කල්, කුසගින්න නිෂ්පාදනයේ අසාර්ථකත්වයක් නොව, පද්ධතියේ ලක්ෂණයක්ව පවතිනු ඇත. ආහාර ස්වෛරීභාවය ලාභ-ප්‍රමුඛ කරගත් ක්‍රියාවලියකින් ඉවත්ව, මිනිසුන්ට හා ස්වාභාවික පරිසරයට හිතකර වන පරිදි අපගේ ආහාර පද්ධතිය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අවස්ථාවක් සලසා දෙයි.


MONLAR 35 Years for a better world!

NAFSO

LAW & SOCIETY TRUST
නීතිය හා සමාජ භාරය
சட்டம் மற்றும் சமூக நம்பிக்கை